# දෙසතිය

පුවත් සඟරාව
2025 ඔක්තෝබර්




# රට සල්ලි සොයන මුල් තැන

# අභ්‍යවකාශයට තුන් වැනි පිම්ම






ශ්‍රී ලංකාවේ අභ්‍යවකාශ තාක්ෂණ ඉතිහාසයේ නව පරිච්ඡේදයක් සනිටුහන් කරමින් මෙරට තුන් වැනි නැනෝ චන්ද්‍රිකාව වන BIRDS-x Dragonfly සාර්ථක ව කක්ෂගත කෙරුණා. ඒ, 2025 සැප්තැම්බර් 19 දින ශ්‍රී ලංකා වේලාවෙන් පස්වරු 2.15ට ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ සිට.

මේ ව්‍යාපෘතියට සඳහා භාවිත කර තිබෙන්නේ නැනෝ සැටලයිට් යන කුඩා චන්ද්‍රිකා තාක්ෂණය. සාමාන්‍යයෙන් කිලෝ 01-10ත් අතර ස්කන්ධයක් සහිත මේ චන්ද්‍රිකාවලට, සාම්ප්‍රදායික චන්ද්‍රිකාවලට වඩා අඩු වියදමකින් අභ්‍යවකාශ ගවේෂණ කළ හැකි වීම වාසිදායක තත්ත්වයක්.

2019 වසරේදී ශ්‍රී ලංකාවේ පළමු නැනෝ චන්ද්‍රිකාව ලෙස අභ්‍යවකාශගත කෙරුණේ 'රාවණ-1' චන්ද්‍රිකාව. 2022 වසරේදී ජාත්‍යන්තර පාර්ශ්ව 05ක සහභාගිත්වයෙන් යුතු තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියකින් නිර්මාණය කරන ලද දෙවැනි චන්ද්‍රිකාව ලෙස 'KITSUNE' අභ්‍යවකාශගත කෙරුණා.

අභ්‍යවකාශ තාක්ෂණ සහයෝගිතා ව්‍යාපෘතියක් ලෙස මෙය ක්‍රියාත්මක කර තිබෙන්නේ ජපන් අභ්‍යවකාශ පර්යේෂණ ආයතනය (JAXA) හා ඩිජිටල් රේඩියෝ සන්නිවේදන ආයතනය (ARDC) යන ජාත්‍යන්තර ආයතනවල සහයෝගිතාව ඇති ව ආතර් සී. ක්ලාක් ආයතනය සහ ජපානයේ 'KYUSHU' තාක්ෂණ ආයතනය. ඊට ශ්‍රී ලංකාවෙන් කිසිදු ප්‍රාග්ධන පිරිවැයක් නොදැරීම මෙහි විශේෂත්වයක්. ලාංකික ඉංජිනේරුවන්ගේ සහ විද්‍යාඥයන්ගේ දක්ෂතා, ජාත්‍යන්තර සහයෝගිතාව සහ අභ්‍යවකාශ තාක්ෂණය ජනසතු කිරීමේ වැදගත් පියවරක් ලෙස මෙය ඉතිහාසයට එක්වෙනවා.

**නදීශා ලක්මිණී**



BIRDS-X Dragonfly Flight Model

# දෙසතිය
පුවත් සඟරාව

වෙළුම 47, කලාපය 10,
2025 ඔක්තෝබර්

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කාරක මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීමේ අංශය
දු. අ. 011 - 2514150

උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**

47 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

## කවරයේ කතාව





21
**රට සල්ලි සොයන මුල් තැන**



03
**මහද්වීප යා කළ ලාංකේය අනන්‍යතාව**




06
**පුනරුදයේ පුරවර**




15
**කඳු වළල්ලේ කැරැල්ල**



32
**භාරතීය සිනමාවේ රතු තිලකය මොලිවුඩ්**




40
**ආසියානු ක්‍රිකට්**

# සුරකින්න ආදරයෙන්

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය (Convention on the Rights of the Child) අනුව වයස අවුරුදු 18ට අඩු සෑම තැනැත්තෙකු ම සැලකෙන්නේ ළමයෙකු ලෙස. දරුවන් සම්බන්ධයෙන් වෙනස්කොට නොසැලකීම, දරුවාගේ උපරිම යහපත, පැවැත්ම සහ සංවර්ධනයට ඇති අයිතිය, ළමයාගේ අදහස්වලට ගරු කිරීම යන මෙහි මූලික වශයෙන් සඳහන් මූලධර්ම 04ක් සුරැකීමට සියලු රාජ්‍ය බැඳී සිටිනවා.

ඔක්තෝබර් 01 දිනට යෙදුණු විශ්ව ළමා දිනය මෙවර ශ්‍රී ලංකාවේ සැමරුණේ 'ආදරයෙන් සුරකින්න-අපට ලොව දිනන්නට' යන තේමාවෙන්. එහෙත් ඇතැම් රටවල් සෑම වසරක ම නොවැම්බර් 20 දිනයේදීයි එය සමරන්නේ. ඒ, 1989 නොවැම්බර් 20 දින එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය අනුමත කර ප්‍රකාශයට පත් කරන ලද හෙයින්. 1990 ජනවාරි 26 දින එම ප්‍රඥප්තියට අත්සන් කර, එය 1991 ජූලි 12 දින සිට ශ්‍රී ලංකාවේ බලාත්මක කර ඇති නිසා ශ්‍රී ලංකාව ද 2026 වසරේ සිට විශ්ව ළමා දිනය නොවැම්බර් 20 දිනයේදී සැමරීමට තීරණය කර තිබෙනවා.

ලෝකයේ සෑම දරුවෙකුගේ ම අයිතිවාසිකම් ශක්තිමත් කිරීමට හා පිළිගැනීමට ගෝලීය දායකත්වය සඳහා කෙරෙන ඇරයුමක් වන මේ සැමරුම සැබවින් ම අර්ථවත් වන්නේ එය දිනයකට සීමා නොවී සෑම මොහොතකදී ම දරුවන් වෙනුවෙන් අවධානය යොමු කෙරෙන පසුබිමක් සමාජයේ නිර්මාණය කර ගැනීමෙන්. එවැනි පසුබිමක ළමා අපයෝජන යනු සමාජයේ පිළිලයක්. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටින පාසලකත් ලිංගික අපයෝජන සිදුවීමක් නොබෝද අනුරාධපුර ප්‍රදේශයෙන් වාර්තා වුණා. එය ඛේදනීය තත්ත්වයක්. මෙවැනි වාර්තා නොවන සිදුවීම් බොහෝ ඇති. මේ නිසා දරුවන්ගේ රැකවරණය සම්බන්ධයෙන් දෙමාපිය, ගුරුවරු හා වැඩිහිටි ප්‍රජාවගේ නිරන්තර අවධානය අත්‍යවශ්‍ය වෙනවා.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 20 වැනි වගන්තියට අනුව ළමයින් අනිසි ලෙස යෙදවීම සහ නොසැලකිලිමත්භාවයෙන් ආරක්ෂා කිරීමට උචිත සියලු ව්‍යවස්ථාමය, පරිපාලනමය, සමාජමය, අධ්‍යාපනික ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම පැවරී ඇත්තේ රජයට. ඒ අනුව මේ සඳහා රාජ්‍ය මැදිහත්වීම සිදු කරන්නේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය. ඔවුන් 1929 දුරකතන සේවාව හා අනෙකුත් මාර්ගවලින් වාර්තා වන ළමා අපයෝජනය සම්බන්ධ පැමිණිලි මත පවරා ඇති, මහාධිකරණවල සහ මහේස්ත්‍රාත් අධිකරණවල විභාග වන නඩු විභාග නියාමනය වේගවත් කර තිබෙනවා. වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීම පුළුල් කිරීමට ද පියවරගෙන තිබෙන පසුබිමක රජය පාර්ශ්වයෙන් සිදු වන නීතිමය මැදිහත්වීම ඉතා වැදගත්. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සකස් කරනු ලැබ ඇති ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය පිළිබඳ පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025-2029 ද ඉදිරියේදී එයට පූර්ණ දයකත්වය සපයනු ඇති.

විශේෂයෙන් තාක්ෂණය විෂයෙහි සිදු වන ළමා අපයෝජන හා අපචාරක්‍රියා ඉහළ ගොස් ඇති පසුබිමක වුව ද රටේ අනාගතය වන වත්මන් ළමා පරපුර සුරක්ෂිත කිරීම නෛතික ව පමණක් සිදු කරන්නට බැහැ. ළමා රැකවරණය සම්බන්ධයෙන් 'සමාජීය වගකීම' යන කාරණයට සියලු දෙනා ආයතනිකවත් පුද්ගලබද්ධවත් බැඳී සිටිනවා.

මාලා මල්කාන්ති ජයරත්නගේ

\- සංස්කාරක -


දෙසතිය
පුවත් සඟරාව

දෙසතිය

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ............................................................

Address ............................................................

............................................................

............................................................

............................................................

ID Number ..............................Tel / Mobile ..............................

Signature .............................. Date..............................

දෙසතිය සඟරා දයකත්වය

වාර්ෂික දයකත්වය රු. 1680.00

අර්ධ වාර්ෂික දයකත්වය රු. 840.00

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදළ බැංකු බැරපත හා සඟරා දයකත්ව කූපන්පත 071-9303111 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

**මුදල් ඇණවුම් එවීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න. විමසීම් - 0112512759



මහලේකම් අන්තෝනියෝ ගුටෙරෙස් සමඟ

# මහද්වීප යා කළ ලාංකේය අනන්‍යතාව

**චන්දන මාරසිංහ**

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 80 වැනි සැසි වාරය ඇමතීම සඳහා ජනාධිපති අනුර කුමාර දිසානායක ඇමරිකාව බලා පිටත් ව ගියේ සැප්තැම්බර් 23 දින. එයට විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත් ඇතුළු ශ්‍රී ලංකා දූත පිරිසක් ද එක් ව සිටියා.

ශ්‍රී ලංකා ජනාධිපතිවරයා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 80 වැනි සැසි වාරය ඇමතුවේ සැප්තැම්බර් මස 25 දින. ඒ, නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේදී. මතු පරපුරට සුරක්ෂිත ලෝකයක් බිහිකිරීමට හදවතට එකඟ ව කැපවීමේ අවශ්‍යතාව එහිදී ජනාධිපතිවරයා පෙන්වා දුන්නා. ගාසා තීරයේ අඛණ්ඩ ව සිදුවන බිහිසුණු ව්‍යසන පිළිබඳ කනස්සල්ල පළ කළ ජනාධිපතිවරයා කඩිනම් සටන් විරාමයක් ඇති කිරීම සඳහා පියවර ගත යුතු බව අවධාරණය කළා. ආයුධවලින් ප්‍රශ්න විසඳා ගැනීම වෙනුවට මානව ශිෂ්ටත්වයේ වටිනාකම්වලින් ප්‍රශ්න විසඳා ගැනීමේ ඇති හැකියාව ද ඔහු පෙන්වා දුන්නා.

ගෝලීය මත්ද්‍රව්‍ය උවදුර පිළිබඳ ව අදහස් පළ කළ ජනාධිපතිවරයා එය තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති සාධනීය පියවර පැහැදිලි කළා. මත්ද්‍රව්‍ය පිටුදැකීමේ ලෝක න්‍යාය පත්‍රය සක්‍රිය කිරීමට එක්වන ලෙසයි එහිදී ඔහු ඇරයුම් කළේ. දූෂණයට එරෙහි සටන අසීරු වුව ද මතු පරපුර වෙනුවෙන් ශ්‍රී ලංකාව එය ආරම්භ කර ඇති බව සඳහන් කළ ජනාධිපතිවරයා දුප්පත්කම තුරන් කිරීම, ඩිජිටල්කරණය සහ පිරිසිදු රටක් යන ප්‍රධාන අංශ කෙරෙහි අවධානය යොමු කර ඇති ආකාරය සිය දේශනයෙදී පැහැදිලි කළා.



මහා මණ්ඩලයේ 80 වැනි සැසි වාරය ඇමතමින්

මානව ශිෂ්ටාචාරයේ ජයග්‍රහණ පහසුවෙන් හිමි වී නැහැ. එම ජයග්‍රහණ ලබා ගැනීම සඳහා ඇතැම් විට දුෂ්කර ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීමට සිදු වෙනවා. මේ අසීරු තත්ත්ව පිළිබඳ ජනාධිපතිවරයා සිය දේශනයේදී අවධානය යොමු කර තිබෙනවා. දරුවන්ගේ සහ සිවිල් වැසියන්ගේ ජීවිතවලට තර්ජනයක් එල්ල කරන අවස්ථාවාදී බල දේශපාලනයේ අයහපත් ප්‍රතිඵල ගණනාවක් පවතිනවා. එහෙත් ජනතාවට ඉන් බලපෑම් එල්ල නොවිය යුතු බවයි ජනාධිපතිවරයා ජාත්‍යන්තර නායකයන් හමුවේ ප්‍රකාශ කළේ. ලෝකයට සාමය උදාකිරීම සඳහා සියලු පාර්ශ්ව කැපවීමේ අවශ්‍යතාව, වඩාත් යහපත් ලෝකයක් ගොඩනැගීම සඳහා මෙවැනි සමුළු ඔස්සේ කළ හැකි කාර්යභාරය පිළිබඳ සිය දේශනයෙන් පෙන්වා දීම ද වඩාත් කාලෝචිත වූවක්. සාමය හා ගෞරවය වෙනුවෙන් පෙළ ගැසීමේ අවශ්‍යතාව ද මෙහිදී මතු කිරීම ඉතා වැදගත්.

මේ සමුළුවට සමගාමී ව ජනාධිපතිවරයා සාකච්ඡා කිහිපයකට ම සහභාගි වුණා. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් වොල්කර් ටර්ක් (Wolker Türk) අතර එක්සත් ජාතීන්ගේ මහලේකම් කාර්යාලයේදී පැවති හමුවේදී අවධානය යොමු වුණේ පසුගිය වසර තුළ ශ්‍රී ලංකාව මානව හිමිකම් සම්බන්ධයෙන් අත්කරගෙන ඇති ප්‍රගතිය සම්බන්ධයෙන්. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් නිලධාරීන් සමඟ මෙලෙස සාකච්ඡා පැවැත්වීමෙන් මෙරට මානව හිමිකම් ආරක්ෂා කිරීමට රජය ගෙන



එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් වොල්කර් ටර්ක් හමුව



අධ්‍යක්ෂ සර්ජියෝ ගෝර් සමඟ

ඇති ක්‍රියාමාර්ග පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ලබාදීමේ හැකියාව ලැබීම සැබවින් ම රටට වාසිදායක තත්ත්වයක්.

ජනාධිපති අනුර කුමාර දිසානායක සහ එක්සත් ජාතීන්ගේ මහලේකම් අන්තෝනියෝ ගුටේරෙස් (António Guterres) අතර හමුවක් නිව්යෝර්ක් නුවර එම මූලස්ථානයේදී සැප්තැම්බර් 25 දින පැවැත්වුණා. එහිදී එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා දැනුවත් කළේ ශ්‍රී ලංකාවේ නව ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ ප්‍රගතිය, සමාජීය සහ දේශපාලනමය වශයෙන් ශ්‍රී ලංකාව නව තලයකට ඔසවා තැබීම වෙනුවෙන් රජය ක්‍රියාත්මක කරමින් ඇති වැඩපිළිවෙළ පිළිබඳ ව. රජයේ නව ප්‍රගතිශීලී වැඩපිළිවෙළ මෙහිදී අගය කළ මහලේකම්වරයා ඒ වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය පෙනී සිටින බවත් ඊට පූර්ණ සහයෝගය පළ කරන බවත් ප්‍රකාශ කළා.

ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ දකුණු සහ මධ්‍යම ආසියාව භාර විශේෂ නියෝජිත සර්ජියෝ ගෝර් (Sergio Gor) හමුවක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත කාර්යාලයේදී පැවැත්වුණා. වෙළෙඳ, වාණිජ, සංචාරක සහ ආයෝජන ඇතුළු දෙරටට වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ ව අවධානය යොමු වූ මෙහිදී එම ක්ෂේත්‍රවල සහයෝගිතාව තවදුරටත් වර්ධනය කර ගැනීම සම්බන්ධයෙන් කතාබහ සිදු වුණා. පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකින් පසු, ශක්තිමත් ජනවරමක් සහිත නව රජයක් ලෙස, ආර්ථික වර්ධනය ඉලක්ක කරගත් සමෘද්ධිමත් ආර්ථිකයක් සඳහා වන ප්‍රමුඛතාව මත ඇමරිකා එක්සත් ජනපදය සමඟ ක්‍රියාකාරී මෙන් ම වඩා සමීප සම්බන්ධතාවක් පවත්වා ගැනීමට බලාපොරොත්තු වන බව ශ්‍රී ජනාධිපතිවරයා මෙහිදී සඳහන් කළා. දෙරට අතර වෙළෙඳ අසමතුලිතතාව විසඳීම සඳහා එළදායී සහ සාධාරණ විසඳුම් සොයා බැලීම, ද්විපාර්ශ්වික වෙළෙඳාමට බලපාන බාධක අවම කිරීම සහ සාධාරණ සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳ සබඳතා සහතික කිරීම වෙනුවෙන් ගිවිසුමකට එළඹීම සඳහා ශ්‍රී ලංකා නියෝජිතයන් එක්සත් ජනපද බලධාරින් සමඟ පවත්වන සාකච්ඡාවල ප්‍රගතිය පිළිබඳ ව ද මෙහිදී දෙපාර්ශ්වය සමාලෝචනය කර තිබෙනවා. ඕස්ට්‍රේලියා අග්‍රාමාත්‍ය ඇන්තනී ඇල්බනීස් (Anthony Albanese), පාකිස්තාන අග්‍රාමාත්‍ය ශෙබාස් ශරීෆ් (Shehbaz Sharif) සමඟ ද ජනාධිපතිවරයා අදහස් හුවමාරු කර ගත්තා. එහිදී වැඩි අවධානය යොමු ව තිබෙන්නේ දෙරටේ ආර්ථික සහ වෙළෙඳ අවස්ථා පිළිබඳ ව.

ජාතික දේශ සීමාවට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශවල සමුද්‍ර ජෛව විවිධත්ව සංරක්ෂණය සහ තිරසර භාවිතය සම්බන්ධ සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ වන ගිවිසුමට අදාළ (BBNJ) සාමාජිකත්වයට, රටවල් 60ක් සම්පූර්ණ වීම නිමිත්තෙන් සැප්තැම්බර් 25 දින ප්‍රංශ රජය සංවිධානය කළ උත්සවයකට ද ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සහභාගි වුණා. ඒ, ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්රොන් (Emmanuel Macron) ඇතුළු සෙසු රටවල රාජ්‍ය නායකයන්ගේ සහභාගිත්වයෙන් නිව්යෝර්ක් නුවරදී. 2025 සැප්තැම්බර් 16 දින එම ගිවිසුමට එළැඹි 58 වැනි සාමාජික රට ලෙස ශ්‍රී ලංකාව එම සම්මුතියේ පාර්ශ්ව රාජ්‍යයක් ලෙස ක්‍රියා කරනවා. මේ ගිවිසුම නිල වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2026 ජනවාරි 16 දින සිට.

ඇමරිකානු සංචාරය නිමා කළ ශ්‍රී ලංකා ජනාධිපතිවරයා ඉන් අනතුරු ව ජපන් රජයේ ආරාධනයකට අනුව සැප්තැම්බර් 27 සිට 30 දක්වා එරට නිල සංචාරයක නිරත වුණා. එහිදී විශේෂිත අවස්ථා ගණනාවකට ඔහු එක් වූ අතර ජපන් සංචාරයේ පළමු කටයුත්ත ලෙස සහභාගි වුණේ ඔසාකා නුවර පැවැත්වූ EXPO 2025 ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා දින සැමරුම් උත්සවයට. ඒ, එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වෙමින්. ශ්‍රී ලාංකික අනන්‍යතාව පිළිබිඹු කරන විවිධ සංස්කෘතිකාංගවලින් සමන්විත වී තිබුණු එහි උත්සව සභාව ඇමතූ ජනාධිපතිවරයා පෙන්වා දුන්නේ ගෝලීය පරිවර්තනයක් සිදුවන මේ අවස්ථාවේ ශ්‍රී ලංකාව පසු වන්නේ සිය ආර්ථික ගමනේ තීරණාත්මක මොහොතක බව. අඛණ්ඩ අභියෝගවලට මුහුණදුන් ශ්‍රී ලංකාව මේ වනවිට තිරසර සහ සහභාගිත්ව ආර්ථිකයක් නැවත ගොඩ නගමින් සිටින බවත් 2025 EXPO ප්‍රදර්ශනයෙන් ශ්‍රී

ලංකාවට තම සංස්කෘතිය, නවෝත්පාදන සහ මානව වටිනාකම් මත පදනම් වූ දීප්තිමත් අනාගතයක් සඳහා වන දැක්ම බෙදා ගැනීමට හැකි ගෝලීය වේදිකාවක් නිර්මාණය කර දෙන බවත් ජනාධිපතිවරයා පෙන්වා දුන්නා. ප්‍රදර්ශනයෙන් ජාතීන් 150කට අධික සංඛ්‍යාවකට මිත්‍රත්වය, සහජීවනය සහ සංස්කෘතික විවිධත්වය ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දී තිබුණා. මේ ගෝලීය වේදිකාව මත ශ්‍රී ලංකාවේ උරුමය ප්‍රදර්ශනය කිරීමට හැකි වීම ද විශේෂත්වයක්. නිෂ්පාදන පාදක ආර්ථිකයක් කෙරෙහි ශ්‍රී ලංකාව දක්වන ආකල්පය ගැන ද ජාත්‍යන්තරයට පණිවිඩයක් ලබාදීමට එය විශේෂ අවස්ථාවක් වුණා.

ජනාධිපති අනුර කුමාර දිසානායක පිළිගැනීමේ නිල උත්සවය ජපාන අග්‍රාමාත්‍ය කාර්යාල පරිශ්‍රයේදී (29) පැවැත්වුණා. ජපාන අග්‍රාමාත්‍ය ෂිගෙරු ඉෂිබා අතර නිල සාකච්ඡා ඇරඹුණේ ඉන් අනතුරු ව.

ජපානය සහ ශ්‍රී ලංකාව අතර පවතින දීර්ඝකාලීන මිත්‍රත්වය සහ සහයෝගිතාව තවදුරටත් ශක්තිමත් කර ගනිමින් දෙරට අතර වෙළෙඳ, ආයෝජන සහ ආර්ථික සබඳතා පුළුල් කෙරෙන ද්විපාර්ශ්වික සාකච්ඡා රැසකට ද ජනාධිපතිවරයා එක් වුණා. මේ සාකච්ඡා පැවැත්වුණේ ජපාන අග්‍රාමාත්‍ය ෂිගෙරු ඉෂිබා (Shigeru Ishiba), ජපාන මුදල් අමාත්‍ය කතෝ කසුනොබු (KATO Katsunobu), ආරක්ෂක අමාත්‍ය ඩී එම් නකටානි (DM Nakatani) යන අමාත්‍යවරු සහ නිපොන් පදනමේ ආරම්භක සභාපති යොහෙයි සසකාවා (Yohei Sasakawa), ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ (JICA) සභාපති ටනාකා අකිහිකෝ (Dr. TANAKA Akihiko) ඇතුළු එරට ඉහළ පෙළේ නියෝජිතයන් සමඟ. ශ්‍රී ලංකා ජනාධිපතිවරයා ජපාන අධිරාජ්‍ය මන්දිරයේදී ජපානයේ නරුහිතෝ අධිරාජ්‍යයා හමු වී සුහද පිළිසඳරක ද නිරත වුණා.

ජපානයේ ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරිකයන් සමඟ වට මේස සාකච්ඡාවකට ද එක්වෙමින් ජනාධිපතිවරයා සහභාගි වුණේ ජපාන විදේශ වෙළෙඳ සංවිධාන (JETRO) මූලස්ථානයේ පැවති ජපන්-ශ්‍රී ලංකා ව්‍යාපාරික සංසදයට. එහිදී ශ්‍රී ලංකාවේ නව ආයෝජන අවස්ථා සහ ශ්‍රී ලංකාවේ නිර්මාණය වී ඇති ආයෝජන හිතකර පරිසරය පිළිබඳ අදහස් දැක්වීමක් ද කළා. ශ්‍රී ලංකාවේ නැගී එන ආර්ථික අවස්ථා සොයා බැලීමට එක් වන ලෙස ජනාධිපතිවරයා ජපාන ව්‍යාපාරික ප්‍රජාවට ඇරයුම් කළා. ජපන් ව්‍යාපාරික ප්‍රජාවේ සාමාජිකයන් 200කට ආසන්න පිරිසක් ඊට එක් ව සිටියා. කටුනායක ගුවන්තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම පිළිබඳ අදහස් හුවමාරු ව ද එහිදී සිදු වුණා. ජපාන-ශ්‍රී ලංකා සංවර්ධන සහයෝගිතාවේ නව සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් කිරි නිෂ්පාදන අංශයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි (Project for the Enhancement of Productivity in the Dairy Sector) ප්‍රදාන ගිවිසුමට (Grant Agreement) අත්සන් තැබීම ද එහිදී සිදු කෙරුණා.

පැවති නිල සාකච්ඡාවලින් පසු දෙපාර්ශ්වය විසින් ඒකාබද්ධ ප්‍රකාශයක් (Joint Statement) ද මාධ්‍ය වෙත නිකුත් කෙරුණා. පැවති ඒකාබද්ධ මාධ්‍ය හමුව අමතමින් ජපාන අග්‍රාමාත්‍ය ෂිගෙරු ඉෂිබා සඳහන් කළේ ඉන්දියානු සාගරයේ කේන්ද්‍රීය ස්ථානයක පිහිටි ශ්‍රී ලංකාවේ ස්ථාවරත්වය සහ සංවර්ධනය ඉතා තීරණාත්මක බවත් ඒ අනුව ශ්‍රී ලංකාව සමඟ හවුල්කාරිත්වය තවදුරටත් වර්ධනය කර පුළුල් කර ගැනීමට අපේක්ෂා කරන බවත්.

මෙහිදී ශ්‍රී ලංකා ජනාධිපතිවරයා පැවසුවේ ජපාන අග්‍රාමාත්‍යවරයා සමඟ පැවති සාකච්ඡා ශ්‍රී ලංකා-ජපාන සබඳතාවල වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන බවත් එම එකඟතාවල සැබෑ ප්‍රතිලාභ අත්කර ගනිමින් සංවර්ධනය සහ ස්ථාවරත්වය වෙනුවෙන් යන ගමනේදී ජපානය සමඟ එක් ව ක්‍රියා කිරීමට ශ්‍රී ලංකාව කැප වන බවත්.

ජපාන රජයේ සහය ඇති ව ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද, පැවති ආර්ථික අර්බුදය හමුවේ අතරමග නැවතුණු සංවර්ධන ව්‍යාපෘති 11ක් නැවත ආරම්භ කරමින් එහි ප්‍රතිලාභ ජනතාවට ලබා දීම වෙනුවෙන් ජපන් රජය දැක් වූ සහය මෙන් ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන සාර්ථක කර ගැනීමට ලබා දුන් දායකත්වය වෙනුවෙන් ද ජපාන රජය වෙත ජනාධිපතිවරයා ස්තුතිය පළ කළා.

මෙලෙස රටවල් සමඟ ද්විපාර්ශ්වික සම්බන්ධතා වර්ධනය කර ගැනීමෙන් පුළුල් කර ගත හැකි ආර්ථික අවස්ථා නිවැරදි ව කළමනාකරණය කළහොත් පමණයි සාර්ථක ප්‍රතිලාභ අත්කර ගත හැක්කේ. මේ නිසා එය අවධානය යොමු කළ යුතු කරුණක්. එසේ ම ලෝකයේ භූ දේශපාලනික පසුබිම මත රටවල් සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීමෙන් ජාත්‍යන්තර දේශපාලන වේදිකාවලදී ජයග්‍රහණ අත්පත් කරගැනීම පහසු බවත් මෙහිදී සිහිපත් කළ යුත්තක්.


ජපාන අග්‍රාමාත්‍ය කාර්යාල පරිශ්‍රයේ පැවති පිළිගැනීමේ නිල උත්සවයේදී


EXPO 2025 ප්‍රදර්ශනයේදී

# පුනරුදයේ පුරවර

**රංගිකා අබේසේකර**

'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' යටතේ රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය 'පුනරුදයේ පුරවර' යනුවෙන් දීප ව්‍යාප්ත ව පළාත් පාලන සතියක් ක්‍රියාත්මක කළා. ඒ සැප්තැම්බර් 15 සිට 21 දක්වා. මෙහි මූලික අරමුණ වුණේ ප්‍රජාවගේ දෛනික අවශ්‍යතා සපුරා ගනිමින් ජීවත්වන වටපිටාව සුරක්ෂිත කෙරෙන පරිසරයක් නිර්මාණය කිරීමෙන් අනාගත දැක්ම සුරක්ෂිත කිරීම.

පළාත් පාලන සතියේදී සිදුවුණේ පළාත් පාලන ආයතනවල මගහැරී තිබෙන කාර්ය ඇත්නම් ඒවා පිළිබඳ ජාතික අවධානයට ලක්කිරීම. ප්‍රජාව සම්බන්ධ කර ගනිමින් සිවිල් සංවිධාන සහ වෙනත් රාජ්‍ය ආයතන ක්‍රියාත්මක වීමක් එහිදී දක්නට ලැබුණා. රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් එස්. ආලෝක බණ්ඩාර පෙන්වාදෙන පරිදි සතියකට සීමා නොවන මේ වැඩසටහන ඔස්සේ ඒ ඒ ආයතන පිළිබඳ ස්වයං ඇගයීමක් කිරීමට අවස්ථාව ලැබීමත් එම ආයතන කළ යුතු කාර්යභාරය පිළිබඳ විශේෂ අවදි කිරීමක් කළ හැකි වීමත් ඉතා වැදගත්.

පළාත් පාලන සතියක් අවසන් වරට පවත්වා ඇත්තේ 2016 වසරේදී. මෙවර එය පැවැත්වුණේ වසර 9කට පසුව. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය ප්‍රභා රුවන් සෙනරත්; "පළාත් පාලන ආයතන 341 ම ඒකරාශී කරමින් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අවස්ථා 2කදී මේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව දැනුවත් කළා. එම සතියට අදාළ ව තම පළාත් පාලන ආයතනයේ ක්‍රියාත්මක කරන වැඩසටහන් පිළිබඳ සැලැස්මක් අමාත්‍යාංශය වෙත එවන ලෙස දැනුම් දුන්නා. උතුරු හා නැගෙනහිර පළාත් පාලන ආයතන මීට වැඩි උනන්දුවක් දක්වා තිබුණා. පළාත් පාලන සතියට සමගාමී ව පූර්ව සූදානම් වැඩසටහන් සෑම පළාත් පාලන ආයතනයක ම වසම් මට්ටමෙන් ක්‍රියාත්මක කළා. මෙහි සමාරම්භය සිදු වුණේ සැප්තැම්බර් 15 දින අඩු ම ආදායමක් ලැබෙන ප්‍රාදේශීය සභාව වන ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ මීගහ කිවුල ප්‍රාදේශීය සභාව මූලික කරගෙන".

පළාත් පාලන සතියේදී සිදුවුණේ පළාත් පාලන ආයතනවල මගහැරී තිබෙන කාර්ය ඇත්නම් ඒවා පිළිබඳ ජාතික අවධානයට ලක්කිරීම. ප්‍රජාව සම්බන්ධ කර ගනිමින් සිවිල් සංවිධාන සහ වෙනත් රාජ්‍ය ආයතන ක්‍රියාත්මක වීමක් එහිදී දක්නට ලැබුණා. රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් එස්. ආලෝක බණ්ඩාර පෙන්වාදෙන පරිදි සතියකට සීමා නොවන මේ වැඩසටහන ඔස්සේ ඒ ඒ ආයතන පිළිබඳ ස්වයං ඇගයීමක් කිරීමට අවස්ථාව ලැබීමත් එම ආයතන කළ යුතු කාර්යභාරය පිළිබඳ විශේෂ අවදි කිරීමක් කළ හැකි වීමත් ඉතා වැදගත්.

වැඩසටහන ආරම්භ කළ දිනයේදී, එනම් ජංගම සේවා දිනයට සමගාමී ව රජය අපේක්ෂා කළේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශවලට අයත් වසම් මට්ටමෙන් පළාත් පාලන ආයතන පරිශ්‍රයට ජනතාව ගෙන්වා ඔවුන්ගේ මූලික ගැටලුවලට අවශ්‍ය මැදිහත්වීම ලබාදීම. එහිදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරින් ඇතුළු අනෙකුත් රාජ්‍ය නිලධාරින් එම ස්ථානයට සම්බන්ධ වීම අදාළ කාර්ය පහසු කළා.

සැප්තැම්බර් 16 දිනය පරිසර සහ රුක් රෝපණ දිනය ලෙසයි නම් කර තිබුණේ. ජාත්‍යන්තර ඕසෝන් ස්ථරය සංරක්ෂණය කරන ජාත්‍යන්තර දිනයට සමගාමී ව එය ක්‍රියාත්මක කිරීමෙන් දීප ව්‍යාප්ත ව සෑම පළාත් පාලන ආයතනයක ම ග්‍රාමීය මට්ටමෙන් තෝරාගත් ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් විවිධ වූ පැළ සිටුවීම ඇතුළු පාරිසරික වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම මෙහිදී වැදගත් වුණා. පරිසරය පවිත්‍රකරණය, රුක් රෝපණය වැනි වැඩසටහන්වලදී පැළයක් රැගෙනවිත් ඒ ඒ ශිෂ්‍යාගේ හෝ ශිෂ්‍යාවගේ හෝ නමින් පැළය සිටුවීම සුවිශේෂ කාර්යයක් වුණේ විශේෂයෙන් පාසල් දරුවන් මේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීමෙන් ඔවුන්ට ආකල්පමය වශයෙන් පෝෂණයක් ලබාදීමට එය අවස්ථාවක් වූ නිසා. තමන් රෝපණය කළ පැළය, ගසක් බවට පත්වීම දක්වා අධීක්ෂණය කිරීමෙන් පෞද්ගලික ව ඔවුන් තෘප්තිමත් වනවා සේ ම මෙවැනි සංකල්ප පිළිබඳ ව දැනුවත් වීම ද එහිදී වැදගත්.

සැප්තැම්බර් 17 දිනය සෞඛ්‍ය සහ සනීපාරක්ෂක දිනය ලෙසයි නම් කෙරුණේ. මේ විෂය පථයට අයත් ව ඒ ඒ බල ප්‍රදේශවල ග්‍රාමීය මට්ටමේ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්, සෞඛ්‍ය සායන, ආයුර්වේද වෛද්‍ය සායන

ඇතුළු ව ජනතාවගේ සෞඛ්‍යය නගා සිටුවීමටයි එහිදී වැඩසටහන් ක්‍රියාත්මක කළේ. ඊට ඒ ඒ ප්‍රදේශවල වෛද්‍ය කාර්ය මණ්ඩලය ඇතුළු සෞඛ්‍ය නිලධාරින් අවශ්‍ය මැදිහත්වීම සිදු කළා.

ආදායම් ප්‍රවර්ධන දිනය ලෙස නම් කර තිබුණේ සැප්තැම්බර් 18 දිනය. පළාත් පාලන ආයතනයක් ක්‍රියාත්මක වීමේදී එම බල ප්‍රදේශයෙනුයි අදායම් ප්‍රවර්ධනය කෙරෙන්නේ. විශේෂයෙන් පොදු වෙළෙඳ පොළ, ව්‍යාපාරික ස්ථානවලින් ලැබෙන බදු ආදායමෙන්. බොහෝ පිරිස් වරිපනම් බදු නොගෙවන තත්ත්වයක් වාර්තා වන්නේ. නාගරික ප්‍රදේශවල වරිපනම් බදු අය කර ගැනෙනවා. මේ දිනයේදී ක්‍රියාත්මක කළේ ව්‍යාපාරිකයන් පළාත් පාලන ආයතන වෙත බදු ගෙවිය යුත්තේ ඇයි යන කාරණයත් ඔවුන් ගෙවන බදු මුදලින් පළාත් පාලන ආයතනයක් සිදු කරන්නේ මොනවාද යන කාරණයත් පිළිබඳ ජනතාව දැනුවත් කරන වැඩසටහනක්.

සැප්තැම්බර් 19 දිනයේ තේමාව වූයේ සාහිත්‍යය, අධ්‍යාපන සහ පුස්තකාල ප්‍රවර්ධනය. සාහිත්‍ය මාසය සැප්තැම්බරයට යෙදීම නිමිති කරගෙන මේ දිනය නම් කර තිබෙනවා. පොත් කියවීම මෙන් ම සාහිත්‍ය වැඩසටහන්, රස වින්දන වැඩසටහන්, ගද්‍ය පද්‍ය රචනා ඇතුළු විවිධ තරග පැවැත්වීමයි එහිදී සිදු කෙරුණේ. පුස්තකාල පාඨක සමාජ ආරම්භ කිරීම, ග්‍රාම සේවා වසම් මට්ටමෙන් පුස්තකාල සඳහා සාමාජිකයන් බඳවාගෙන අලුත් පරම්පරාවට කියවීමේ උනන්දුව වර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මීට සමගාමී ව තාක්ෂණය හා මාධ්‍ය භාවිත කරමින් නව පරම්පරාවේ කියවීමේ උනන්දුව දක්වන ආකාරයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සැලසුම් කර තිබුණා.

මහජන උපයෝගිතා දිනය ලෙස නම් කර තිබූ සැප්තැම්බර් 20 දිනයේදී සෑම පළාත් පාලන බල ප්‍රදේශයක ම ප්‍රධාන ආයතන පවිත්‍ර කිරීම ආදී ශ්‍රමදාන සැලැස්මක් දීප ව්‍යාප්ත ව ක්‍රියාත්මක කිරීම, මදුරු මර්දනයට පියවර ගැනීම ආදී කාර්ය සිදු කෙරුණා. පළාත් පාලන ආයතනවලට ඇති ප්‍රධානතම ගැටලුවක් වන්නේ කැළිකසළ බැහැර කිරීම. ඒ සඳහා රුපියල් මිලියන 750ක් වැය කරමින් රජය ක්‍රියාත්මක කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ඊට යම් තරමකට පිළියමක්.

පළාත් පාලන ආයතනවල සංචාරක ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් ද ව්‍යාපෘති 32ක් ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා වෙන් කර ඇත්තේ රුපියල් මිලියන 350ක්. සංචාරක යටිතල පහසුකම් සංවර්ධනයයි එහි අරමුණ. පළාත් පාලන ආයතනවල දැනට ආරම්භ කර තිබෙන තවත් වැඩසටහනක් වන්නේ නව වැසිකිළි පද්ධති ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම. ඒ සඳහා ව්‍යාපෘති 26ක් ආරම්භ කර තිබෙනවා රුපියල් මිලියන 300ක් වෙන් කරමින්. පළාත් පාලන ආයතන 341න් 116ක මාර්ගගත ගෙවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට 2025 අයවැයෙන් වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 52ක්.

2025 වසරේ දීප ව්‍යාප්ත මට්ටමින් පළාතකට ව්‍යාපෘති 6 බැගින් ව්‍යාපෘති 54ක් ක්‍රියාත්මක කිරීමට රජය අපේක්ෂා කරනවා. එයින් සැලකිය යුතු ව්‍යාපෘති සංඛ්‍යාවක් ආරම්භ කර අවසන්. ඒ සඳහා වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 675ක්. මේ මුදල වෙන් වන්නේ පළාත් පාලන ආයතනවල කාර්ය සාධන මට්ටම මත. ඒ ඒ පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදනය ඉහළ නැංවීමයි එහි අපේක්ෂාව.

පළාත් පාලන ආයතනවල සංචාරක ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් ද ව්‍යාපෘති 32ක් ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා වෙන් කර ඇත්තේ රුපියල් මිලියන 350ක්. සංචාරක යටිතල පහසුකම් සංවර්ධනයයි එහි අරමුණ. පළාත් පාලන ආයතනවල දැනට ආරම්භ කර තිබෙන තවත් වැඩසටහනක් වන්නේ නව වැසිකිළි පද්ධති ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම. ඒ සඳහා ව්‍යාපෘති 26ක් ආරම්භ කර තිබෙනවා රුපියල් මිලියන 300ක් වෙන් කරමින්. පළාත් පාලන ආයතන 341න් 116ක මාර්ගගත ගෙවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට 2025 අයවැයෙන් වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 52ක්.

රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එම්. කොඩිප්පිලි ආරච්චි පවසන්නේ පළාත් පාලන ආයතන කාර්ය සාධනය කොතරම්දුරට තම ආයතනවලට උපයෝගිතා සේවා ක්‍රියාත්මක කළා ද යන කාරණය පිළිබඳ අනාවරණය කර ගැනීමට මෙවලමක් සකස් කර ඇති බව. Perfect 2.0 ලෙසයි එය හඳුන්වන්නේ. එය සමන්විත වන්නේ සංරචක 2000කින්. සෑම වසරක ම පළාත් පාලන ආයතනයක් මහජන උපයෝගිතා සේවා කොපමණ සංඛ්‍යාවක් පවත්වාගෙන ගියා ද? මහජනතාවත් සමග කොපමණ සම්බන්ධ වුණා ද? වාර්ෂික අයවැය යටතේ ඒ ඒ ආයතන කොපමණ වියදමක් දරා තිබෙනවා ද? එම අයවැය සැකසුණේ කෙසේ ද? ආදී ලෙස සම්පූර්ණ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් කාර්ය සාධනය මැන බැලීමක් එහිදී සිදුකරනවා. ඒ ඒ ආයතනවල ප්‍රගතිය සහ දුර්වලතා හඳුනා ගනිමින් ඊට ප්‍රතිකර්ම යෙදීමට ඉන් හැකිවීම මෙහි විශේෂත්වයක්.

පුනරුදයේ පුරවර වැඩසටහන සාර්ථක ව ක්‍රියාත්මක කළ පළාත් පාලන ආයතන 50ක 2025 වසරේ පරිගණක පද්ධති 50ක් ස්ථාපිත කරන බවත් 2026 වසරේ ඩිජිටල් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පරිගණක පද්ධති ස්ථාපිත කිරීමට ප්‍රතිපාදන වෙන් කරන බවත් නියෝජ්‍ය අමාත්‍ය ප්‍රභා රුවන් අවධාරණය කළ කරුණක්. ඊට අමතර ව සෑම ග්‍රාම සේවා වසමක ම ජාතික වැඩපිළිවෙළක් ලෙස ප්‍රාදේශීය සභාව මැදිහත් වී සෞඛ්‍ය කමිටුවක් පත් කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමටත් තරුණ සංවිධාන (Youth Club) පිහිටුවා සෑම ග්‍රාම සේවා වසමක ම එවැනි සංවිධාන පිහිටුවීමටත් නියමිත ව තිබෙනවා.

මේ අනුව මහජනතාවට වඩා සමීප මහජන සේවා සපයන, කාර්යක්ෂම පළාත් පාලන පද්ධතියක් ඇති කිරීමට පුනරුදයේ පුරවර පළාත් පාලන සතියේ ආරම්භය අනාගතයේදී වඩාත් ඵලදායී ක්‍රියාවලියක් වනු ඇති බවට නොඅනුමානයි.

# තනි නොකළ යුත්තෝ



**නිරෝෂි දොඹගහගේ**

වැඩිහිටියන් යනු රටකට ආශීර්වාදයක්. වර්තමානයේ අප භුක්ති විඳින්නේ ඔවුන් කළ කැපකිරීම්වල ප්‍රතිඵල. ඔවුන්ගේ අත්දැකීම් සහ පරිණතභාවය පවුලකට, සමාජයට සහ රටට ඉතා වැදගත්. එම නිසා වයස්ගත ජනගහනයේ සුභ සාධනය, යහ පැවැත්ම යනාදී කාරණා කෙරෙහි මැදිහත්වෙමින් රටේ සංවර්ධනයට එම පිරිස දායක කරගන්නේ කෙසේද යන්න පිළිබඳ අවධානය යොමු කළ යුතු කාලයකටයි අප ප්‍රවේශ වී සිටින්නේ. සැම වසරක ම ඔක්තෝබර් 01 දිනට යෙදෙන 'ජාත්‍යන්තර වැඩිහිටි දිනය' නිමිති කරගෙන මේ පිළිබඳ කතාබහ කිරීම ඉතා කාලෝචිත වූවක්.

මෙවර ජාත්‍යන්තර වැඩිහිටි දිනයේ තේමාව වන්නේ "දේශීය හා ගෝලීය ක්‍රියාකාරකම් වන වැඩිහිටි තැනැත්තන්: අපගේ අභිලාෂ, යහපැවැත්ම සහ අයිතිවාසිකම්" (Older Persons Driving Local and Global Action; Our Aspirations, Our well Being and Our Rights) යන්න.

1991 වර්ෂයේ ඔක්තෝබර් 01 දින සිට ලොව ජාත්‍යන්තර වැඩිහිටි දිනය සමරන්නේ 1990 දෙසැම්බර් 14 දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් එම දිනය නම් කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස. එලෙස මෙවැනි දිනයක් හඳුන්වා දීමේ මූලික අරමුණ වූයේ වැඩිහිටියන්ගේ දායකත්වය ලෝකයට හඳුන්වා දීමට මෙන් ම ඔවුන්ගේ ගෞරවය, සුරක්ෂිතභාවය සහ අයිතිවාසිකම් පිළිබඳ අවධානය යොමු කිරීමට. 1991 වර්ෂයේදී මහා මණ්ඩලය විසින් 'වැඩිහිටි පුද්ගලයන් සඳහා එක්සත් ජාතීන්ගේ මූලධර්මය' යෝජනාව සම්මත කරන ලද අතර 2002 වර්ෂයේදී ස්පාඤ්ඤයේ පැවති ලෝක දෙවැනි වැඩිහිටි සම්මේලනයෙන් 'මැඩ්රිඩ් ජාත්‍යන්තර වයස්ගත වීම පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම' (Madrid International Plan of Action on Ageing - MIPAA) සම්මත කර ගැනෙනවා. ඒ, 21 වැනි සියවසේ ජනගහනය වයස්ගත වීමේ අවස්ථා සහ අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම, සියලු වයස් කාණ්ඩ සඳහා සමාජයක් සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීම යන අරමුණු පෙරදැරි ව.

ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම වෙනුවෙන් ඔක්තෝබර් 02 දින සිට ඔක්තෝබර් 07 දින දක්වා සතියක් නම් කර තිබීම විශේෂත්වයක්. ඒ අනුව එම සතියේ ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය විසින් විවිධ තේමා ඔස්සේ වැඩිහිටියන්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම, ප්‍රජා සවිබල ගැන්වීම, වැඩිහිටි සමිති ප්‍රවර්ධනය හා සුභ සාධනය, තාක්ෂණය, ආගමික හා සාරධර්ම යනාදී ක්ෂේත්‍ර පිළිබඳ වැඩිහිටියන් දැනුවත් කිරීම සිදු කරනු ලබනවා.

වැඩිහිටියන් සඳහා සමාජ අන්තර්කරණය, සහයෝගය සහ වැඩිහිටි හිතකර සමාජයක් ගොඩනැගීම පිළිබඳ කැපවීම අවධාරණය කරමිනුයි ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ජාත්‍යන්තර වැඩිහිටි දිනය නිමිත්තෙන් එළිදැක්වුණේ. වැඩිහිටි තැනැත්තන්ගේ බහුවිධ අවශ්‍යතා සපුරාලීම, සෞඛ්‍යසම්පන්න ව හා ක්‍රියාශීලී ව වයස්ගතවීම ප්‍රවර්ධනය සහ අන්තර් පරම්පරා සහයෝගිතාව වැඩිදියුණු කිරීම සඳහා මේ ප්‍රතිපත්තිය ඔස්සේ පුළුල් පදනමක් සැලසීමයි රජයේ අපේක්ෂාව. සම්බන්ධීකරණය



**වයස්ගත ජනගහනය ඉහළ යාමේ තත්ත්වයට අනාගතයේදී සාර්ථක ව මුහුණ දීම සඳහා වර්තමානයේදී සැලසුම් සහගත ව ක්‍රියා කළ යුතුයි. අද වැඩිහිටියන් නිසා පවුලත් පවුල නිසා වැඩිහිටියනුත් යම් යම් අභියෝගවලට මුහුණ දී ඇති බව පර්යේෂණවලින් සනාථ වී තිබෙනවා. හඳුනාගෙන ඇති වඩාත් ප්‍රබල ම ගැටලුව වන්නේ වැඩිහිටි රැකවරණය. අතීතයේ පැවති විස්තෘත පවුල තුළ වැඩිහිටි රැකවරණය ගැටලුවක් වුණේ නැහැ. වැඩිහිටියන් නිසා පවුලටත් පවුල නිසා වැඩිහිටියන්ටත් එකිනෙකාගේ උපකාර මත පාදක ව යැපීමට හැකියාව ලැබුණා.**

කරන ලද සාක්ෂි මත පදනම් වූ සහ අයිතිවාසිකම් කේන්ද්‍ර කරගත් ප්‍රවේශ ඔස්සේ වැඩිහිටි තැනැත්තන්ගේ ස්වාධීනත්වය, ආරක්ෂාව සහ අභිමානයෙන් යුතු ව ජීවත්වීමට ඇති අයිතිය සවිබලගැන්වීම මේ ප්‍රතිපත්තියේ අරමුණ වෙනවා.

2011 අංක 05 දරන පනතෙන් සංශෝධිත 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත ප්‍රකාර ව ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තා යන්නෙන් අදහස් වනුයේ වයස අවුරුදු 60 ඉක්මවූ තැනැත්තෙක්. එහිදී වයස අවුරුදු 60-69 අතර තරුණ වැඩිහිටි (Young Old), වයස අවුරුදු 70-79 අතර වැඩිහිටි (Old) හා වයස අවුරුදු 80ට වැඩි පුද්ගලයන් මහලු වැඩිහිටි (Oldest Old) ලෙසයි වර්ගීකරණය වන්නේ. ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සහ බල ගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක පනතෙන් ස්ථාපිත වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසිනුයි වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් රාජ්‍ය මැදිහත්වීම සිදු කරන්නේ.

ලොව ශීඝ්‍රයෙන් ඉහළ යන වැඩිහිටි ජනගහනය පිළිබඳ ව පළමුවරට ලෝක අවධානය යොමු වූයේ 1982 වියානා සම්මේලනයේදී. ඒ අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානය අනාවැකි පළ කරන්නේ 2025 වර්ෂයේදී ලෝක ජනගහනයෙන් දස ලක්ෂ 1100ක් වැඩිහිටි ජනගහනය වන බවට. එමෙන් ම එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2021-2031 දක්වා කාලය සුවබර වැඩිහිටියන් සඳහා වූ දශකය ලෙස ද නම් කර තිබෙනවා.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු දත්ත අනුව මෙරට වයස අවුරුදු 60 සහ ඊට වැඩි ජන සංඛ්‍යාව 1981 වර්ෂයේදී 6.6% සිට 2012 වර්ෂයේදී 12.4% දක්වා වර්ධනය වී ඇති බවයි නිරීක්ෂණය වන්නේ. නවතම සංඛ්‍යා දත්ත අනුව 2024 වර්ෂය වන විට මෙරට අවුරුදු 60ට වැඩි ජනගහනය 18%ක් (මිලියන 3.9ක්). ඒ අතරින් අවුරුදු 65ට වැඩි පිරිස 12.7%ක්. වර්ෂ 2041 වන විට මෙරට සෑම පුරවැසියන් සිව් දෙනෙකුගෙන් එක් අයෙකු වැඩිහිටියකු වන බවටයි පුරෝකථනය. එලෙස දකුණු ආසියානු කලාපයේ වේගයෙන් ජනගහනය වියපත් වන රටක් ලෙස ශ්‍රී ලංකාව, එහි පහත වැටෙන සාඵල්‍යතා අනුපාතික හා වර්ධනය වන ආයු අපේක්ෂාව හේතුකොටගෙන කැපී පෙනෙන ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියකට මුහුණදෙමින් සිටිනවා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය කුමාරි තෝරදෙනිය ප්‍රකාශ කරන්නේ රටක ජනගහනයෙන් 10%කට වැඩි සංඛ්‍යාවක් අවුරුදු 60ට වැඩිනම් එම රටෙහි ඉහළ වැඩිහිටි ජනගහනයක් සිටින බව අන්තර්ජාතික පිළිගැනීම බව. දකුණු ආසියාවේ වැඩි ම වැඩිහිටි ජනගහනයක් සහිත රට ලෙස ශ්‍රී ලංකාව සැලකෙනවා.

ආචාර්ය කුමාරි තෝරදෙනිය සඳහන් කරන්නේ 1950න් පසු මෙරට සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි ඇති වූ විශේෂ දියුණුව නිසා උපත් හා මරණ අනුපාතය පහළ යාම, මෙරට පුරවැසියන්ගේ ආයු අපේක්ෂාව ඉහළ අනුපාතයක පැවතීම යනාදී සාධක ගණනාවක් මෙරට වැඩිහිටි ජනගහනය ඉහළ යාම කෙරෙහි බලපෑම් කරන ලද බව. අදහස් දක්වන ඇය; "වයස්ගත ජනගහනය ඉහළ යාමේ තත්ත්වයට අනාගතයේදී සාර්ථක ව මුහුණ දීම සඳහා වර්තමානයේදී සැලසුම් සහගත ව ක්‍රියා කළ යුතුයි. අද වැඩිහිටියන් නිසා පවුලත් පවුල නිසා වැඩිහිටියනුත් යම් යම් අභියෝගවලට මුහුණ දී ඇති බව පර්යේෂණවලින් සනාථ වී තිබෙනවා. හඳුනාගෙන ඇති වඩාත් ප්‍රබල ම ගැටලුව වන්නේ වැඩිහිටි රැකවරණය. අතීතයේ පැවති විස්තෘත පවුල තුළ වැඩිහිටි රැකවරණය ගැටලුවක් වුණේ නැහැ. වැඩිහිටියන් නිසා පවුලටත් පවුල නිසා වැඩිහිටියන්ටත් එකිනෙකාගේ උපකාර මත පාදක ව යැපීමට හැකියාව ලැබුණා. එහෙත් වර්තමානයේ එම පවුල් සංස්ථාව දෙමව්පියන් සහ දරුවන් මූලික න්‍යෂ්ටික පවුල් ඒකකයක් බවට පරිවර්තනය වීම නිසා වැඩිහිටි රැකවරණය විශාල ගැටලුවක් බවට පත් ව තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇතිවූ පිබිදීම නිසා කාන්තාවන් අධ්‍යාපනයට යොමු වීම හා රැකියාවල නිරත වීම, නාගරීකරණය, සංක්‍රමණ යනාදී සාධක නිසා සිදු වී ඇති සමාජ වෙනස්කම් මේ තත්ත්වයට බලපාන හේතු".

මේ තත්ත්වය කළමනාකරණය කරගනිමින් වැඩිහිටි රැකවරණය සලසාලීම වෙනුවෙන් වැඩසටහන් රාශියක් දැනටමත් ක්‍රියාත්මක කෙරෙන බවයි ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ කේ. චතුර මිහිඳුම්

පවසන්නේ. ඉදිරි දශකයේ වැඩිහිටි සුභ සාධනය සඳහා දස අවුරුදු සැලැස්මක් අනුව ක්‍රියාත්මක වීමටයි එහිදී අපේක්ෂා කරන්නේ. වැඩිහිටියන් නොසලකා හැරීම්, අපයෝජන කිරීම් සම්බන්ධ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා 'වැඩිහිටි සරණ Help Line' නමින් 0707 898 889 දුරකතන අංකය නොබෝද හඳුන්වා දුන්නා. මෙරට වැඩිහිටි නිවාස 456ක ගැහැනු 3,666ක් පිරිමි 6,869ක් ලෙස 10,535ක් වැඩිහිටියන් රැකවරණය ලබන බව වාර්තා වී තිබුණත් ඒ අතරින් ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි වී ඇති වැඩිහිටි නිවාස සංඛ්‍යාව වන්නේ 143ක්. ඒ අනුව පවතින නීති, රෙගුලාසි සංශෝධනය කරමින් වැඩිහිටි නිවාස ලියාපදිංචිය හා නියාමනය සඳහා වන නව රෙගුලාසි නියෝග නිකුත් කිරීමත් 2025 වර්ෂයේ ඉදිරි අපේක්ෂාවක්.

ආචාර්ය කුමාරි තෝරදෙනිය දක්වන පරිදි තමාට ජීවත්වීම සඳහා ප්‍රමාණවත් ආදායම් මාර්ගයක් ඇත්තේ මෙරට වැඩිහිටි ජනගහනයෙන් 25%ක පිරිසකට පමණයි. තවත් 25%ක් රජයෙන් ලබන වැඩිහිටි දීමනා මත යැපෙන අතර ඉතිරි 50%ක පිරිස යැපෙන්නේ පවුල් පරිසරයෙන්. 2025 සැප්තැම්බර් මස දත්ත අනුව අස්වැසුම යටතේ 602,852ක් සහ තැපැල් කාර්යාල මගින් 288,587ක් ලෙස වැඩිහිටි දීමනාව ලැබූ අවුරුදු 70ට වැඩි පිරිස 891,439ක්. වයස අවුරුදු 100ට වැඩි සියවස් සපිරි වැඩිහිටි දීමනාලාභීන් සංඛ්‍යාව 547ක්. වැඩිහිටි රැකවරණය වෙනුවෙන් දීපව්‍යාප්ත දිවා මධ්‍යස්ථාන 215ක් ස්ථාපිත කර ඇති අතර එයින් 193ක් දැනට සක්‍රිය දිවා මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මක වෙනවා.



වැඩිහිටියන්ට එරෙහි ව සිදුවන ප්‍රචණ්ඩත්වය කායික, මානසික, මූල්‍යමය, බලහත්කාරයෙන් දේපළ අයිති කර ගැනීම යනාදී ස්වරූපවලින් දක්නට ලැබුණත් ඒවා වාර්තා වන්නේ 20%ක් පමණ බවයි ලෝකයේ පිළිගැනීම. ඒ අතරිනුත් මෙරට වැඩිහිටි ප්‍රචණ්ඩත්වය වාර්තා වන්නේ 1%ක් පමණ. වැඩිහිටියන්ට එරෙහි ශාරීරික ප්‍රචණ්ඩත්වය බොහෝවිට වාර්තා වන්නේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ වාර්තා පාදක ව. මේ තත්ත්වය කෙරෙහි ද වැඩිහිටි සුරක්ෂිතභාවය තහවුරු කිරීමේදී අවධානය යොමු කළ යුතුයි.

වැඩිහිටියන්ට එරෙහි ව සිදුවන ප්‍රචණ්ඩත්වය කායික, මානසික, මූල්‍යමය, බලහත්කාරයෙන් දේපළ අයිති කර ගැනීම යනාදී ස්වරූපවලින් දක්නට ලැබුණත් ඒවා වාර්තා වන්නේ 20%ක් පමණ බවයි ලෝකයේ පිළිගැනීම. ඒ අතරිනුත් මෙරට වැඩිහිටි ප්‍රචණ්ඩත්වය වාර්තා වන්නේ 1%ක් පමණ. වැඩිහිටියන්ට එරෙහි ශාරීරික ප්‍රචණ්ඩත්වය බොහෝවිට වාර්තා වන්නේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ වාර්තා පාදක ව. මේ තත්ත්වය කෙරෙහි ද වැඩිහිටි සුරක්ෂිතභාවය තහවුරු කිරීමේදී අවධානය යොමු කළ යුතුයි.

දෙමාපියන් රැක බලා ගැනීම ගැටලුවක් වූ කල එම පවුල් සංස්ථාව තුළ සාමය බිඳවැටෙන බවත් පීඩනයකට ලක්වෙන බවත් ඇතැම් විට ඒවා මානසික ගැටලු දක්වා දුර දිග යන බවත් සුලබ ව නිරීක්ෂණය වන බව ආචාර්ය කුමාරි තෝරදෙනිය පවසනවා.

රජයට ද වැඩිහිටියන් රැකබලා ගැනීම සම්බන්ධයෙන් විශේෂයෙන් බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර කිරීමේදී සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු ව තිබෙනවා. සමාජ ආරක්ෂණය වෙනුවෙන් වැඩිහිටි සුභ සාධනය සඳහා වැය වන පිරිවැය ද ඉතා ඉහළයි. වැඩිහිටියන් රැක බලා ගැනීම සම්බන්ධයෙන් මෙරට පවතින ආයතනගත රැකවරණය යන්න එතරම් ජනප්‍රිය සංකල්පයක් නොවෙයි. පවුල් සංස්ථාව තුළ දෙමාපියන් රැක බලා ගත යුතු බවට විශ්වාසයක් පැවතියත් මේ වන විට වැඩිහිටි නිවාස සඳහා පවතින්නේ ඉහළ ඉල්ලුමක්. එහෙත් එයට සරිලන තරම් වැඩිහිටි නිවාස නැහැ. මේ නිසා කුමන පීඩාකාරී තත්ත්වයක් දරාගෙන වුව ද තම නිවසේ තමන්ගේ දරුවන් සමඟ සිටීමටයි බහුතර වැඩිහිටියන් උත්සාහ දරන්නේ.

මේ තත්ත්වය කළමනාකරණය සඳහා සාධනීය පියවරක් ලෙස ගම් මට්ටමින් දිවා සුරැකුම් මධ්‍යස්ථාන සුලබ කළ හැකි බවයි ආචාර්ය කුමාරි තෝරදෙනිය පවසන්නේ. පවුල, ප්‍රජාව, ස්වේච්ඡා සංගම්, ආගමික ආයතන, රජය යනාදී සෑම පාර්ශ්වයකට ම මේ සඳහා මූලිකත්වය ගත හැකියි. මේ සඳහා පවුල්වල ද යම් දායකත්වයක් තිබෙන නිසා දරුවන් මෙන් ම දෙමව්පියන් තුළ නොසලකා හරින ලදැයි වරදිකාරී හැඟීම් ඇතිවීමට ඉඩක් නැහැ. එසේ ම ආගමික, සංස්කෘතික වටපිටාව අනුව පිළිගැනීමට ලක්වී තිබෙන වැඩිහිටි රැකවරණය සම්බන්ධ මතවාද පිළිබඳ සමාජ ආකල්පමය වෙනසක් ඇති කිරීම කාලීන අවශ්‍යතාවක්.




# රට යන මග

දීප්ත කුමාර බටගොඩ

"සිය ආර්ථිකය ස්ථාවර කිරීමේදී කැපී පෙනෙන ප්‍රගතියක් ශ්‍රී ලංකාව ලබා ඇත" යනුවෙන් ලෝක බැංකුව ප්‍රකාශ කර තිබුණේ මෑතකදී. 1980 වසරේ සිට රටවල් 123ක මෙවැනි සමාන ප්‍රයත්න 330කට වඩා වැඩි ගණනක් හා සසඳන විට, ජාත්‍යන්තර ප්‍රමිති අනුව මේ ප්‍රගතිය තියුණු හා වේගවත් බව ඔවුන් පෙන්වා දෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ද මෙයට සමාන අදහසක් ඉදිරිපත් කරමින් කියා තිබුණේ ජාත්‍යන්තර අවදානම් හා අවිනිශ්චිතතා හමුවේ ක්‍රියා කිරීමට ද ශ්‍රී ලංකාවට සිදුවනු ඇති බව.

> ලෝක බැංකුව ඇතුළු ජාත්‍යන්තර ආයතන පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාව අපේක්ෂිත තත්ත්වයට වඩා මූල්‍ය ශේෂ සහ බාහිර කම්පනවලට ඔරොත්තු දෙමින් ආර්ථිකය අඛණ්ඩ ව යථාතත්ත්වයට පත්වෙමින් පැවති බව. එසේ ම ගෘහස්ථ ආදායම්, රැකියා නියුක්තිය සහ මූල්‍ය නොවන සුභසාධනය අර්බුදයට ද අර්බුදයට පෙර මට්ටමට වඩා බෙහෙවින් පහළින් පවතින බව ඔවුන් පෙන්වා දී තිබුණා.

2022 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ පැවැති උග්‍ර ආර්ථික අර්බුදයෙන් පසුව වර්තමාන ආණ්ඩුව බලයට පත් වූයේ, එවක ජනාධිපති වූ රනිල් වික්‍රමසිංහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති කරගත් සහයෝගිතා ගිවිසුමකට එළැඹීමෙන් පසුව එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක වෙමින් පැවති වකවානුවකදී. එහෙයින් වත්මන් ආණ්ඩුව හමුවේ පැවති ප්‍රධාන අභියෝගය වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති කරගත් සහයෝගිතා ගිවිසුම තුළ "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශයේ අරමුණු ඉටු කර ගැනීමේ ගමන් මාවත සකස් කර ගැනීම. ඒ අනුව දූෂණයෙන් තොර රාජ්‍ය සංවිධාන ව්‍යුහයක් ඇති කර ගැනීම, නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත කරමින් ආර්ථිකයේ ස්ථාවරත්වය ළඟා වීම කඩිනම් කිරීම හා ඉන්පසුව අපේක්ෂිත සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීම වත්මන් ආණ්ඩුව විසින් කළ යුතු ව තිබූ මූලික කාර්ය වුණා.

## ස්ථාවරත්වය සහ වර්ධනය සඳහා ව්‍යුහාත්මක වෙනස්කම්

ශ්‍රී ලංකා ආර්ථිකය නොසිතූ විරූ බිඳ වැටීමකට ලක් වූයේ ඒ වන විටත් කාලයක් පැවති දුර්වල ආර්ථික කළමනාකරණය සහ ආර්ථික දේහයේ පැවති ව්‍යුහාත්මක නොගැලපුම් බවයි දෙස් විදෙස් බොහෝ ආර්ථික විශ්ලේශකයන්ගේ මතය. මේ නිසා නව රජයට ආර්ථිකයේ කළමනාකාරිත්වය ශක්තිමත් කිරීම මෙන් ම ව්‍යුහාත්මක ගැලපුම් ද සිදු කළ යුතු ව තිබුණා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාර ව යම්කිසි ධනාත්මක තත්ත්වයක් රටේ නිර්මාණය වී තිබුණත් රාජ්‍ය සේවයේ ආකාර්යක්ෂමතාව, නීති පද්ධතියේ පැවති දුර්වලතා හෝ ඒවා නිසි ලෙස ක්‍රියාත්මක නොවීම, අල්ලස හා දූෂණය, මත්ද්‍රව්‍ය හා පාතාල ක්‍රියාකාරකම් වැනි ආර්ථිකයේ ස්ථාවර වර්ධනය සඳහා බාධාකාරි සාධක තිබුණා. ඒ අනුව වත්මන් රජයට සිදු ව තිබෙනවා අකාර්යක්ෂම හා රජයට අනවශ්‍ය බරක් වන ඇතැම් රාජ්‍ය ආයතන වසා දැමීමටත් ඇතැම් ඒවා ප්‍රතිව්‍යුහගතකරණය කිරීමටත්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් ගිවිසුම ධනාත්මක ව අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය මූල්‍ය පනත සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන පනත වඩාත් ශක්තිමත් ව බලගැන්වීම, රජයේ නාස්තිකාර හා අනවශ්‍ය වියදම් කපා හැරීම මෙන් ම සීමා කිරීම හා වියදම් කළමනාකරණය, රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට සහ නීතිය හා සාමය ක්‍රියාත්මක කරන ආයතනවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට පියවර ගැනීම, දේශීය හා විදේශීය ආයෝජන සඳහා පවතින නීතිමය හා අනෙකුත් බාධා ඉවත් කිරීම, මත්ද්‍රව්‍ය හා පාතාල ක්‍රියාකාරකම් අඩපණ කිරීමෙන් කළු රාජ්‍ය බලපෑම අවම කිරීමට මෙහිදී අවධානයට ලක් වූ කාරණා.

## ආර්ථික වර්ධනය හා සේවා විශුක්තිය

ලෝක බැංකුව ඇතුළු ජාත්‍යන්තර ආයතන පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාව අපේක්ෂිත තත්ත්වයට වඩා මූල්‍ය ශේෂ සහ බාහිර කම්පනවලට ඔරොත්තු දෙමින් ආර්ථිකය අඛණ්ඩ ව යථාතත්ත්වයට පත්වෙමින් පැවති බව. එසේ ම ගෘහස්ථ ආදායම්, රැකියා නියුක්තිය සහ මූල්‍ය නොවන සුභසාධනය අර්බුදයට ද අර්බුදයට පෙර මට්ටමට වඩා බෙහෙවින් පහළින් පවතින බව ඔවුන් පෙන්වා දී තිබුණා. 2025 වර්ෂයේදී ද මේ තත්ත්වය තවදුරටත් වර්ධනය වෙමින් ආර්ථිකයේ යම් ආකාරයක ස්ථාවර මට්ටමකට ළඟා වී තිබෙනවා. 2025 පළමු කාර්තුවේදී සියයට 4.8ක් වූ ආර්ථිකයේ වර්ධනය දෙවැනි කාර්තුව වන විට සියයට 4.9ක් වුණා. වත්මන් ආණ්ඩුවේ විසර්ජන පනත (අයවැය) සම්මත කර ගැනීම සිදු වූයේ 2025 මාර්තු මාසයේදී වුවත් මුල් කාර්තුවේ මෙවැනි වර්ධනයක් පෙන්නුම් කිරීම විශේෂත්වයක්. දෙවැනි කාර්තුවේදී එය සියයට 4.9ක වර්ධනයක් පෙන්නුම් කර තිබෙන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසනවා. 2023 වර්ෂයේ දෙවැනි කාර්තුවේ සියයට ඍණ 3.1ක් වාර්තා කර තිබියදී, එයට සාපේක්ෂ ව 2024 වර්ෂයේ දෙවැනි කාර්තුවේදී වාර්තා වුණේ දළ දේශීය නිෂ්පාදිතය සියයට 4.1ක්, 2025 දෙවැනි කාර්තුවේ සියයට 4.9ක වර්ධනයක් වාර්තා කරන ලද්දේ 2024 දෙවැනි කාර්තුවේ සියයට 4.1ක වර්ධනයට සාපේක්ෂ ව වීම ද විශේෂත්වයක්.

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රධාන අංශ තුන වන කෘෂිකාර්මික අංශය සියයට 2.0කින් ද කර්මාන්ත අංශය සියයට 5.8කින් ද සේවා අංශය සියයට 3.9කින් ද 2025 දෙවැනි කාර්තුවේ වර්ධනය සඳහා දායක වී තිබෙන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පැහැදිලි කරනවා. කෙසේ වුවත් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය තවමත් අර්බුදයට පෙර පැවති මට්ටමට ළඟා වී නොමැති බැවින් ආර්ථිකය තවදුරටත් ඉහළ සහ ස්ථාවර වර්ධන වේගයක් අත්පත් කර ගතයුතු ව පවතින බවයි පෙනී යන්නේ. 2026 වර්ෂය වන විට එම තත්ත්වය ළඟා කර ගැනීම රජයේ අපේක්ෂාවක්.

2020 වර්ෂයේ සියයට 5.5ක් වූ සේවා විශුක්තිය ද 2025 දෙවැනි කාර්තුව වන වට සියයට 3.8ක් දක්වා පහළ යාමක් වාර්තා කර තිබෙන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහ මහබැංකු දත්තවලින් පෙන්නුම් කරනවා.

## උද්ධමනය

අවධමන තත්ත්වයේ අවසානය සනිටුහන් කරමින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ ශ්‍රී ලංකාවේ උද්ධමනය 2025 අගොස්තු මාසයේදී සියයට 1.2ක් වූ බව ශ්‍රී ලංකා මහබැංකුව වාර්තා කරනවා. අඛණ්ඩ ව මාස 11ක් පුරාවට පැවති අවධමනකාරී තත්ත්වය පහව යාමෙන් පසුව මෙවැනි උද්ධමනයක් වාර්තා කිරීම විශේෂත්වයක්. ආර්ථිකයේ කඩා වැටීමත් සමඟ ශ්‍රී ලංකාවේ වාර්තා වුණේ ඉහළ උද්ධමනකාරී තත්ත්වයක්. එය ඇතැම් අවස්ථාවකදී සියයට 70 ඉක්මවූවා. මේ නිසා ආර්ථිකයේ ස්ථාවරත්වයක් ඇති කර ගන්නවාත් සමඟ ම උද්ධමනය ක්‍රමයෙන් අවම කරගත යුතු වුණා. ඒ අනුවයි රජය ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් පසුගිය කාලවකවානුවේ අඛණ්ඩ ව අවධමන තත්ත්වයක් වාර්තා කළේ. කෙසේ වුවත් ආර්ථිකය යම් තරමකට ස්ථාවර වීමත් සමඟ අවශ්‍යතාව පවතින්නේ එහි ශීඝ්‍ර හා අඛණ්ඩ වර්ධනයක්. බොහෝ විට අවධමනකාරී තත්ත්වයකට වඩා උද්ධමනකාරී තත්ත්වයකදී ආර්ථිකයේ වර්ධනය සාපේක්ෂ වශයෙන් ඉහළ යා හැකි බව බොහෝ ආර්ථික විද්‍යාඥයන් පෙන්වා දී ඇති කාරණයක්. නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා සඳහා ලැබෙන ලාභය අනුව නිෂ්පාදකයන් තම නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීමක් කළ හැකියි. ඒ, ලැබෙන ඉහළ මිල හේතුවෙන් වැඩිවන ලාභය නිෂ්පාදකයන් උත්තේජනය නිසා. ඉහළ උද්ධමනකාරී තත්ත්වයක් ද ආර්ථිකයකට අහිතකර ලෙස බලපෑම් කළ හැකියි. විශේෂයෙන් ම පාරිභෝගික ක්‍රය ශක්තිය පහළ යාම නිසා සමස්ත ඉල්ලුම පහළ යාමට එයින් ඉඩ තිබෙනවා.



මේ නිසා මධ්‍යස්ථ උද්ධමනයක් (තනි ඉලක්කමක උද්ධමනයක්) පවත්වාගෙන යාම ශ්‍රී ලංකාවේ ආර්ථික අපේක්ෂාවලට හිතකර තත්ත්වයක් උදා කරනු ඇති. ශ්‍රී ලංකා මහබැංකුව සියයට 5ක මට්ටමේ අනාගත උද්ධමනයක් අපේක්ෂා කරන බව පැවසෙනවා.

## දරිද්‍රතාව හා සමාජ සුභ සාධනය

ලෝක බැංකුව පවසන පරිදි ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව සියයට 24.5ක් ලෙසින් 2024 වර්ෂයේදී සුළු වශයෙන් අඩු වී තිබුණ ද එය 2019 වර්ෂයේ පැවති මට්ටමට වඩා දෙගුණයකින් පමණ ඉහළ අගයක්. 2025 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව සියයට 22.7 දක්වා අඩු වනු ඇතැයි ලෝක බැංකුව පුරෝකතනය කරන අතර එය රඳා පවතින්නේ සාර්ව ආර්ථිකයේ ස්ථාවරත්වය සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මත බව ද ඔවුන් පෙන්වා දෙනවා.

දරිද්‍රතාව පිටුදැකීම සඳහා ශ්‍රී ලංකා රජය සහ වෙනත් සංවිධාන ඉතිහාසයේ පටන් ම ආහාර මුද්දර, ජනසවිය, සමෘද්ධි ආදී වැඩසටහන් ද නිශ්චිත පුද්ගල කණ්ඩායම් ඉලක්ක කරගත් වැඩිහිටි දීමනා, ගර්භිණී මව්වරුන්ට පෝෂණ මල්ලක් ලබා දීම, පාසල් ළමයින්ට දිවා ආහාරය සැපයීම, විවිධ රෝගාබාධවලට ලක්වූවන් සඳහා සහනාධාර ලබාදීම ආදී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවා. වර්තමානයේදී සුභ සාධන ප්‍රතිලාභ වැඩසටහන යටතේ අස්වැසුම ලබා දීම රජයේ එවැනි ප්‍රමුඛතා වැඩසටහනක්.

## අපනයනය හා විදේශ සෘජු ආයෝජන

2025 වසරේ මුල් මාස අට තුළ ශ්‍රී ලංකාවේ අපනයන අංශය කැපී වර්ධනයක් පෙන්නම් කරන බව අපනයන සංවර්ධන මණ්ඩලය පවසනවා. ඒ අනුව 2025 අගෝස්තු මාසය වන විට අපනයන ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 11 ඉක්මවමින් 2024 වර්ෂයට සාපේක්ෂ ව සියයට 6.6ක වර්ධනයක් වාර්තා කරන බවයි ඔවුන් පෙන්වා දෙන්නේ. 2025 වර්ෂය සඳහා අය වැය ඇස්තමේන්තුව තුළ අපේක්ෂිත අපනයන ආදායම ඇමරිකානු ඩොලර් බිලියන් 18ක්.

2025 අගෝස්තු මාසයේදී වෙළෙඳ භාණ්ඩ සහ සේවා යන අංශවල මුළු අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 1,607.58ක්. 2024 අගෝස්තු මාසයට සාපේක්ෂ ව එය සියයට 2.57ක වර්ධනයක්. 2025 අගෝස්තු මාසයේදී වෙළෙඳ භාණ්ඩ අපනයනය 2024 අගොස්තු මාසයට සාපේක්ෂ ව සියයට 5.13කින් වර්ධනය වී තිබෙන අතර එය ඇමරිකානු ඩොලර් මිලියන 1,294.83ක් ලෙසිනුයි දැක්වෙන්නේ. 2025 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලයේ වෙළෙඳ භාණ්ඩ අපනයනය ඇමරිකානු ඩොලර් මිලියන 9,092.85ක් වූ අතර එය 2024 එම කාලයට සාපේක්ෂ සියයට 6.8ක වර්ධනයක්. 2025 අගෝස්තු මාසයේදී සේවා අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 312.75ක්. වසරේ මුල් මාස අට තුළ සේවා අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 2,461.46ක් වූ අතර එය සියයට 5.57ක වර්ධනයක්.


> ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ආයෝජන පසුබිම පිළිබඳ වාර්තාවක් (Investment Climate Statement for Sri Lanka 2025) නිකුත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ වත්මන් ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය ප්‍රසිද්ධියේ දූෂණය මුලිනුපුටා දැමීමට සහ රජයේ විනිවිදභාවය වැඩිදියුණු කිරීමට කැපවී සිටීමෙන් ආයෝජන ප්‍රවර්ධනය සඳහා හිතකර වාතාවරණයක් සකස් කර තිබුණ ද තවමත් විදේශ ආයෝජන සඳහා ව්‍යුහාත්මක සහ නීතිමය බාධාකාරී තත්ත්ව පවතින බව.

අර්බුදයෙන් පසු කාලවකවානුවේදී ශ්‍රී ලංකාවේ අපනයන අංශය ශක්තිමත් කිරීමටත් තරගකාරීත්වය වැඩිදියුණු කරමින් වෙළෙඳපොළ පුළුල් කිරීමේ ක්‍රියාමාර්ගවලට එළැඹීටත් රජය ක්‍රියා කළා. බොහෝ විචාරකයන් පෙන්වා දෙන්නේ විනිමය අනුපාතිකය ස්ථාවර ව පවත්වා ගැනීම, පොලී අනුපාතිකය ඇතුළු මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය හිතකර මට්ටමක පවත්වා ගැනීම ඇතුළු රජයේ උපායමාර්ගික ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙසින් මේ ආකාරයේ අපනයන වර්ධනයක් පෙන්නුම් කර ඇති බව.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දත්ත අනුව 2025 වසරේ ජනවාරි සිට ජූලි මාසය දක්වා විදේශ සෘජු ආයෝජන (FDI) ඇමරිකානු ඩොලර් මිලියන 507ක් වූ අතර එය 2024 වර්ෂයේ එම කාලයට සාපේක්ෂ ව සියයට 191ක පමණ වර්ධනයක්. 2025 ජූලි හා අගෝස්තු මාසවලදී ඇ.ඩො.මිලියන 276කින් එය ඉහළ ගිය අතර ඒ අනුව සමස්ත ආයෝජන ( FDI) ඇ.ඩො. මිලියන 783ක් වෙනවා.

ශ්‍රී ලංකාව මෑතකාලීන ව සිදුකරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ හා ආයෝජන සඳහා සකසා ඇති හිතකර වටපිටාව ආයෝජකයන්ගේ විශ්වාසය දිනා ගැනීම සඳහා උපකාර වී ඇති බවක් මේ අනුව පෙනී යනවා. එහෙත් ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ආයෝජන පසුබිම පිළිබඳ වාර්තාවක් (Investment Climate Statement for Sri Lanka 2025) නිකුත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ වත්මන් ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය ප්‍රසිද්ධියේ දූෂණය මුලිනුපුටා දැමීමට සහ රජයේ විනිවිදභාවය වැඩිදියුණු කිරීමට කැපවී සිටීමෙන් ආයෝජන ප්‍රවර්ධනය සඳහා හිතකර වාතාවරණයක් සකස්

**දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය - කාලපරිච්ඡේදය අවසානයට (අ)**




මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව

කර තිබුණ ද තවමත් විදේශ ආයෝජන සඳහා ව්‍යුහාත්මක සහ නීතිමය බාධාකාරී තත්ත්ව පවතින බව.

## විදේශ ප්‍රේෂණ, සංචාරක පැමිණීම් හා නිල විදේශ සංචිත

ශ්‍රී ලංකා මහබැංකුවේ ප්‍රකාශිත දත්ත (තාවකාලික) අනුව 2025 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලයේ විදේශ රැකියා සඳහා පිටත් ව ගිය මුළු සංඛ්‍යාව 203,901ක්. එම කාලයට අදළ ව විදේශ සේවා නියුක්තිකයන්ගේ විදේශ ප්‍රේෂණ ඇ.ඩො. මිලියන 5116ක් වූ බව ශ්‍රී ලංකා මහබැංකුව වාර්තා කරනවා. 2024 වර්ෂයේ අගෝස්තු වන විට සියයට 15.7කින් වර්ධනය වූ විදේශ ප්‍රේෂණ 2025 වර්ෂයේ එම කාලය වන විට සියයට 17.9කින් වර්ධනය වී තිබෙනවා.

සංචාරක පැමිණීම ද 2025 වර්ෂයේ ඉහළ ගොස් තිබෙනවා. වර්ෂය තුළ මේ දක්වා සංචාරකයන්ගේ පැමිණීම ලක්ෂ 17 ඉක්මවා ඇති බව සඳහන්. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ විසින් නිකුත් කරනු ලබන මාසික සංචාරක පැමිණීම් වාර්තා අනුව 2024 වසරේදී මෙරටට පැමිණි සමස්ත සංචාරකයන් ගණන 2,053,465ක්. එහෙත් 2025 වර්ෂයේ ගත වූ සැප්තැම්බර් මාසය දක්වා පමණක් පැමිණි සංචාරකයන් ගණන 1,725,494ක්. 2025 වර්ෂයේදී සෑම මාසයක ම පාහේ සංචාරකයන්ගේ පැමිණීම 2024 වර්ෂයේ එම කාලවකවානුවට වඩා ඉහළ ගොස් තිබෙන බවයි පෙනී යන්නේ. ඉන්දියාව, චීනය, ජර්මනිය, එක්සත් රාජධානිය වැනි රටවල සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනයක් 2025 වර්ෂයේදී දකින්න පුළුවන්. 2024 වසරේ මුල් කාලයට සාපේක්ෂ ව 2025 වසරේ මුල් කාලයේ සංචාරක කර්මාන්තයේ ඉපැයුම්වල ඉහළ යාමක් පෙන්නුම් කළ ද අගෝස්තු මාසය වන විට එහි පහළ යාමක් වාර්තා වෙනවා. ශ්‍රී ලංකා මහබැංකුවේ දත්ත අනුව 2025 මැයි මාසය වන විට සංචාරක කර්මාන්තයෙන් උපයන ලද ආදායම ඩොලර් බිලියන 1.5ක් වන අතර සංචාරක කර්මාන්තයෙන් වර්ෂාවසානයේ අපේක්ෂිත ආදායම ඇ.ඩො. බිලියන 5ක්.


සංචාරක පැමිණීම ද 2025 වර්ෂයේ ඉහළ ගොස් තිබෙනවා. වර්ෂය තුළ මේ දක්වා සංචාරකයන්ගේ පැමිණීම ලක්ෂ 17 ඉක්මවා ඇති බව සඳහන්. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ විසින් නිකුත් කරනු ලබන මාසික සංචාරක පැමිණීම් වාර්තා අනුව 2024 වසරේදී මෙරටට පැමිණි සමස්ත සංචාරකයන් ගණන 2,053,465ක්. එහෙත් 2025 වර්ෂයේ ගත වූ සැප්තැම්බර් මාසය දක්වා පමණක් පැමිණි සංචාරකයන් ගණන 1,725,494ක්.


රටක නිල විදේශ සංචිත ප්‍රමාණය එම රටේ සමස්ත ආනයන තීරණය කරන ප්‍රධාන සාධකයක්. මෑතකාලීන අර්බුදයට ආසන්න ප්‍රධාන හේතුවක් වූයේ ද දළ නිල සංචිතවල හිඟ බව. අර්බුදයෙන් පසුව ශ්‍රී ලංකාව තම විදේශ සංචිත ප්‍රමාණය ස්ථාවර පවත්වා ගැනීමටත් එය තවදුරටත් වර්ධනය කර ගැනීමටත් පියවර ගත්තා. ඒ අනුව අද වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය මාස තුනකට වැඩි කාලයක ආනයන සඳහා ප්‍රමාණවත් වන පරිදි, එනම් ඇ.ඩො. බිලියන 6.1ක් පමණ වෙනවා.

මේ අනුව 2025 වර්ෂයේ මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික පරිසරය සමස්තයක් වශයෙන් විග්‍රහ කරන විට පැහැදිලි සහ නිශ්චිත ගමනාන්තයක් කරා ගමන් කරන බවට පැහැදිලි සාක්ෂි පවතිනවා. එසේ වුවත් තවමත් ඉතිහාසයේ පැවති දුර්වලතා පූර්ණ වශයෙන් ඉවත් ව ගොස් නැහැ. එම නිසා නීතියේ ආධිපත්‍යය මත සාමාජීය ආකල්පමය වෙනසකින් යුතු දේශපාලන හා ආර්ථික සුරක්ෂිතතාව තවදුරටත් තහවුරු කළ යුතු වෙනවා. ඒ සඳහා වත්මන් රජයට පමණක් නොව ජනතාවට ද ඇත්තේ අත්හැරිය නොහැකි වගකීමක්.



# කඳු වළල්ලේ කැරැල්ල

ඩබ්ලිව්. එම්. ශාන්තප්‍රිය

ආණ්ඩුවට එරෙහි මේ ජන නැගිටීමට ආසන්න හේතුව වූයේ ආණ්ඩුව 2025 සැප්තැම්බර් 04 දින සමාජ මාධ්‍ය වේදිකා 26ක් තහනම් කිරීම. මේ සමඟ රට පුරා දිනක් දෙකක් තුළ ඇවිළී ගිය අරගලය එරට සමස්ත සමාජය ම උඩුයටිකුරු කළා. පාර්ලිමේන්තුව, අගමැති කාර්යාලය ඇතුළු රජයේ ගොඩනැගිලි පමණක් නොව ශ්‍රේෂ්ඨාධිකරණය ද ගිනිබත් කෙරුණා.

මෑත කාලයේ ජන අරගල පැන නැගුණු අලුත් ම රට නේපාලය. එහිදී ද සිදු වුණේ 2022 වසරේ ශ්‍රී ලංකාවේ හා 2025 වසරේ බංගලි දේශයේ මෙන් ජන අරගලයක් ඔස්සේ පාලකයන් බලයෙන් පහ කිරීම.

දකුණු ආසියානු රටක් වන නේපාලය, ප්‍රජාතන්ත්‍රවාදී පෙඩරල් ජනරජය ලෙස හඳුන්වනවා. 2015 වසරේදී සම්මත කරන ලද නේපාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත් නමයකට බෙදා පෙඩරල් පාර්ලිමේන්තු ක්‍රමය ඇති කළා. දකුණින්, බටහිරින් හා නැගෙනහිරින් ඉන්දියාවට මායිම් වන නේපාලය උතුරින් මායිම් වන්නේ චීනයට. පෘථිවියේ සාමාන්‍ය මුහුදු මට්ටමේ සිට උස ම ස්ථානය වන එවරස්ට් කන්ද ඇතුළු ව ලෝකයේ උස ම කඳු දහයෙන් අටක් ම පිහිටා ඇත්තේ නේපාලයේ. වර්ග කිලෝමීටර් 147,516ක විශාලත්වයක් ඇති නේපාලයේ ජනගහනය ලක්ෂ 300කට ආසන්න වෙනවා. මෙය බහු ආගමික, බහුභාෂා හා බහු සංස්කෘතික රටක් වුවත් හින්දු ආගම හා බුද්ධාගම වැඩි ජනතාවකගේ ආගම් බවට පත් ව තිබෙනවා.

නේපාල දේශය තීරණාත්මක වෙනසකට අවතීර්ණ වන්නේ 1990 දශකයේ මැද භාගයේ එරට වාමාංශික මාඕවාදී සටන්කාමීන් විසින් නේපාල රාජාණ්ඩු ක්‍රමයට එරෙහි ව සන්නද්ධ අරගලයක් දියත් කරනු ලැබීමත් සමඟ. 1996 සිට 2006 වසර දක්වා පුරා දශකයක් නේපාලයේ පැවැති මේ මාඕවාදී සන්නද්ධ අරගලය හැඳින්වුණේ නේපාල මහජන යුද්ධය ලෙස. කෙසේ වෙතත් 2006 වසරේදී නේපාලයේ ඇති වූ සාම ගිවිසුම නිසා පැවති රාජාණ්ඩු ක්‍රමය අහෝසි කර ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයක් පිහිටුවීමට එරට පියවර ගත්තා.

2008 වසරේදී නව ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයත් සමඟ පැවැති මැතිවරණයෙන් ලෝකයේ එක ම හින්දු රාජාණ්ඩුක්‍රමය බිඳවැටී ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ක්‍රමයක් ස්ථාපිත වනවා. මාඕවාදී අරගල නායක පුෂ්ප කමල් දහාල්ගේ නායකත්වයෙන් නව පාලනය ස්ථාපිත වුණා. ඉන්පසු 2025 සැප්තැම්බර් දක්වා නේපාලයේ ආණ්ඩු 13ක් ඇතිවී තිබෙනවා.

2025 සැප්තැම්බර් ජන අරගලයෙන් පසු නේපාලයේ පවතින්නේ අන්තර්කාලීන ආණ්ඩුවක්. එය 14 වැනි ආණ්ඩුව. 73 හැවිරිදි හිටපු අගවිනිසුරුවරිය වූ සුසිලා කාර්කි අන්තර්කාලීන ආණ්ඩුවේ අගමැතිනිය ලෙස නම් කර තිබෙනවා. අගමැතිනියට අමතර ව තවත් තිදෙනෙකු භාරකාර ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයට අයත්. අන්තර්කාලීන ආණ්ඩුවක් ඇති වන්නේ බලයේ සිටි කොන්ග්‍රස්-කොමියුනිස්ට් (එක්සත් මාක්ස් ලෙනින්වාදී) සභාග ආණ්ඩුව ජන අරගලයකින් පළවා හැරීමෙන් පසුව.

ආණ්ඩුවට එරෙහි මේ ජන නැගිටීමට ආසන්න හේතුව වූයේ ආණ්ඩුව 2025 සැප්තැම්බර් 04 දින සමාජ මාධ්‍ය වේදිකා 26ක් තහනම් කිරීම. මේ සමඟ රට පුරා දිනක් දෙකක් තුළ ඇවිළී ගිය අරගලය එරට සමස්ත සමාජය ම උඩුයටිකුරු කළා. පාර්ලිමේන්තුව, අගමැති කාර්යාලය ඇතුළු රජයේ ගොඩනැගිලි පමණක් නොව ශ්‍රේෂ්ඨාධිකරණය ද ගිනිබත් කෙරුණා. දේශපාලකයන්ගේ නිවාස ද හිල්ටන් වැනි සුඛෝපභෝගී හෝටල ද ගිනිතබා විනාශ කෙරුණා. මෙහිදී ගණන් බලා ඇති සමස්ත පාඩුව නේපාල රුපියල් ට්‍රිලියන 03ක් එනම් ඩොලර් බිලියන 21.3ක් පමණ වෙනවා. කත්මණ්ඩු පෝස්ට් පත්‍රය පවසන පරිදි සිදු ව ඇති විනාශයේ වටිනාකම ආසන්න වන්නේ රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් හරි අඩකට.

මේ ජන අරගලයේ ගාමක බලය වූ තරුණයන් විශේෂයෙන් Gen Z නමින් හැඳින්වෙන පරම්පරාව උපත ලබන්නේ අන්තර්ජාලය, ස්මාර්ට් ෆෝන් හා සමාජ මාධ්‍ය බොහෝ පෙරළි කරන ලෝකයක. තාක්ෂණයේ නිපුණයන් වන ඔවුන් ස්මාර්ට් ෆෝන් හා සමාජ මාධ්‍ය නැති ලෝකයක් නොදන්නා තරම්. ඔවුන්ගෙන් සැලකිය

යුතු පිරිසකගේ ආර්ථිකය ද සමාජ මාධ්‍ය හා බැඳී පවතිනවා. එසේ ම නේපාල ජනගහනයෙන් 20%ක් පමණ රැකියාවල නිරත වන්නේ විදේශ රටවල. ඔවුන් තම ඥාතීන් සමග සබඳතා පවත්වන්නේ සමාජ මාධ්‍ය ඔස්සේ බැවින් සමාජ මාධ්‍ය තහනම් කිරීම යනු ඔවුන් මහමගට ඇද දැමීමක්.

අරගලයට ආසන්න හේතුව සමාජ මාධ්‍ය තහනම වුවත් කලක් තිස්සේ නේපාල සමාජයේ කැකෑරෙමින් පැවැති ඉහළ රැකියා වියුක්තිය, අල්ලස, දූෂණය, ඥාති සංග්‍රහය වැනි සමාජ හා ආර්ථික ප්‍රශ්න මේ විරෝධතාවලට මූලික පදනම සකසනවා. අරගලයේ කැපී පෙනෙන සටන් පාඨයක් වූයේ "සමාජ මාධ්‍ය නොව දූෂණය නවතනු" යන්න. 'දූෂණයට එරෙහි තරුණයෝ' යන්න එහිදී කැපී පෙනුණ බැනරයක්.

නේපාලය දකුණු ආසියාවේ දුප්පත් ම රටවලින් දෙවැනි තැන ගන්නා රට. එරට ආර්ථික වර්ධනය පවතින්නේ ඉතා අඩු මට්ටමක. ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් 1500කට වැඩි නැහැ. විරැකියාව ද ඉහළ අගයක් ගත්තා. ඇති නැති පරතරය මෙන් ම දූෂණය හා ඥාති සංග්‍රහය පවතින්නේ ඉතා ඉහළ මට්ටමක.

සමාජ මාධ්‍යවලින් මේවාට එරෙහි ව බලගතු විරෝධයක් ඒල්ල වෙමින් පැවතුණා. සුර සැප විඳින දේශපාලකයන්ගේ, වරප්‍රසාද ලද්දවුන්ගේ ළමයින් (Nepo Babies) ගත කරන ජීවිත හා වරප්‍රසාද නොලද්දවුන්ගේ දරුවන්ගේ ජීවිත සමාජ මාධ්‍යවල පළ කරමින් පාලකයන්ට එරෙහි ව විශාල ජනමතයක් ගොඩ නගමින් තිබුණා. සමාජ මාධ්‍යකරුවන් ව්‍යාජ හැඳුනුම්පත් භාවිත කරමින් ව්‍යාජ ප්‍රවෘත්ති හා වෛරී කතා පතුරුවන බවත් සමාජ මාධ්‍ය ඔස්සේ වංචා හා වෙනත් අපරාධ සිදු කරන බවත් යන හේතු දක්වමින් සමාජ මාධ්‍ය වේදිකා නියාමනය කිරීමට ආණ්ඩුව පෙළඹෙන්නේ මේ මෙවැනි පසුබිමක.

නේපාලයේ Gen Z පරම්පරාව විසින් මෙහෙයවන ලද අරගලය ඔවුන්ගේ අරගලයක් පමණක් නොව වැඩිහිටි කොටස් ද මේ අරගලයට සම්බන්ධ වෙනවා. එය නේපාලයේ දීර්ඝ කාලයක් මුළුල්ලේ පැවති බලගතු ආර්ථික අසමානතාවට හා මුල්බැස තිබුණු දූෂණයට ආමන්ත්‍රණය සඳහා ස්ථාපිත දේශපාලන ප්‍රජාවේ අසමත්භාවයට දුන් පිළිතුරක්. එසේ ම මේ අරගලය හුදෙක් නව පරම්පරාව පෙලඹවූ ගැටුමක් පමණක් නොව දශකයකටත් අධික කාලයක් පුරා පැවති මාඕවාදී කැරල්ලට ඉන්ධන සැපයූ නොවිසඳුන පංති ආතතියේ පිළිබිඹුවක්.

2008 වසරේදී අන්ත දූෂිත, අත්තනෝමතික රාජාණ්ඩුව පෙරළා දමා නේපාලය ජනරජයක් බවට පත් වුණත් ඉන්පසු බලයට පැමිණි කිසිදු ආණ්ඩුවක් නේපාලයේ මූලික වෙනසක් ඇති කිරීමට සමත් ව නැහැ. රාජාණ්ඩුව පෙරළා දැමීමෙන් පසු මාඕවාදී කොමියුනිස්ට් පක්ෂය ප්‍රමුඛ සභාගයක්, එය පෙරළා දැමීමෙන් පසු නේපාල කොංග්‍රසය හා පාර්ලිමේන්තුවාදී



කොමියුනිස්ට් පක්ෂය ඇතුළු සභාගයක්, යළි මාඕවාදී කොමියුනිස්ට් පක්ෂය හා පාර්ලිමේන්තුවාදී කොමියුනිස්ට් පක්ෂය ඇතුළු සභාගයක් ආදී වශයෙන් අස්ථාවර ආණ්ඩු රැසක් ඇති වූ අතර මේ කිසිවකට රටේ දැවෙන ප්‍රශ්නවලට ආමන්ත්‍රණය කිරීමට හැකි ව නැහැ. 2025 සැප්තැම්බර් ජන අරගලය වන විට බලයේ සිටියේ නේපාල කොංග්‍රසය හා පාර්ලිමේන්තුවාදී කොමියුනිස්ට් පක්ෂය ඇතුළු සභාගයක්. අගමැති වශයෙන් සිටියේ එම කොමියුනිස්ට් පක්ෂයේ නායක කේ.පී.ෂර්මා ඔලි. ඔහු සිව් වතාවක් ම අගමැති ව සිටියා. මාඕවාදී කොමියුනිස්ට් නායක පුෂ්ප කමාල් දහාල් (ප්‍රචණ්ඩා) තුන් වරක්, කොංග්‍රස් නායක ෂේර් බහදූර් ඩියුබා දෙවරක් අගමැති ධුරය දරා ඇති අතර තවත් 5 දෙනෙකු මේ කාලය තුළ අගමැති ධුරය දරා තිබෙනවා. එහෙත් නේපාල ජනයාගේ දැවෙන ප්‍රශ්නවලට ආමන්ත්‍රණය කිරීමට මේ කිසිවෙකු, කිසි පාලනයක් සමත් ව නැහැ.

නේපාලයේ මතුවුණු විරෝධතා අතර දේශපාලන අධිකාරියට පමණක් නොව එරට නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ද මතුවී ඇති විරෝධය කැපී පෙනෙනවා. පාර්ලිමේන්තුව ගිනි තැබීම, දේශපාලකයන්ට පහරදීම, දේපළ ගිනි තබා විනාශ කිරීමට එහා ගොස් මරණය අත්පත් කර දීම දක්වා ම දේශපාලන අධිකාරිය වෛරයට භාජනය වී තිබෙනවා. පවතින නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ද විරෝධය එල්ල වී තිබෙන්නේ එරට ශ්‍රේෂ්ඨාධිකරණයට ගිනි තැබීමෙන්.

ශ්‍රී ලංකාවේ හා බංගලි දේශයේ ඇතිවූ අරගලවලදී දේශපාලන අධිකාරියට ප්‍රබල විරෝධයක් මතු වුවත් නීතිමය ආයතනවලට එවැනි විරෝධයක් මතු වූයේ නැහැ. එහිදී අරගලකරුවන් අධිකරණ පද්ධති ගිනි තැබීමට කිසිවිටෙකත් පෙළඹුණේ නැහැ. එහෙත් නේපාලයේ තත්ත්වය ඊට හාත්පසින් ම වෙනස්.

ශ්‍රී ලංකාවේ ඇති වූ අරගලයට පසුකාලීන ව විවේචන එල්ල වුණේ එය අධිරාජ්‍යවාදී වුවමනා මත සිදුවූ අරගලයක් බවට. නේපාලයේ අරගලය මතුවන විට නේපාලයේ බලයේ සිටියේ මාඕවාදීන්ගේ ද සහාය ලබන වාමාංශික ආණ්ඩුවක්. එරට විරෝධය මතු වන්නේ මෙවැනි ආණ්ඩුවකට එරෙහි ව.

ශ්‍රී ලංකාවේ හා බංගලි දේශයේ පැවතියේ ධනේශ්වර පාලන තන්ත්‍ර දෙකක්. මෙයින් එක් කරුණක් පැහැදිලි ව පෙනෙනවා. ඒ, ආණ්ඩුව වාමාංශික වුවත් ධනේශ්වර වුවත් අල්ලස, දූෂණය, වංචාව, ප්‍රජාතන්ත්‍රවාදී පරිසරයට එල්ලවන බාධා තරුණ පරපුර ඉවසන්නේ නැති බව. එය ආර්ථික ප්‍රශ්නත් සමග මතු වී අරගලය වඩා තිව්‍ර කරනවා. මෙය ලෝක ප්‍රවණතාවක්. රෝස වසන්තය ලෙස උතුරු අප්‍රිකාව හා ආසියාව පුරා පැතිරී ගිය අරගලවලට ද මේ මූලික කරුණු තදින් බලපෑම් කළා. එසේ නොමැති ව අධිරාජ්‍යවාදීන්ගේ හෝ තානාපති කාර්යාලවල හෝ වුවමනා මත අරගල කැඳවා ගැනීම ලෙහෙසි කාර්යයක් නොවන අතර මතුවන අරගලවලට තානාපති කාර්යාල හෝ අධිරාජ්‍යවාදීන්ගේ හෝ මැදිහත්වීම බලාපොරොත්තු විය යුත්තක්.



# හපන්නු ජපන්නු

**නිහාල් පීරිස්**

කාලයක් තිස්සේ ජපානය රැක ගත් අපූරු ලෝක වාර්තාවක් මේ වසරේත් ඔවුන් අලුත් කර තිබෙනවා. ඒ, ලෝකයේ වයස අවුරුදු 100ට වැඩි උදවිය වැඩි ම සංඛ්‍යාවක් ජීවත් වන රට හැටියට පිහිටුවා ඇති වාර්තාව. පසුගිය වසර 55ක කාලයේ මේ පිරිස අඛණ්ඩ ව වැඩිවෙමින් සිටීමත් විශේෂත්වයක්.

2025 සැප්තැම්බර් 01 දින වන විට ජපානයේ වයස අවුරුදු 100ට වැඩි පුද්ගලයන් ගණන ලක්ෂයකට ආසන්නයි. එරට සෞඛ්‍ය අමාත්‍යාංශය මෙයට අදාළ ව නිකුත් කර තිබූ වාර්තාවකට අනුව එම සංඛ්‍යාව 99,763ක්. සෑම වසරක ම සැප්තැම්බර් 15 දින ජපානයේ වැඩිහිටියන්ගේ දිනය. සෞඛ්‍ය අමාත්‍යාංශය අදාළ වාර්තාව නිකුත් කර තිබුණේ එයට සමගාමී ව. අදාළ වසර තුළ වයස අවුරුදු 100 ඉක්මවා ගිය සියලු දෙනාට රිදී පැහැති කුසලානයක් සහ සුබ පැතීමේ ලිපියක් ද එම දිනයේදී පිරිනමනවා. ඒ, අගමැතිවරයාගේ තිළිණයක් ලෙසින්.

ජපානයේ අවුරුදු 100ට වැඩි අය අතරින් විශාල පිරිසක් කාන්තාවන් වීම ද තවත් අපූරු කාරණයක්. පුද්ගලයන් 99,763න් 88%ක් ම කාන්තාවන් බව නිකුත් කළ වාර්තාවේ දක්වෙනවා. මෙය ඉතා විශාල ප්‍රතිශතයක්. එම කාන්තාවන් සංඛ්‍යාව නිශ්චිත ව කිවහොත් 88,784ක්. වයස අවුරුදු 100ට වැඩි පිරිමින් සිටින්නේ 11,979ක්.

සාමාන්‍යයෙන් කාන්තාවන් පිරිමින්ට වඩා සෞඛ්‍යසම්පන්න ජීවිත ගත කරන බව විශ්වාස කරන්නක්. නිදසුනක් ලෙස දුම්බීම, මත්පැන් පානය වැනි සෞඛ්‍යයට අහිතකර පුරුදු ඔවුන් අතර සාපේක්ෂ ව අඩු වන අතර සෞඛ්‍යයට හිතකර ආහාර ගැනීම සම්බන්ධයෙන් ද කාන්තාවන් පිරිමින්ට වඩා සැලකිලිමත් වන බව සඳහන්. ඇතැම් ජානමය සාධක ද කාන්තාවන් වැඩි ආයුෂ භුක්ති විඳීමට හේතු වෙනවා.

මේ වනවිට ජපානයේ සිටින වියපත් ම පුද්ගලයා ද කාන්තාවක්. ෂිගෙකො කගාවා නැමැති ඇයගේ වයස අවුරුදු 114ක්. ඇය උපත ලබා ඇත්තේ 1911 මැයි 28 දින. කලෙකට පෙර කගාවා රැකියාව කර තිබුණේ වෛද්‍යවරියක ලෙස. ඇය මේ ආකාරයෙන් දීර්ඝායුෂ ලැබීමේ රහස කුමක්දැයි වරක් ඇයගෙන් විමසූ විට කගාවා දී තිබුණේ මෙවැනි පිළිතුරක්.

"මම වෛද්‍යවරියක ලෙස වැඩ කළ කාලයේ දැන් තරම් මෝටර් රථ තිබුණේ නැහැ. ඒ නිසා මම ලෙඩුන් බලන්න යනකොට ලී සෙරෙප්පු දාගෙන බොහෝ දුර පයින් යනවා. මම අද ශක්තිමත් ව සහ නිරෝගී ව ඉන්න ඒක හේතුවක් වෙන්න ඇති. අනික මම හැමදාම වගේ ක්‍රීඩා කළා. මගේ ශක්තිය තමයි මගේ ලොකු ම වත්කම". ඇය ග්‍රාමීය ප්‍රදේශවල රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා ඉතා දුෂ්කර මාර්ගවල මේ ආකාරයෙන් පයින් ගමන් කර ඇති බව සඳහන්. එමෙන් ම කගාවා දිනකට කුඩා, සමබල ආහාර වේල් තුනක් අනුභව කරන බව ද පැවසෙනවා. නින්ද ගැන ද ඇය බෙහෙවින් සැලකිලිමත් වන අතර

නිශ්චිත වේලාවක නින්දට යාමටත් නිශ්චිත වේලාවක අවදි වීමටත් ඇය පුරුදු වී සිටිනවා.

ජපානයේ ජනතාව දීර්ඝායුෂ භුක්ති විඳින ජනතාවක් බව දිගු කලෙක සිට ම ප්‍රසිද්ධ කාරණයක්. ඔවුන් මෙලෙස දීර්ඝායුෂ ලැබීමට හේතුව කුමක් ද? මෙය කුතුහලය දනවන කාරණයක් බව කිව යුතු නැහැ.
ඇතැම් විශේෂඥයන් පවසන්නේ ජානමය සාධක මෙයට ප්‍රධාන හේතුවක් බව. සාමාන්‍යයෙන් ජපන් ජාතිකයන්ගේ රුධිරයේ එච්.ඩී.එල් (HDL) කොලස්ටරෝල් හෙවත් හොඳ කොලස්ටරෝල් වැඩි ප්‍රමාණයක් අඩංගු වන බව ද පර්යේෂණවලින් අනාවරණය වී තිබෙනවා. මේ කොලස්ටරෝල් ප්‍රමාණය වැඩි වූ විට කෙනෙකු හෘද රෝග ආදියට ගොදුරු වීමේ අවදානම අඩුයි. ජපානයේ වියපත් ජනතාව අතර හෘද රෝග අඩු වීමට මෙය ප්‍රධාන හේතුවක් විය හැකි බව පිළිගැනෙන්නක්.

ෆොක්සෝ 3 (FOXO 3) නැමැති ජානයක් ද ජපාන ජාතිකයන්ගේ දීර්ඝායුෂට හේතුවක් ලෙස විශ්වාස කෙරෙනවා. එරට දීර්ඝායුෂ භුක්ති විඳින පිරිස් වැඩිපුර ජීවත්වන ප්‍රදේශ ආශ්‍රිත ව කරන ලද පර්යේෂණයකින් හෙළි වී තිබෙනවා අපූරු කාරණයක්. එනම් එම ප්‍රදේශවල බොහෝ දෙනෙකුට ෆොක්සෝ 3 ජානය දක්නට ලැබෙනවා. 'දීර්ඝායු ජානය' යනුවෙන් ද හැඳින්වෙන මෙය කෙනෙකු වයසට යාමේදී ඇති වන රෝගාබාධවලින් මෙන් ම මානසික ආතතිය වැනි තත්වයන්ගෙන් ද ආරක්ෂා කිරීමට සමත් බව සඳහන්.

මෙවැනි ජානමය සාධකවලට අමතර ව ජපාන ජාතිකයන් දීර්ඝායුෂ විඳීමට හේතුවක් වන්නේ ඔවුන් ගන්නා ආහාර. ජපානයේ උදවිය එළවළු, පලතුරු, මාළු, මුහුදු පැළෑටි ආදිය විශාල වශයෙන් ආහාරයට ගන්නවා. මේවා ඉතා සෞඛ්‍යසම්පන්න ආහාර බව කිව යුතු නැහැ. විශේෂයෙන් මාළුවල ඇති ඔමේගා 3 නැමැති හිතකර මේදය හෘද රෝග ආදිය වැළැක්වීමට බෙහෙවින් උපකාරී වන බව විශ්වාස කෙරෙන කාරණයක්.

ජපාන ජාතිකයන් වයසට ගියත් බොහෝදුරට ක්‍රියාශීලී ජීවිත ගත කිරීමට පුරුදු වී සිටිනවා. ඇවිදීම, ගෙවතු වගාව වැනි කටයුතුවල නිරතවීම, නිතර ව්‍යායාම කිරීම එවැනි පුරුදු. මහලු පිරිස් ඉලක්ක කරගත් ව්‍යායාම වැඩසටහන් එරට රූපවාහිනී නාලිකාවලින් ද දිනපතා විකාශය වෙනවා. එවැනි උදවිය කණ්ඩායම් වශයෙන් එක් වී මේවාට අනුව ව්‍යායාම කිරීමට හුරුව සිටින බව සඳහන්.






ජපාන ජාතිකයන් සමාජශීලී ජීවිත ගත කිරීමටත් දක්වන්නේ වැඩි කැමැත්තක්. මේ නිසා තනිකම, පාළුව වැනි සෘණාත්මක මානසික තත්ත්වයන්ට ඔවුන් ගොදුරු වන්නේ අඩුවෙන්. බොහෝදෙනා සමාජ සේවා කටයුතු ආදියටත් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන බව පැවසෙනවා. මේ නිසා 'සමාජයට තමන්ගෙන් යමක් ඉටු වෙනවා ය' යනුවෙන් ඇති වන හැඟීමත් ඔවුන්ට මානසික තෘප්තියක් ගෙන දෙන්නක්.

ජපානයේ ජනතාව මේ ආකාරයෙන් දීර්ඝායුෂ විඳීම ගෞරවනීය තත්ත්වයක් වුවත් එරට මහලු ජනගහනය වැඩි වීම සහ තරුණ ජනගහනය අඩු වීමේ තර්ජනයක් මතු ව තිබීම ජපානයට ආර්ථික වශයෙන් ගැටලු ඇති කරන කාරණයක් බවට පත් ව තිබෙනවා. කාලයක සිට ම ජපානයේ උපත් අනුපාතය අඩු වෙමින් ඇති අතර මෙය බලපා තිබෙන්නේ තරුණ ජනගහනය අඩුවීමට. මෙයින් සිදුවන්නේ එරට ශ්‍රම බලකායට එක්වන පිරිස අඩුවීම. අනෙක් අතට වැඩි වන මහලු ජනගහනය රැකබලා ගැනීම සඳහා ද විශාල වියදමක් දරන්නට සිදු වෙනවා. මේ තත්ත්වය ආර්ථිකය මත විශාල පීඩනයක් ඇති කරන්නක්.

මෙවැනි අර්බුදකාරී පසුබිමක ජපානයේ උපත් අනුපාතය වැඩි කරගැනීම අරමුණු කරගෙන එරට රජය කාලයක සිට ම විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටියත් ඒවායින් අපේක්ෂා කළ තරම් ප්‍රතිඵලයක් ලැබී නැහැ. තරුණ අඹුසැමියන් දරුවන් හැදීමට දක්වන මැළිකම මේ තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපා තිබෙනවා. එයට වැඩි වශයෙන් ම හේතු වී ඇත්තේ දරුවන් ලොකු මහත් කිරීම සඳහා විශාල වියදමක් දරන්නට සිදුවීම, රැකියාවල පීඩනය ආදිය.

ශිගෙකො කගාවා



# සාමයේ සුබ ලකුණු ?



**සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි**

ඩොනල්ඩ් ට්‍රම්ප් "තමන් සියලු ලෝක යුද්ධ නතර කරන සාමයේ කුමරා බවට පත්වන බව" කියා තිබුණේ ඔහු දෙවැනි වර බලයට පැමිණීමට බොහෝ කලකට පෙර සිට. එම ප්‍රකාශයට වඩාත් ශක්තියක් ලබාදෙන ක්‍රියාවලියක් ආරම්භ වී තිබෙනවා. ඒ, වසර දෙකක් තිස්සේ ඇවිළ ගිය කුරිරු පලස්තීන-ඊශ්‍රායල ගැටුම සඳහා සාමයේ සුබ ලකුණු පහළ වීමත් සමඟ.

හමාස් සහ ඊශ්‍රායලයේ නියෝජිතයන්, මැදිහත්කරුවන් සමඟ එක් ව ඊජිප්තුවේදී සාකච්ඡා සඳහා රැස්වුණා. හමාස් දූත පිරිස මෙහෙයවන්නේ කටාර්හිදී ඊශ්‍රායලය විසින් ඝාතන උත්සාහයකට ලක් කරන ලද සාකච්ඡා කණ්ඩායමේ ප්‍රධානියා වන කලීල් අල්-හයියා බව දැනුම් දී තිබුණා. මෙලෙස යුද්ධය අවසන් කිරීම පිළිබඳ වක්‍ර සාකච්ඡා ඊජිප්තුවේදී ආරම්භ වී ඇති නමුත් ගාසා තීරයට එල්ල කරන ඊශ්‍රායල ප්‍රහාර දිගට ම පැවතුණා. ඩොනල්ඩ් ට්‍රම්ප්, ඊශ්‍රායලයෙන් බෝම්බ හෙළීම නතර කරන ලෙස ඉල්ලා සිටි දින සිට ඊශ්‍රායල හමුදා ගාසා තීරයේ අවම වශයෙන් පුද්ගලයන් 104 දෙනෙකු ඝාතනය කර තිබෙනවා.

ග්‍රේටා තුන්බර්ග් ඇතුළු පලස්තීන ආධාර රැගෙන ගිය 'ග්ලෝබල් සුමුඩ් ෆ්ලෝටිලා' ක්‍රියාකාරීන් 171 දෙනෙකු ඊශ්‍රායලය පිටුවහල් කර තිබෙනවා. ගාසා තීරයට යන ආධාර බලඇණියේ රුඳවියන්ට ඊශ්‍රායල අත්අඩංගුවේ සිටියදී අයුතු ලෙස සැලකූ බවත් මූලික අයිතිවාසිකම් අහිමි වූ බවත් නීතිඥයන් පැවසුවා.

හමාස් කණ්ඩායම ඊශ්‍රායල ප්‍රාණ ඇපකරුවන් නිදහස් කිරීම සඳහා ට්‍රම්ප්ගේ කොන්දේසි සහ ගාසා තීරයේ පාලනය පලස්තීන තාක්ෂණවේදීන්ට පැවරීමේ අදහස පිළිගෙන තිබුණත් ඔහුගේ කොන්දේසි මාලාවට අයත් කරුණු 20කින් යුත් යෝජනාවේ තවත් බොහෝ අංගවලට පැහැදිලි ප්‍රතිචාරයක් ලබා දී තිබුණේ නැහැ. නිවේදනයක් නිකුත් කරමින් එම කණ්ඩායම පැවසුවේ ජනාධිපති ට්‍රම්ප්ගේ යෝජනාවේ අඩංගු හුවමාරු සූත්‍රයට අනුව, හුවමාරු සඳහා නිසි කොන්දේසි සපුරා ඇත්නම් ජීවත් ව සිටින සහ මියගිය සියලු ම ඊශ්‍රායල සිරකරුවන් නිදහස් කිරීමට තමන් එකඟ වූ බව. එහෙත් ගාසා තීරයේ අනාගතය සහ පලස්තීනුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ අනෙකුත් කරුණු සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා කිරීමට අවශ්‍ය බව පෙනෙන අතර ඒවා තවමත් තමන් අතර සාකච්ඡා කෙරෙමින් පවතින බවයි හමාස් කණ්ඩායම පවසන්නේ.

ඒ අනුව හමාස් ප්‍රකාශයේ ට්‍රම්ප්ගේ කරුණු 20 සැලැස්ම ගැන විශේෂයෙන් සඳහන් කර හෝ පිළිගෙන හෝ නොමැති නමුත් 'පලස්තීන ජාතික එකඟතාව සහ අරාබි හා ඉස්ලාමීය සහයෝගය මත පදනම් ව ගාසා තීරයේ පරිපාලනය ස්වාධීන පලස්තීන ආයතනයකට (තාක්ෂණවේදීන්) පැවරීමේ සිය ගිවිසුම අලුත් කරන' බව ඔවුන් කියා තිබුණා.

මේ ඓතිහාසික නිවේදනය නිකුත් වූයේ සාම සැලැස්ම පිළිගැනීමට හෝ 'සියලු අපා දුකට' මුහුණදීමට සූදානම් වන්නැයි ඩොනල්ඩ් ට්‍රම්ප් හමාස් සංවිධානයට දිනයක් ලබා දීමෙන් පැය කිහිපයකට පසුව. කිරා මැන බලා ඉදිරිපත් කර තිබූ හමාස් පිළිතුර ප්‍රකාශයට පත් වීමත් සමඟ ට්‍රම්ප් සිය සමාජ මාධ්‍ය වේදිකාව මත ලියුවේ හමාස් සංවිධානය සාමයට සූදානම් බව තමා විශ්වාස කරන බවත් ගාසා තීරයට බෝම්බ හෙළීම නතර කරන ලෙස ඊශ්‍රායලයෙන් ඉල්ලා සිටින බවත්. එහෙත් ඊශ්‍රායලය බෝම්බ හෙළීම සහ ප්‍රහාර නවතා නැහැ. අන්තිම පලස්තීනුවාත් අතුගා දමන තුරු සිය ප්‍රහාර නිම නොකරන බවයි ඔවුන් කියා ඇත්තේ.

හමාස් සංවිධානයේ ප්‍රතිචාරය ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් සාදරයෙන් පිළිගත් බව පෙනී යාමත් සමඟ ගාසා තීරයේ ජනතාව කම්පනයෙන් යුතු ව ප්‍රතිචාර දක්වා තිබෙනවා. දැනටමත් මිහිපිට අපා දුක් විඳිමින් සිය භූමිය සහ ජීවිත අයිතිය ද අහිමි ව සමූල ඝාතනයකට මුහුණ දී සිටින පලස්තීනුවන්ට මෙය සහනදායී ලෙස දැනීම අරුමයක් නොවෙයි.

හමාස් මෙහිදී උගුලකට හසු වී ඇති බවටත් ඊශ්‍රායලය තම ප්‍රාණ ඇපකරුවන් නැවත ලබා ගන්නේ යුද්ධය නැවත ආරම්භ කිරීම සඳහා පමණක් බවටත් ඇතමුන් බිය පළ කළා. තවත් අය විශ්වාස කරන්නේ වසර දෙකක ගැටුම අවසන් කිරීමට දැන් ඓතිහාසික අවස්ථාවක් විවෘත වී ඇති බව. කෙසේ වෙතත් හමාස් ප්‍රකාශයේ, සැලැස්මේ ප්‍රධාන ඉල්ලීම්වලින් එකක් ගැන කිසිදු සඳහනක් නැහැ. ඒ, හමාස් සංවිධානය නිරායුධ කිරීමකට එකඟ වීම සහ ගාසා

තීරයේ පාලනය තුළ තවදුරටත් ඔවුන් කිසිදු කාර්යභාරයක් ඉටු නොකිරීම යන කාරණා.

සාම සැලැස්මෙන් සටන් වහා ම අවසන් කිරීමට සහ හමාස් රඳවාගෙන සිටින ජීවමාන ඊශ්‍රායල ප්‍රාණ ඇපකරුවන් 20 දෙනෙකු මෙන් ම මියගිය බවට සැලකෙන ප්‍රාණ ඇපකරුවන්ගේ දේහ පැය 72ක් ඇතුළත නිදහස් කිරීමට යෝජනා කරනවා. ඒ, රඳවාගෙන සිටින ගාසා වැසියන් සිය ගණනක් වෙනුවෙන්. සන්නද්ධ කණ්ඩායම පලස්තීන භූමියේ තවමත් ප්‍රාණ ඇපකරුවන් 48 දෙනෙකු රඳවාගෙන සිටින බවට විශ්වාස කෙරෙන අතර ඔවුන්ගෙන් 20 දෙනෙකු පමණක් ජීවතුන් අතර සිටින බවටයි සැලකෙන්නේ. යෝජනාවට දෙපාර්ශ්වය ම එකඟ වූ පසු 'පූර්ණ ආධාර වහා ම ගාසා තීරයට යවනු ලැබේ' යන්න ද සැලැස්මේ සඳහන්. එක්සත් ජනපද නව සැලැස්ම යටතේ, ගාසා තීරය පාලනය කිරීමේදී හමාස්ට කිසිදු කාර්යභාරයක් නොමැති අතර එය අවසාන පලස්තීන රාජ්‍යයක් සඳහා දොර විවෘත කරනවා.

ට්‍රම්ප් සහ ඊශ්‍රායල අගමැති නෙතන්යාහු එක් ව සැලැස්ම ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, නෙතන්යාහු පලස්තීන රාජ්‍යයකට ඔහුගේ දිගුකාලීන විරෝධය නැවත ප්‍රකාශ කළ අතර වීඩියෝ ප්‍රකාශයකින් පැවසුවේ "එය ගිවිසුමේ ලියා නැත. අපි පලස්තීන රාජ්‍යයකට දැඩි ලෙස විරුද්ධ වන බව කල් තියා ම පැවසුවෙමු." යනුවෙන්. ගාසා තීරයේ අනාගතය සහ පලස්තීන ජනතාවගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන යෝජනා තවමත් 'ජාතික රාමුවක් තුළ' සාකච්ඡා කෙරෙන බවත් හමාස් ඒ තාවකාලික රජයේ කොටසක් වනු ඇති බවත් හමාස් ප්‍රකාශයේ සඳහන් වෙනවා.

මේ සාම පියවර හදිසියේ ඇරඹුණක්. ඒ සඳහා ආසන්නතම හේතුව වූයේ ලෝකයේ රාජ්‍ය බහුතරයක් පලස්තීනය ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගැනීම. නොබෝද පැවැති එක්සත් ජාතීන්ගේ 80 වැනි මහා මණ්ඩල සැසිවාරය අතරතුරදී සියවසක් පැරණි ඊශ්‍රායල-පලස්තීන අර්බුද ඉතිහාසයේ වැදගත් පියවරක් සටහන් කළා. ඒ, ප්‍රංශය ඇතුළු රටවල් 6ක් පලස්තීනයේ ස්වාධීනත්වය නිල වශයෙන් පිළිගැනීමත් සමඟ.

ගාසා තීරයේ තත්ත්වය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ විමර්ශන කොමිසම විශේෂ ප්‍රකාශයක් සිදු කළා. ඒ, ගාසා තීරයේ පලස්තීනුවන්ට එරෙහි ව ඊශ්‍රායලය ජන සංහාරයක් සිදුකර ඇති බවට චෝදනා කරමින්. 2023 වසරේදී හමාස් සමඟ යුද්ධය ආරම්භ වූ දින සිට ජාත්‍යන්තර නීතිය යටතේ අර්ථ දක්වා ඇති ජන සංහාරක ක්‍රියා 4/5ක් ඊශ්‍රායලය සිදු කර ඇති බවට නිගමනය කිරීමට සාධාරණ හේතු ඇති බවයි එක්සත් ජාතීන්ගේ විමර්ශන කොමිසම පවසන්නේ.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරය ආරම්භ වීමට පෙර බටහිර බලවතුන් වන ඕස්ට්‍රේලියාව, බ්‍රිතාන්‍යය, කැනඩාව සහ පෘතුගාලය සැප්තැම්බර් 21 දින නිල වශයෙන් පලස්තීනය රාජ්‍යයක් පිළිගත් බවට නිවේදනය කර තිබුණා. සැසියේදී ප්‍රංශයට අමතර ව ඇන්ඩෝරා, බෙල්ජියම, ලක්සම්බර්ග්, මෝල්ටාව සහ මොනාකෝ රාජ්‍යය ද ඒ බව පිළිගත්තා. එම අවස්ථාවේදී ඇමරිකා සහ ඊශ්‍රායල නියෝජිතයන් සැසිවාරය මඟ හැර ගිය බව ද වාර්තා වුණා.

මේ අනුව දැනට එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් 193න් 75%ක් පමණ පලස්තීන රාජ්‍යය පිළිගෙන තිබෙනවා. එහෙත් පලස්තීනයට ජාත්‍යන්තර ව එකඟ වූ සීමා, වත්කම් සහ හමුදාවක් නැහැ. මේ නිසා පලස්තීන රාජ්‍යය පිළිගැනීම බොහෝදුරට සංකේතාත්මක ව පමණක් සිදු කෙරුණක්.

මේ අර්බුදය සඳහා ලොව සෙසු රටවල් පිළිගෙන ඇති විසඳුම වන ස්වාධීන ද්වි රාජ්‍ය සංකල්පයට එරෙහි වන ඊශ්‍රායලය දැනටමත් එය අසාර්ථක කිරිම සඳහා බටහිර ඉවුරේ ජනාවාසකරණය කඩිනම් කර තිබෙනවා. මිලියන 2.7ක පලස්තීනුවන්ට නිවහන වන ඊශ්‍රායල වාඩි ලා සිටින බටහිර ඉවුර තුළ පලස්තින ජනතාව විසිරි යන ලෙස සබඳතා කඩා දමමින්, ඔවුන් හුදෙකලා කරමින් මේ ජනාවස බිහි කරමින් තිබෙනවා. පලස්තීනුවන්ට ඉතිරි ව ඇති ඉඩම් ප්‍රමාණය අඩු වී ඇති අතර ඔවුන්ගේ නගර අතර සබඳතා එකිනෙකාගෙන් වෙන් කර තිබෙනවා.

මේ අතර ප්‍රංශය ඇතුළු ප්‍රබල රටවල් 4ක් පලස්තීනය ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගැනීම ඊශ්‍රායලයේ අගමැති බෙන්ජමින් නෙතන්යාහුගේ දැඩි කෝපයට හේතු වුණා. මේ පිළිගැනීම තරයේ ම ප්‍රතික්ෂේප කරන නෙතන්යාහු ජෝර්දාන ගංගාවෙන් ඔබ්බට කිසිදු පලස්තීන රාජ්‍යයක් සඳහා ඉඩ නොමැති බව කියා තිබුණා. "ස්වාධීන පලස්තීනයක් කිසිදාක බිහිවෙන්නේ නැහැ. මා ඇමරිකා සංචාරය අවසන් කර පැමිණීමෙන් පසු අපගේ භූමියේ ත්‍රස්තවාදීන්ගේ රාජ්‍යයක් බිහි කිරීමට උත්සාහ ගන්නා සියලු පාර්ශ්වලට නිසි පිළිතුරු ලබා දෙනවා" යැයි ඔහු කියා තිබුණා. එසේ ම ඊශ්‍රායලය යුද්ධය තීරණාත්මක අවධියක සිටින බවත් ඔහුගේ රජය හමාස්හි ඉතිරි ව ඇති අවසාන බලකොටුවක් ලෙස ගාසා නගරය සලකන බවත් කියා තිබුණා.

එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් සංවිධාන අනතුරු අඟවා තිබෙන්නේ මේ ආක්‍රමණය හේතුවෙන් නිල වශයෙන් සාගතයෙන් පෙළෙන බව ප්‍රකාශ කර ඇති ගාසා තීරයේ සමහර කොටස්වල තත්ත්වය වඩාත් විනාශකාරී විය හැකි බව. ගාසා නගරය තුළ සහ ඒ අවට ප්‍රදේශයේ ජනගහනයෙන් අඩකට ආසන්න ව හෙවත් මිලියනයක පමණ ජනතාවක් ජීවත් වෙනවා. ඊශ්‍රායලය ප්‍රාදේශීය ජනයාට ඉවත් වන ලෙස බල කිරීමට උත්සාහ කර ඇතත් මේ වන විට ජනතාවගෙන් පිට ව ගොස් ඇත්තේ 40%ක පමණ පිරිසක්.

ගාසා තීරයේ තත්ත්වය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ විමර්ශන කොමිසම විශේෂ ප්‍රකාශයක් සිදු කළා. ඒ, ගාසා තීරයේ පලස්තීනුවන්ට එරෙහි ව ඊශ්‍රායලය ජන සංහාරයක් සිදුකර ඇති බවට චෝදනා කරමින්. 2023 වසරේදී හමාස් සමඟ යුද්ධය ආරම්භ වූ දින සිට ජාත්‍යන්තර නීතිය යටතේ අර්ථ දක්වා ඇති ජන සංහාරක ක්‍රියා 4/5ක් ඊශ්‍රායලය සිදු කර ඇති බවට නිගමනය කිරීමට සාධාරණ හේතු ඇති බවයි එක්සත් ජාතීන්ගේ විමර්ශන කොමිසම පවසන්නේ. ඒ අනුව කණ්ඩායමක සාමාජිකයන් ඝාතනය කිරීම, ඔවුන්ට බරපතළ ශාරීරික හා මානසික හානියක් සිදු කිරීම, කණ්ඩායම විනාශ කිරීමට සැලසුම් කළ කොන්දේසි හිතාමතා ම ඇති කිරීම සහ දරු උපත් වැළැක්වීම යන කරුණු සංහාරක අභිප්‍රාය පිළිබඳ සාක්ෂි ලෙස අදාළ වාර්තා උපුටා දක්වා තිබෙනවා.




# රට සල්ලි සොයන මුල් තැන

දීප්ත කුමාර බටගොඩ

ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ආදායම රඳා පවතින්නේ සංචාරක කර්මාන්තය, විදේශ ආයෝජන, අපනයන සහ විදේශ ප්‍රේෂණ මත. නොබෝදා ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ නවතම දත්ත වාර්තාවල දැක්වෙන්නේ විදේශගත ව සිටින ශ්‍රී ලාංකිකයන් පසුගිය සැප්තැම්බර් මාසයේදී මෙරටට ඇමරිකානු ඩොලර් මිලියන 695.7ක මුදල් ප්‍රමාණයක් එවා ඇති බවත් එය පසුගිය වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂ ව සියයට 25.2ක වර්ධනයක් බවත්. මේ තත්ත්වය විමසුමට ලක් කරමින් ඊට සෘජු ව මැදිහත්වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්යභාරය ඇසුරින් මෙවර කවරයේ කතාව සැකසෙනවා.



ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්ති ප්‍රවර්ධනය, ඔවුන්ගේ සුභ සාධනය සහ ආරක්ෂාව යනාදී කාරණා සම්බන්ධ නිල ආයතනය විදේශ සේවා නියුක්ති කාර්යාංශය. මේ කාර්ය සෘජු ව ම ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රේෂණ තීරණය වීමට බලපානවා.

1994 අංක 04 හා 2009 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1985 අංක 21 දරන පාර්ලිමේන්තු පනත යටතේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ස්ථාපිත කර තිබෙනවා. විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ ආරම්භය පිළිබඳ පවසන සභාපති කෝසල වික්‍රමසිංහ; "1985 වර්ෂයට පෙර ශ්‍රී ලංකාවේ විදේශ රැකියා සඳහා පිටත් වීම අවිධිමත් ආකාරයටයි සිදු වුණේ. නමුත් ඒ වන විට එය කර්මාන්තයක් ලෙස වර්ධනය කළ හැකි මට්ටමක පැවතුණා. අසංවිධිත බව හේතුවෙන් විවිධ ගැටලු රාශියකට ද විදේශ නියුක්තිකයන් මුහුණපාමින් තිබුණා. මේ නිසා එවක විදේශ රැකියා කර්මාන්තය දියුණු මට්ටමක පැවතුණු පිලිපීන රාජ්‍යයේ විදේශ රැකියා ක්‍රමවේදය අධ්‍යයනය කර, ඒ අනුව යමින් ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය ස්ථාපිත කෙරුණා"


ඕනෑ ම රටක විදේශ රැකියා කර්මාන්තය වාසිදායක තත්ත්ව මෙන් ම අවාසිදායක තත්ත්ව ද නිර්මාණය කළ හැකියි. විදේශ විනිමය ලැබීම, මානව ප්‍රාග්ධනයේ වර්ධනයක් ඇති වීම හා රටේ සේවා වියුක්ති ගැටලුවට විසඳුම් ලැබීම යනාදිය

වාසිදායක තත්ත්ව. රටේ නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය ශ්‍රම බලකායේ ගුණාත්වය හා ප්‍රමාණාත්මක බව පිළිබඳ ගැටලු, විදේශ රැකියා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ආරක්ෂාව හා සුභ සාධනය පිළිබඳ ගැටලු ඇතිවීම නිර්මාණය කරන්නේ කිසියම් ආකාරයක අවාසිසහගත තත්ත්වයක්. උදාහරණ වශයෙන් කුඩා දරුවන්ගේ මව්වරුන් විදේශගත වීම නිසා එය දරුවාගේ සංවර්ධනයට බලපෑම් කිරීම, රැකවරණ ගැටලු හා අනාරක්ෂිත බවක් නිර්මාණය වීම සමාජයීය ගැටලුක් බවට පත්වීමට පුළුවන්.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය බිහි වන්නේ පවතින වාසිසහගත තත්ත්ව උපරිම කරන අතරතුර ම අවාසිසහගත තත්ත්ව අවම කරමින් විදේශ රැකියා අංශය රටේ සංවර්ධනයට හිතකර කර්මාන්තයක් ලෙස දියුණු කිරීමේ අපේක්ෂාවෙන් බව මේ අනුව පෙනී යනවා.

විදේශ සේවා නියුක්ති කාර්යාංශය පිහිටුවීමේ පනත අනුව එහි තිබෙන්නේ ආරම්භක ප්‍රධාන අරමුණු තුනක්. විදේශ රැකියා ක්ෂේත්‍රය නියාමනය හා පහසුකම් සැපයීම, ශ්‍රී ලංකාවෙන් පිටත සේවයේ නියුතු ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ආරක්ෂාව හා සුබ සාධනය සැලසීම, ශ්‍රී ලාංකිකයන් සඳහා එතෙර රැකියා අවස්ථා ඉහළ නංවා ගැනීම හා සංවර්ධනය කිරීම එම අරමුණු.

විදේශ සේවා නියුක්ති කාර්යාංශය පිහිටුවීමේ පනත අනුව එහි තිබෙන්නේ ආරම්භක ප්‍රධාන අරමුණු තුනක්. විදේශ රැකියා ක්ෂේත්‍රය නියාමනය හා පහසුකම් සැපයීම, ශ්‍රී ලංකාවෙන් පිටත සේවයේ නියුතු ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ආරක්ෂාව හා සුභ සාධනය සැලසීම, ශ්‍රී ලාංකිකයන් සඳහා එතෙර රැකියා අවස්ථා ඉහළ නංවා ගැනීම හා සංවර්ධනය කිරීම එම අරමුණු.




මුල් කාල වකවානුවේදී, කාර්යාංශය වැඩි අවධානය යොමු කර තිබෙන්නේ ලියාපදිංචිය ලබා ගත් බලපත්‍රලාභී ආයතන සඳහා ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ හා ප්‍රමිති සැකසීම කෙරෙහි. එහෙත් පසුකාලීන ව එය විදේශවල රැකියා අපේක්ෂා කරන ශ්‍රී ලාංකිකයන්ගේ අභිමානය, ආරක්ෂාව හා සමානාත්මතාව යන කොන්දේසි යටතේ සංක්‍රමණය සහතික කරන ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා නීතීමය රාමුවක් යටතේ ස්ථාපිත පුළුල් විෂය පථයකින් යුත් ආයතනයක් බවට පත් ව තිබෙනවා.

## විදේශ රැකියා ප්‍රවර්ධනය

රටක් විදේශ රැකියා ප්‍රවර්ධනය සිදු කරන්නේ ආර්ථිකයේ පැවැත්ම හා ස්ථාවරත්වයට එමගින් සිදු කරන දායකත්වය නිසා. විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකා සාර්ව ආර්ථිකයේ පැවැත්ම සඳහා විදේශ රැකියා සිදු කරන දායකත්වය නොසලකා හරින්නට බැහැ. සේවා වියුක්තිය හා දරිද්‍රතාව සඳහා විසඳුමක් ලෙසින් ද රටේ දළ නිල සංචිත ඉහළ නැංවීමට ද මානව ප්‍රාග්ධනයේ වර්ධනයට ද විදේශ රැකියා ධනාත්මක ව බලපෑම් කරනවා.

## සේවා වියුක්තිය, දරිද්‍රතාව අවම කිරීම

සේවා වියුක්තිය, දරිද්‍රතාව අතර පවතින්නේ අවියෝජනීය සබඳතාවක්. සේවා වියුක්තිය ඉහළ යන විට රටක දරිද්‍රතාවේ ඉහළ යාම නොවැළැක්විය හැකි තත්ත්වයක්. මේ නිසා සේවා වියුක්තිය අවම කිරීම සඳහා ඕනෑ ම රටක් පෙළඹෙන්නේ ඒමගින් දරිද්‍රතාවේ ද අවම වීමක් සිදුවන බැවින්. එසේ ම උද්ධමනකාරී තත්ත්වයකදී ද රටක ක්ෂණික ව දරිද්‍රතාවේ ඉහළ යාමක් සිදු විය හැක්කේ එමගින් සේවා නියුක්තිකයන්ගේ මූර්ත ආදායම ද අවම වීම හේතුවෙන්. මේ නිසා රටේ ශ්‍රමබලකාය පූර්ණ වශයෙන් එම රටේ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශෝෂණය කර ගැනීමට නොහැකි වන විටත් දැඩි උද්ධමනකාරී තත්ත්වය හේතුවෙන් සේවා නියුක්තිකයන්ගේ මූර්ත ආදායම පහළ යන විටත් රටින් පිටත විදේශ රැකියා සඳහා රටේ ඉල්ලුමක් ඇති වීම (විදේශ රැකියා සඳහා ශ්‍රම සැපයුමක් ජනිත වීම) සිදු විය හැකියි. මේ නිසා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීමේ විවිධ වැඩසටහන්වලට යොමු ව තිබෙනවා.

ශ්‍රී ලංකාවේ මෑතකාලීන ව සිදු වූ දැඩි ආර්ථික අර්බුදයත් කොවිඩ් 19 වසංගතයත් සමඟ සේවා වියුක්තියේ ඉහළ යාමක් මෙන් ම ඉහළ දරිද්‍රතාවක් ද පෙන්නුම් කළා. උද්ධමනය සියයට 71ක් වැනි ඉහළ අගයක් වාර්තා කළ අතර ශ්‍රී ලාංකිකයන් හතර දෙනෙකුගෙන් එක් අයෙකු (එවක සියයට 26ක් පමණ) දරිද්‍රතාවෙන් පෙළෙන බව ලෝක බැංකුව වාර්තා කර තිබුණා. මේ නිසා අර්බුද කාලයෙන් පසුව ශ්‍රී ලාංකිකයන් විදේශ රැකියා සොයා යාමේ ඉහළ ප්‍රවණතාවක් දැකිය හැකි වුණා. 2021 වර්ෂයේ 122,905ක් වූ විදේශ රැකියා සඳහා ලියාපදිංචි වීම 2022 වර්ෂය වන විට 310,948ක් දක්වා වර්ධනය වී තිබුණා. ඉන්පසු වසරවලදීත් සාමාන්‍යයෙන් ලක්ෂ තුනකට ආසන්න පිරිසක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී තිබුණා. 2025 ඔක්තෝබර් මාසය වන විටත් ලක්ෂ දෙක හමාරකට ආසන්න පිරිසක් විදේශ රැකියා සඳහා ලියාපදිංචි වී තිබූ අතර වර්ෂය අවසානය වන විට එය ලක්ෂ තුනක් පමණ වනු ඇතැයි විදේශ සේවා නියුක්ති කාර්යාංශය පවසනවා.

රැකියා සඳහා විදේශගත වන ඉහළ පිරිසක් ගෘහාශ්‍රිත රැකියා සහ පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන්. 2021 සිට 2025 සැප්තැම්බර් දක්වා විදේශගත වූ පුද්ගලයන්ගෙන් සියයට 83ක් පමණ අයත් වන්නේ මේ කාණ්ඩයට. විදේශ සේවා නියුක්ති කාර්යාංශය මේ වන විට විදේශගත වන ශ්‍රමිකයන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම මෙන් ම දැනුවත් කිරීමේ වැඩසටහන් ශ්‍රී ලංකාවේ පුහුණු මධ්‍යස්ථාන 11ක සිදු කළත් තවමත් නුපුහුණු හෝ අඩු පුහුණු හෝ ශ්‍රමිකයන් විශාල සංඛ්‍යාවක් රැකියා සඳහා විදේශගත වෙනවා. කෙසේ වුවත් 2021 වර්ෂයට සාපේක්ෂ ව පසුකාලීන ව වාර්තා කරන්නේ නුපුහුණු ශ්‍රමිකයන්ගේ සුළු අඩුවීමක්. වෘත්තිකයන් විදේශගත වීමේ යම් ප්‍රවණතාවක් ද පෙන්නුම් කරන අතර එය අඛණ්ඩ ව ඉදිරියටත් සිදු වීම ආර්ථිකයට යම් ආකාරයක අවාසිදායක තත්ත්වයක් නිර්මාණය කළ හැකි බවයි කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය සුරංග ද සිල්වා පවසන්නේ.

## විදේශ ප්‍රේෂණ හා දළ නිල සංචිත

විදේශ ප්‍රේෂණ, ශ්‍රී ලංකාවේ ප්‍රධාන විනිමය ඉපයුම් ප්‍රභවයක්. සාමාන්‍යයෙන් වර්ෂයකට ඇමරිකානු ඩොලර් බිලියන 5-6ක පමණ මූල්‍ය ප්‍රවාහයක් මේ ඔස්සේ රටට පැමිණෙනවා. එය සමස්ත විදේශ විනිමය ඉපයුම්වලින් සියයට 30ක් පමණ. කලාපයේ සෙසු රටවල් අතුරින් විශාලතම විදේශ ප්‍රේෂණ ප්‍රමාණයක් උපයන ඉන්දියාව සාමාන්‍යයෙන් වසරකදී ඇමරිකානු ඩොලර් බිලියන 120ක (2024) පමණ විදේශ ප්‍රේෂණ ප්‍රමාණයක් උපයනවා. බංගලි දේශය ද වර්ෂයකට උපයනවා ඩොලර් බිලියන 22ක පමණ ප්‍රේෂණ ප්‍රමාණයක්. දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සලකා බැලූ විට ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රේෂණවල වැදගත්කම ඉන්දියාව සහ බංගලි දේශයට සාපේක්ෂ ව කැපී පෙනෙන දායකත්වයක් මෑතකාලීන ව පෙන්නුම් කරනවා. 2024 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රේෂණ දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 6.8ක් වූ අතර බංගලි දේශයේ සහ ඉන්දියාවේ එය පිළිවෙළින් සියයට 6ක් සහ 3.5ක් බව ලෝක බැංකු වාර්තා පෙන්වා දෙනවා. ඒ අනුව පෙනී යන්නේ විදේශ ප්‍රේෂණ ශ්‍රී ලංකා ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙන බව. විදේශ දළ නිල සංචිත තීරණය වීම, විදේශ ණය ගෙවීම සහ ආනයන ක්‍රියාවලියේදී විදේශ විනිමය ලැබීම්, ගෝලීය ආර්ථිකයේ ක්‍රියාත්මක වන ඕනෑ ම රටක ආර්ථිකයේ ස්ථාවරත්වයට බලපාන ප්‍රධාන සාධකයක්.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් විදේශ ප්‍රේෂණ සඳහා ජාත්‍යන්තර දිනයක් (The International Day of Family Remittances) ප්‍රකාශයට පත් කර ඇත්තේ, ආර්ථිකයට ඔවුන්ගෙන් වන දායකත්වය අගැයීමට. 2018 වසරේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩල සැසියේදී මේ දිනය නම් කෙරුණු අතර සෑම වසරක ම ජූනි 16 දින සැමරෙනවා.

ලොව විගමනික සේවකයන් මිලියන 200ක් පමණ ප්‍රේෂණ ඔස්සේ අවම වශයෙන් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් මිලියන 800ක් ජීවත් කරවන බව එක්සත් ජාතීන්ගේ සංවිධානය පෙන්වා දෙනවා. ලෝකයේ වැඩි ම ප්‍රේෂණ ප්‍රමාණයක් විදෙස් රටවල් වෙත යැවෙන්නේ, ඇමරිකාවෙන් වන අතර වැඩි ම ප්‍රේෂණ මුදලක් ලබන රටවල් අතර ඉන්දියාව, මෙක්සිකෝව, චීනය, පිලිපීනය සහ ඊජිප්තුව කැපී පෙනෙනවා.

විදේශ ප්‍රේෂණ වශයෙන් හඳුන්වන්නේ යම් රටක පුරවැසියන් වෙනත් රටක සේවා නියුක්ත වීම නිසා උපයන මුදල් තම මව් රටට සම්ප්‍රේෂණය කිරීම. ඒ අනුව විවිධ වෘත්තිකයන්, පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවෙන් විදේශ රටවලට ගොස් තම ශ්‍රමය විකුණා ශ්‍රී ලංකාවේ ස්වකීය පවුල්වල සාමාජිකයන්ට නීත්‍යානුකූල ව බැංකු පද්ධතිය ඔස්සේ එවන මුදල්, පුද්ගල විදේශ ප්‍රේෂණ. නීත්‍යානුකූල නොවන ක්‍රමවලින් ඒවන මුදල් විදේශ ප්‍රේෂණවලට ඇතුළත් වෙන්නේ නැහැ. මාසයක, කාර්තුවක හෝ වර්ෂයකට අදාළ ව ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රේෂණ ලෙසින් හඳුන්වන්නේ නීත්‍යානුකූල ක්‍රමවේදයට අනුව රටට ප්‍රේෂණය කරන මේ මුදල්. ඒ අනුව 2025 ජනවාරි-මැයි කාල සීමාවේ ලැබුණු සමස්ත විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල වටිනාකම එක්සත් ජනපද ඩොලර් මිලියන 3,102.2ක් බව මහබැංකුව වාර්තා කරනවා. එම කාලයේදී විදේශ රැකියා සඳහා පිටත් ව ගිය ශ්‍රමිකයන් සංඛ්‍යාව 115,022ක්. 2025 සැප්තැම්බර් අවසානය වන විට එකසත් ජනපද ඩොලර් මිලියන 695.7ක ප්‍රමාණයක් මෙරටට ලැබී තිබෙනවා. 2024 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී එය ඩොලර් මිලියන 555.6ක්. එය සියයට 25ක පමණ වර්ධනයක්. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති කෝසල වික්‍රමසිංහ පවසන්නේ මේ වසර අවසාන



වන විට එක්සත් ජනපද ඩොලර් බිලියන 7.2ක පමණ විදේශ ප්‍රේෂණ ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට ලැබෙනු ඇති බව. එසේ වුවහොත් එය 2016 වර්ෂයෙන් පසුව වාර්තා වන ඉහළ ම විදේශ ප්‍රේෂණ ප්‍රමාණය විය හැකියි. 2025 සැප්තැම්බර් මාසය වන විටත් ඩොලර් බිලියන 6කට ආසන්න ප්‍රමාණයක් ( ඇ.ඩො.මි. 5811.7) ලැබී තිබෙනවා.

## සංවර්ධනය වූ මානව ප්‍රාග්ධනය

ශ්‍රී ලංකාවෙන් විදේශ රැකියා සඳහා පිටත් වන සමස්තයෙන් විශාල පිරිසක් නුපුහුණු හෝ අර්ධ පුහුණු පුද්ගලයන්. මොවුන් නැවත රටට පැමිණෙන්නේ ඔවුන්ගේ කුසලතාවේ ඇති කරගත් වර්ධනයක් සහ පළපුරුද්දක් ද සමඟ. මෙය රටේ සංවර්ධිත මානව ප්‍රාග්ධනයේ ඉහළ යාමට හේතු වෙනවා. එය ධනාත්මක තත්ත්වයක්. එහෙත් ශ්‍රී ලාංකිකයන් පිටත් වන්නේ කුමනාකාරයේ රැකියාවකට ද? ඔවුන් ලබා ගත් පළපුරුද්ද හා වර්ධනය කරගත් කුසලතා රටේ නිෂ්පාදන ක්‍රියාවලියට නැවත යොමු කරනවා ද? යන්න ගැටලුවක්. බොහෝ පිරිසක් ගෘහාශ්‍රිත රැකියා සඳහා විදේශගත වන්නන්. එමෙන් ම වෘත්තිකයන් රැකියා සඳහා විදේශගත වීමෙන් පසුව නැවත ශ්‍රී ලංකාවට පැමිණෙනවා ද යන ගැටලු පවතිනවා. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අතිරේක සාමාන්‍යාධිකාරී ගාමිනී යාපා සෙනරත් පවසන්නේ ඉන්දියාව වැනි රටවල වෘත්තිකයන් රටින් පිට ව ගොස් නැවත පදිංචිය සඳහා මව් රට බලා පැමිණියත් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පවතින්නේ එයට වඩා වෙනස් තත්ත්වයක් බව. රටින් පිටවන බොහෝ වෘත්තිකයන් ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සමග එම රටවල ම පදිංචි වීමේ ප්‍රවණතාවක් පවතින බව ඔහු පෙන්වා දෙනවා. මේ නිසා ඔවුන් මෙරට නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගැනීමේ හැකියාව අවම වනු ඇති.

## නියාමනය, ආරක්ෂාව හා සුභ සාධනය

සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලාංකිකයන් විදේශ රැකියා සඳහා යොමු වීමේ ආර්ථිකමය වාසි පැවතිය ද අවාසි සහගත තත්ත්ව ද නැතුවා ම නොවෙයි. ශ්‍රමිකයකු විදේශගත වීම සඳහා අපේක්ෂා කරමින් ඒ සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලියේ සිට ශ්‍රමිකයා නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන අවස්ථාව දක්වා ම සෘජු හා වක්‍ර ගැටලු රාශියකට මුහුණදීමේ ඉඩක් පවතිනවා. එය පුද්ගල ගැටලු ඇති කරන්නක් පමණක් නොව සමාජ ගැටලු ඇති කරන්නක් ද විය හැකියි.

ජීවනෝපාය මාර්ගයක්, නිවසක් සාදා ගැනීම, ඉඩමක් මිල දී ගැනීම, දරුවන්ගේ අධ්‍යාපනය හා අනාගත සුරක්ෂිතභාවය සඳහා රැකියාවකට විදේශගත වීම නිසා ම පවුලේ දරුවන්ගේ ආරක්ෂාව හා සුභ සාධනයට එය තර්ජනයක් වන අවස්ථා බහුල ව දකින්න පුළුවන්. වංචනික ආයතනයවලට හසු වීමෙන් විදේශ රැකියා සිහිනය බොඳ ව යාම පමණක් නොව තමන්ගේ පවතින වත්කම් පවා අහිමි වූ අවස්ථා ද තිබෙනවා. නිසි පුහුණුවක් නොලබා විදේශගත වීම නිසා රැකියා ස්ථානයේ විවිධ ගැටලුවලට මුහුණපෑමට සිදු වීම, ඇතැම් අවස්ථාවලදී විදේශයක අතරමං වීමට සිදු වීම එවැනි ඛේදවාචක. බොහෝ විට පළමු වරට විදේශගත වන ශ්‍රමිකයන් මෙවැනි ගැටලුවලට මුහුණදෙනවා. මේ නිසා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විදේශගත වීම නියාමනය, ආරක්ෂාව හා සුභ සාධනය අරමුණු කරගත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත්‍ර ලබා දීම, විදේශ රැකියාගත වන පිරිස් ලියාපදිංචි කිරීම සහ ඔවුන් වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කිරීම ඊට අයත්. නියෝජිත ආයතන නියාමනය, ඔවුන් පිළිබඳ ව රැකියාලාභීන්ට තොරතුරු ලබා දීමෙන් දැනුවත් කිරීම, පැමිණිලි බාර ගැනීම හා විමර්ශනය, වන්දි අයකර දීම, විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ඒ ඒ රටවල භාෂාව හා සංස්කෘතිය පිළිබඳ දැනුවත් කිරීම, විදේශ රැකියා සඳහා රාජ්‍ය අතර එකඟතාවකින් යුතු (විවිධ රාජ්‍ය අතර සේවා ගිවිසුම් ඇති කර ගැනීමෙන්) විධිමත් වැඩපිළිවෙළක් නිර්මාණය කිරීම යනාදියෙන් ද අපේක්ෂා කරන්නේ විදේශගත වන ශ්‍රමිකයාත් ඔහුගේ හෝ ඇයගේ හෝ පවුලේ සාමාජිකයන්ට ඇති විය හැකි ගැටලු අවම කර ගනිමින් යම් ශ්‍රමිකයෙකු විදේශ රැකියා සඳහා යොමු කිරීම.

ශ්‍රී ලංකාවේ සංස්කෘතිය අනුව පවුලේ සාමාජිකයන් අතර බන්ධනයේ ප්‍රධාන පුරුක වූ මව විදේශගත වීමෙන් කුඩා දරුවන් අනාරක්ෂිත වන අතර ඔවුන්ගේ පෞරුෂ වර්ධනය වීම කෙරෙහි ද එය අහිතකර ලෙස බලපානවා. ශ්‍රී ලංකා අගමැතිනිය පසුගිය දිනෙක ප්‍රකාශ කළේ රටේ අනාරක්ෂිත දරුවන් 14,000කට වැඩි සංඛ්‍යාවක් සිටින බව. එය මව හෝ පියා හෝ විදෙස්ගත වීම නිසා ඇති වූ තත්ත්වයක් ම නොවුණත් එය ද ප්‍රධාන සාධකයක් විය හැකියි.

මෑත කාලයේ විදේශ රැකියා නියුක්ති කාර්යාංශය දරුවන් අනාරක්ෂිත වන අවස්ථාවලදී විදේශගත වීම අවම කිරීමට නීති පනවා තිබීම විශේෂත්වයක්. විදේශගත වන ශ්‍රමිකයාගේ පවුල්වල දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය, වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීම හා රටවිරුවෝ වැනි සංකල්ප ඔස්සේ විදේශගත වන්නන් දිරිමත් කිරීම විදේශ රැකියා ප්‍රවර්ධනයටත් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සුභ සාධනයත් ඉලක්ක කරගත් විදේශ සේවා නියුක්ති කාර්යාංශය දැනටමත් ක්‍රියාත්මක කරන සමාජ ප්‍රතිලාභ අත්කරදෙන වැඩසටහන්.

විදේශ රැකියා නියෝජිත ආයතනවලට බලපත්‍ර ලබා දීමේ අරමුණ වන්නේ විගමනික ශ්‍රමිකයන්ගේ යහපාලනය, ආරක්ෂාව හා බලසතු කිරීමෙන් යහපත්




රැකියා ප්‍රවර්ධනය ඵලදායි ව ක්‍රියාවට නැංවීම සහතික කිරීම. දැඩි රෙගුලාසි සහ බලපත්‍ර අවශ්‍යතා පැනවීමෙන්, බඳවා ගැනීමේ නියෝජිතායතන සදාචාරාත්මක ප්‍රමිතිවලට අනුකූල වන බව සහතික කිරීම, නීතිමය රාමුවලට අනුගත වීම සහ සංක්‍රමණ ක්‍රියාවලිය පුරා ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම තහවුරු කරනු ඇති. කාර්යාංශය වෙතින් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා බඳවා ගැනීමේ නියෝජිතායතන දැඩි නිර්ණායක මාලාවක් සපුරාලිය යුතු වෙනවා.

විගමනික ශ්‍රමිකයන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වීමෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා උපකාරක සේවා සඳහා ප්‍රවේශය මෙන් ම අධීක්ෂණය, වගවීම හා දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමෙන් ප්‍රතිපත්ති සහ සැලසුම් සකස් කිරීම සඳහා පදනමක් සපයා ගැනීම අරමුණු කර තිබෙනවා.

බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන සහ වෙනත් බලපත්‍ර නොමැති පාර්ශ්ව විසින් සිදු කරනු ලබන නීතිවිරෝධී බඳවාගැනීම් සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි පිළිබඳ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පරීක්ෂණ පවත්වනවා. එසේ ම සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා වැටලීම් සිදු කර, නිසි පරීක්ෂණ පවත්වා නීතිය කඩ කරන පුද්ගලයන්ට එරෙහි ව නීතිමය පියවර ගැනීම ද සිදු කරනවා.

"එතෙර වෙළෙඳ පොළ සඳහා නිපුණතාවෙන් පිරි මිනිස් සම්පත සැපයීමේ ලොව හොඳම තේරීම බවට ශ්‍රී ලංකාව පත්වීම" යන දැක්ම අනුව යමින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සිය කාර්යභාරය ඉටු කරන අයුරු දක්නට පුළුවන්. ඒ සඳහා පුහුණු ශ්‍රමිකයන් විදේශගත කිරීම, ශ්‍රමිකයන් විදේශගත කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා අවම පිරිවැයකින් යුතු ව විදේශගත වීම සඳහා 'පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්' රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව යන ඩිජිටල්කරණයට මත පදනම් වූ උපායමාර්ගික සැලැස්මක අවශ්‍යතාව තවමත් පවතිනවා. එමෙන් ම විදේශ රටක සේවය නිමාකොට පැමිණෙන ශ්‍රමිකයාගේ වැඩිදියුණු කරන ලද ශ්‍රමය දේශීය නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා කඩිනමින් දායක කර ගැනීමට අවශ්‍ය වැඩසටහනක් එම උපායමාර්ගික සැලසුමේ ඇතුළත් වීමත් අත්‍යවශ්‍ය කරුණක්.

විගමනික ශ්‍රමිකයන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වීමෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා උපකාරක සේවා සඳහා ප්‍රවේශය මෙන් ම අධීක්ෂණය, වගවීම හා දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමෙන් ප්‍රතිපත්ති සහ සැලසුම් සකස් කිරීම සඳහා පදනමක් සපයා ගැනීම අරමුණු කර තිබෙනවා.




මූලාශ්‍රය - විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# ඒකාබද්ධ වැඩසටහනක් නිර්මාණය කරනවා



**කෝසල වික්‍රමසිංහ**
සභාපති
ශ්‍රී ලංකා විදේශ සේවා
නියුක්ති කාර්යාංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ආරම්භ කිරීමේ මූලික අරමුණු වුණේ ශ්‍රම වෙළෙඳ පොළ සංවර්ධනය කිරීම, විදේශ රැකියා නියෝජිත ආයතන නියාමනය, විදේශගත වන පුද්ගලයන්ගේ සහ පවුල්වල සමාජ සුභ සාධනය හා ආරක්ෂාව තහවුරු කිරීම. ඒ අනුව ලෝකයේ විශ්වසනීය ශ්‍රමිකයන් පිරිසක් ලෝකයට මුදා හරින රටක් බවට ශ්‍රී ලංකාව පිළිගැනෙනවා.

මුල් කාලයේ පැවති නීතිමය ගැටලු, කම්කරු ගැටලු සහ විදේශ ශ්‍රම වෙළෙඳ පොළේදී රැකියාලාභියා මුහුණපාන ගැටලු විශාල වශයෙන් අවම කර ගැනීමට විදේශ සේවා නියුක්ති කාර්යාංශයට හැකියාව ලැබී තිබෙනවා. ඒ අනුව අපට ලැබී තිබෙනවා වඩාත් ඵලදායී හා සුවදායී ආරක්ෂිත රැකියා සඳහා විගමනයක් සහතික කිරීමේ හැකියාව. අප්‍රිකානු රටවල්, හොංකොං, තායිලන්තය වැනි රටවල් ශ්‍රී ලංකාවේ රැකියා සඳහා විදේශගත කරන ක්‍රමවේදය අධ්‍යයනය සඳහා මෙරටට පැමිණ තිබෙනවා. ඒ අනුව ඔවුන් භාවිත කරමින් සිටින්නේ ද ශ්‍රී ලංකාවේ ක්‍රමවේදය.

# සාම්ප්‍රදායික වෙළෙඳ පොළේ වෙනසක්



**ගාමිණී සෙනරත් යාපා**
අතිරේක සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රී ලංකාවේ ශ්‍රමික සංචලනය පිළිබඳ සලකා බලන විට සියයට 80ක් පමණ රැකියා සඳහා විදේශගත වන්නේ සාම්ප්‍රදායික වෙළෙඳ පොළ පවතින මැදිපෙරදිග ආශ්‍රිත රටවලට. කුවේට්, සෞදි අරාබිය, කටාර් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය මේ අතරින් විශේෂයි. එහෙත් වර්තමානයේ රොමේනියාව, ජපානය, මාලදිවයින සහ ඊශ්‍රායලය වැනි රටවල් සඳහා ශ්‍රමික සංචලනයේ යම් ප්‍රවණතාවක් ද දක්නට පුළුවන්. අනාගතයේදී ජපානය ශ්‍රී ලංකාවට හොඳ ශ්‍රම වෙළෙඳ පොළක් වන්නට පුළුවන්. ඔවුන් විදේශ ශ්‍රමිකයන් ලබා ගැනීමට යම් ක්‍රමවේදයක් හඳුන්වා දී තිබෙනවා. ශ්‍රී ලංකා ශ්‍රමිකයන් සඳහා ඔවුන් දක්වන්නේ යම් ආකර්ෂණීය බවක්.

කොවිඩ් 19 වසංගත සමයට පෙර ශ්‍රී ලාංකිකයන් 225,000ක් පමණ රැකියා සඳහා විදේශගත වීමේ

ශ්‍රී ලංකාව විදේශ රැකියා වෙළෙඳ පොළේදී යම් තරගකාරිත්වයකට මුහුණ දිය යුතු වෙනවා. මේ නිසා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට සිදු වෙනවා තරගකාරී වෙළෙඳ පොළට සරිලන ආකාරයේ ශ්‍රමිකයකු නිර්මාණය කරන්නට. එහිදී රැකියාවලට විදේශගත වන පිරිස් ප්‍රධාන කොටස් දෙකකට බෙදා වෙන් කරනවා. ඒ, ගෘහාශ්‍රිත රැකියා සඳහා පිටත්වන පුද්ගලයන් සහ ගෘහාශ්‍රිත නොවන රැකියා සඳහා පිටත්වන පුද්ගලයන් ලෙස. ඔවුන් ඊට සූදානම් කිරීමේ ක්‍රමවේද එකිනෙකට වෙනස්. ගෘහාශ්‍රිත රැකියා සඳහා නැතහොත් ගෘහ සේවය සඳහා යොමුවන පුද්ගලයන් බොහෝ විට පිටත් වන්නේ විධිමත් රැකියා පුහුණුවක් ලැබීමෙන් පසුව නොවෙයි. ඔවුන්ට දිගුකාලීන අරමුණක් නැහැ. ඔවුන්ට තිබෙන්නේ වසරකින් හෝ දෙකකින් හෝ ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන, පවුලේ ආර්ථිකය බිඳ වැටීමෙන් පසුව ජීවනෝපාය මාර්ගය සකස් කර ගැනීම සඳහා අරමුණු කරගත් විගමනයක්. ඒ අනුව ගෘහාශ්‍රිත රැකියා සඳහා විදේශගත වීමට අපේක්ෂා කරන පුද්ගලයන් සම්බන්ධයෙන් විදේශ සේවා නියුක්ති කාර්යාංශය දින 28ක නේවාසික පුහුණුවක් ලබා දී, NVQ 3 මට්ටමට එම පුද්ගලයාගේ කුසලතා වර්ධනය කරනවා. එහෙත් පිලිපීනය වැනි රටවල් ගෘහ සේවය සඳහා උසස් අධ්‍යාපන අවස්ථා ලබා දී ඔවුන් පුහුණු කරන්නේ දිගුකාලීන ව. රැක බලාගන්නන් (Care Giver) සඳහා පිලිපීනය වැනි රටවල උපාධියක් පවා පිරිනමනවා. මේ නිසා ශ්‍රී ලංකාවට ගෘහාශ්‍රිත රැකියා සඳහා විදේශ වෙළෙඳ පොළේ පවතින්නේ දැඩි තරගකාරිත්වයක්. ශ්‍රී ලංකාවේ එවැනි දිගුකාලීන පුහුණු වැඩසටහන් හෝ අධ්‍යයන පාඨමාලා හෝ නොමැති වුවත් ඉදිරි කාලයේදී එවැනි දිගුකාලීන වැඩපිළිවෙළක් සඳහා විවිධ ආයතන සමඟ ඒකාබද්ධ වී ක්‍රියා කිරීමට සූදානමක් පවතිනවා. අනෙකුත් රැකියා සඳහා ද විධිමත් ආකාරයේ පුහුණුවක් ලබා දීමක් සිදු වන්නේ නැහැ. බොහෝ විට රැකියා ඇණවුමක් පැමිණි පසුවයි ඒ පිළිබඳ සොයා බලන්නේ. එසේ නොමැති ව ඉදිරි කාලවලදී ලෝක වෙළෙඳ පොළේ බිහිවෙන රැකියා අවස්ථා ඉලක්ක කරගනිමින් ඒ සඳහා ශ්‍රමිකයන් සූදානම් කරන ක්‍රමවේදයක් ශ්‍රී ලංකාවේ තවමත් නැහැ. ඊට කිසියම් අධ්‍යයනයක් සිදු කළ යුතු වෙනවා. ඒ සම්බන්ධයෙන් අදාළ වන සියලු ආයතන සමඟ ඒකාබද්ධ වූ වැඩසටහනක් අවශ්‍යයි. රජයේ මගපෙන්වීම අනුව විදේශ සේවා නියුක්ති කාර්යාංශය අදාළ සියලු ආයතන සමඟ ඒකාබද්ධ ව ඒ පිළිබඳ අධ්‍යනය කරමින් සිටිනවා. ඉදිරි වසර දෙක තුන ඇතුළතදී අනාගත විදේශ රැකියා වෙළෙඳ පොළ ඉලක්ක කරගත්, ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූල සහ ශ්‍රී ලංකාවට ගැළපෙන නිශ්චිත වැඩපිළිවෙළක් නිර්මාණය කර ගැනීමට අපට හැකි වේවි.

වත්මන් ජනාධිපතිවරයා බලයට පත්වන විට විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමාජයේ දැඩි කතාබහකට ලක් ව තිබුණා. කාර්යාංශය පිළිබඳ ව සමාජයේ පැවතුණේ වංචා දූෂණවලින් පිරුණු, අක්‍රමිකතාවලින් ගහන ආයතනයක් වැනි ආකල්පයක්. මේ නිසා දේශපාලන අධිකාරිය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එක් ව කිසි ම ආකාරයේ වංචාවක්, දූෂණයක්, අක්‍රමිකතාවක් සිදු නොවීමට අවශ්‍ය පසුබිම සකස් කර තිබෙනවා. ඊශ්‍රායලයට රැකියා සඳහා පුද්ගලයන් විදේශගත කිරීමේදී අනුගමනය කරන ලද පැවති ක්‍රමවේදය දූෂිත වූවක්. එය නැවත පූර්ණ වශයෙන් නිවැරදි කර තිබෙනවා. වංචා විමර්ශන අංශය බලසම්පන්න කර තිබෙනවා. ගොඩ ගැසී තිබූ 11,000ක පමණ පැමිණිලි මාසයක් තුළ 8000කට පමණ අවම කර තිබෙනවා. පුද්ගලයකු රැකියාවක් සඳහා විදේශගත වීමේදී දැරිය යුතු පිරිවැය අවම කිරීමට හෝ දැරිය හැකි තත්ත්වයට පත් කිරීමට හෝ කාර්යාංශය පියවර ගනිමින් තිබෙනවා. ශ්‍රී ලංකාවේ විදේශ රැකියා වෙළෙඳ පොළ රටේ ආර්ථිකයේ සංවර්ධනයට ඉහළ දායකත්වයක් සපයන, දියුණු මානව සම්පතකින් යුක්ත, අනාගත ලෝක රැකියා ඉල්ලුම ඉලක්ක කරගත් ක්‍රියාවලියක් බවට පත් කිරීමට ක්‍රියා කරමින් සිටින්නේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයත් අදාළ අනෙකුත් ආයතනත් ඒකාබද්ධ ව. ඒ අනුව ඉදිරියේදී විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත ද වෙනස් වනු ඇති. මේ සියල්ල සඳහා දේශපාලන අධිකාරියේ ද උපරිම සහයෝගය හා මගපෙන්වීම කාර්යාංශයට ලැබෙනවා. පවතින තත්ත්වය හමුවේ වුවත් මෑත ඉතිහාසයේ ඉහළ ම විදේශ ප්‍රේෂණ ප්‍රමාණය වන ඩොලර් බිලියන 7.2 ඉලක්කය ළඟා කර ගැනීමට 2025 වර්ෂය අවසානයේ ශ්‍රී ලංකාවට හැකිවනු ඇතැයි යන්න මා විශ්වාස කරනවා.

සාමාන්‍ය තත්ත්වයක් පැවතුණා. එම වසංගතයෙන් පසුව පෙන්නුම් කරනවා මේ සංඛ්‍යාව 300,000 දක්වා ඉහළ යාමක්. 2025 ඔක්තෝබර් මස මුල්භාගය වන විට 244,000 ඉක්මවා රැකියා සඳහා විදේශගත වී සිටිනවා. මීට ප්‍රධාන වශයෙන් බලපා තිබෙනවා හේතු දෙකක්. පළමුවැන්න කොවිඩ් 19 වසංගතයත් සමඟ රටින් පිට ව යාමට තිබූ අවම ඉඩ ප්‍රස්ථාව සහ එහි බලපෑම ක්‍රමයෙන් හීන වීමත් සමඟ යථා තත්ත්වයට පත් වීම මෙන් ම ඒ සමඟ රටේ ඇති ව තිබූ ආර්ථික පරිසරය මත විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ ඉල්ලුමේ ඇති වූ ඉහළ යාම. දෙවැනි හේතුව වන්නේ කොවිඩ් වසංගතය සමයේදී වෙනත් රටවල ශ්‍රම ඉල්ලුම සහ ආර්ථිකය ද යථා තත්ත්වයට පත් වීම.

රැකියා ක්ෂේත්‍රය විශ්ලේෂණය කරන විට ලෝක ජනගහනය වයස්ගත වීම හමුවේ රැක බලාගන්නන් නැතහොත් සාත්තු සේවකයන් සඳහා ඉහළ ඉල්ලුමක් පවතිනවා. ගෘහ සේවය සඳහා පිටත් ව යාම පෙන්නුම් කරන්නේ පෙර තිබූ සියයට 23ක ප්‍රමාණයේ යම් වර්ධනයක්. එහිදී පුහුණු ශ්‍රමිකයන් බවට පත්කර NVQ 3 පාඨමාලාවක් අප හඳුන්වා දී තිබෙනවා. මේ වන විට රැකියා සඳහා විදේශගත වන පුද්ගලයන්ගෙන් සියයට 78ක් පමණ ලංකාවෙන් පිටත් වන්නේ පුහුණු ශ්‍රමිකයන් වශයෙන්. ඔවුන්ට වෙළෙඳ පොළේ වැඩි ඉල්ලුමක් පවතිනවා මෙන් ම ඉහළ වැටුපක් ලැබෙන අතර ම විදේශගත වීමෙන් පසුව ඇති වන ගැටලු අවම කර ගැනීමේ හැකියාවත් තිබෙනවා. මෙයට පෙර විදේශගත වූ පුද්ගලයන්ගේ වැඩි පිරිස කාන්තාවන්. එහෙත් විදේශගත වන පුද්ගලයන්ගෙන් පුරුෂයන් සියයට 60ක් සහ කාන්තාවන් සියයට 40ක් ලෙස අනුපාතයක වර්තමානයේ එය පවතිනවා.

ඊශ්‍රායලය වැනි රටවල් සමඟ ශ්‍රී ලංකා රජය ඇති කරගෙන තිබෙන ගිවිසුම් ප්‍රකාරවත් යම්කිසි පිරිසක් රැකියා සඳහා විදේශගත වෙනවා. ශ්‍රී ලංකා රජය ප්‍රධාන ගිවිසුම සමඟ ගිවිසුම් 8කට අත්සන් කර ලබාගෙන තිබෙනවා ක්ෂේත්‍ර 8ක් සඳහා රැකියා අවස්ථා. මේ යටතේ දැනට වසර දෙක තුනකට පෙර සිටි 5000ක් වැනි ශ්‍රමිකයන් අද වනවිට 26,000ක් තරම් ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබී තිබෙනවා.

මේ අනුව සමස්තයක් ලෙස සලකා බලන විට ශ්‍රී ලංකාව තවමත් විදේශ සේවා නියුක්තියේදී සාම්ප්‍රදායික වෙළෙඳ පොළ මූලාශ්‍ර මත ක්‍රියාකාරී වුවත් සාම්ප්‍රදායික නොවන වෙළෙඳ පොළ මූලාශ්‍රවල ක්‍රියාකාරීත්වයේ ද යම් ප්‍රවණතාවක් දක්නට පුළුවන්.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන අරමුණු ත්‍රිත්වය අතුරින් එක් අරමුණක් වන්නේ විදේශ රැකියා ප්‍රවර්ධනය. ආරක්ෂාව හා සුභ සාධනය තහවුරු කිරීම සහ වෙළෙඳ පොළ නියාමනය සෙසු අරමුණු. විදේශ රැකියා වෙළෙඳ පොළ ප්‍රවර්ධනයේදී කාර්යාංශය ආකාර දෙකකට එය සිදු කරනවා. ඒ, විදේශයන්හි පවතින වෙළෙඳ පොළ පුළුල් කර ගැනීමේ අවස්ථා ලබා ගැනීම සහ විදේශීය වෙළෙඳ පොළට අවශ්‍ය ශ්‍රමිකයා දේශීය වශයෙන් නිර්මාණය කිරීම වශයෙන්. කාර්යාංශය, දූත මණ්ඩල 15ක කම්කරු හා සුභ සාධන අංශයක් පිහිටුවා තිබෙනවා. ඒවාට අනුයුක්ත කාර්යාංශයේ නිලධාරින්ගේ මූලික කාර්යභාරයක් වන්නේ රැකියා වෙළෙඳ පොළ ප්‍රවර්ධනය. විවිධ සමාගම් සහ දූත මණ්ඩල සමඟ සාකච්ඡා පැවැත්වීමෙන් ඔවුන් ඊට මැදිහත් වෙනවා. උදාහරණයක් වශයෙන් ජර්මනිය, සිංගප්පූරුව, ජපානය වැනි රටවල විදේශ ශ්‍රම ඉල්ලුම සඳහා ශ්‍රී ලාංකිකයන් සූදානම් කිරීම ඔවුන්ගේ කාර්යයක්.

විදේශ රැකියාවක් අපේක්ෂා කරන ශ්‍රී ලාංකිකයකු ඒ සඳහා නියමිත ක්‍රමවේදයට අනුව, නීත්‍යානුකූල ප්‍රවේශයක් අනුගමනය කළහොත් එහිදී පැනනැගිය හැකි ගැටලු අවමයි. සාමාන්‍යයෙන් පුද්ගලයකු රැකියාවක් සඳහා විදේශගත වන ක්‍රම තුනක් තිබෙනවා. පෞද්ගලික මට්ටමින් පුද්ගලයකු විදේශයක රැකියා අවස්ථාවක් සොයා දීම, කිසියම් ආයතනයකින් රැකියා අවස්ථාවක් සඳහා යොමු කිරීම සහ ශ්‍රී ලංකාව හා වෙනත් රටක රාජ්‍යයක් සමඟ ඇති කරගත් ගිවිසුමක් අනුව රැකියා අවස්ථාවක් සඳහා විදේශගත වීම ඊට අයත්. මෙයින් තුන් වැනි අවස්ථාවයි අවදානම සහ ගැටලු අවම. එය නීත්‍යානුකූල වනවා පමණක් නොව ජනතාවට විනිවිදභාවය තහවුරු කරන ක්‍රමවේදයක්. දකුණු කොරියාවට රැකියාවක් සඳහා පිටත් ව යාමේදී තරග විභාගයකට පෙනී සිටීමෙන් පසුව ඉහළ ලකුණු ලබා ගන්නා පිරිසට රැකියා අවස්ථාව හිමි වීම ඊට උදාහරණයක්. දෙවැනි අවස්ථාව වන නියෝජිත ආයතනයකින් රැකියා අවස්ථාවකට යොමු වීමේදී සැලකිලිමත් විය යුතු වන්නේ එම ආයතනය විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි ආයතනයක් ද යන්න. ඒ සඳහා 1989 අංකයට ඇමතුමක් දිය හැකියි. එසේ ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින කාර්යාංශයේ නිලධාරියෙකුගෙන් හෝ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පළාත් කාර්යාලයකින්, දිස්ත්‍රික් කාර්යාලයකින් ඒ පිළිබඳ විමසිය හැකි අතර https://www.slbfe.lk/ වෙබ් අඩවිය පරීක්ෂා කිරීමත් එහිදී කළ හැකියි.

වඩාත් ම සැලකිලිමත් විය යුතු අවස්ථාව වන්නේ පළමු වැනි අවස්ථාව. බලපත්‍රයක් රහිත ව විදේශ රැකියා ලබා දීමේ ආයතනයක් ලෙස කටයුතු කිරීම නීත්‍යානුකූල ක්‍රමයක් නොවෙයි. විටෙක මෙය අතරමැදියකු ලෙස පුද්ගලයකු ක්‍රියා කරමින් විදේශ රැකියා සඳහා යොමු කරන්නෙක් ද විය හැකියි. ඇතැම් අවස්ථාවක ඥාතියකු විසින් සොයා දෙන රැකියාවක් ද විය හැකියි. මේ ඕනෑ ම අවස්ථාවකදී ඒ පිළිබඳ හොඳින් සොයා බැලීම වැදගත්. විටෙක වංචාකාරී අවස්ථාවකට හෝ වෙනත් ගැටලුවකට හෝ විදේශ රැකියා අපේක්ෂකයකු මුහුණ දී ඇත්නම් ඒ පිළිබඳ එම පුද්ගලයාට සාක්ෂි සහිත ව තහවුරු කළ හැකිනම් විදේශ සේවා නියුක්ති කාර්යාංශය එම පුද්ගලයා වෙනුවෙන් කටයුතු කිරීමට බැඳී සිටිනවා. 2025 වර්ෂයේ මේ වන විට විදේශ සේවා නියුක්ති කාර්යාංශය රුපියල් මිලියන 234ක පමණ මුදලක් අදාළ පාර්ශ්ව වෙත අය කර දී තිබෙනවා. මෙයට වසර තුනකට පමණ පෙර එය රුපියල් මිලියන 83ක් වැනි අගයක්. මේ වන විට එවැනි පැමිණිලි 10,000ක් පමණ කාර්යාංශයට ලැබී තිබෙනවා. එම නිසා විදේශ රැකියා අපේක්ෂකයකු රැකියාවක් සඳහා ආයතනයක හෝ පුද්ගලයෙකුගේ හෝ සහය ලබා ගන්නා විට සියලු තොරතුරු පිළිබඳ දැනුවත් වී විශ්වාසය තහවුරු කරගත යුතුයි. තොරතුරු ගලා යාම වේගවත් ව සිදුවන ලෝකයක එය එතරම් අපහසු කාර්යයක් වන්නේ නැහැ.



# ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍යයි

මහාචාර්ය
**සුරංග ද සිල්වා**
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

විදේශ ප්‍රේෂණ (Remittance) ලෙස අර්ථ ගැන්වෙන්නේ කිසියම් රටක පුද්ගලයකු වෙනත් රටක රැකියාවක් සඳහා පිටත් ව ගොස් එම පුද්ගලයා විසින් තම මව් රටට එවනු ලබන, ඔහු උපයන ආදායමේ කොටස. ඒ අනුව ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රේෂණ යනුවෙන් අදහස් වන්නේ විදේශයක සේවය කරන ශ්‍රී ලාංකිකයන් තම මව් රටට එවන මුදල්.

කොවිඩ් 19 වසංගතයට පෙර ශ්‍රී ලංකාවෙන් රැකියා සඳහා විදේශගත වූ පුද්ගලයන්ගෙන් බහුතරය කාන්තාවන්. ගෘහ සේවය ඔවුන්ගේ ප්‍රධාන රැකියාව. මෙහිදී වැඩි වශයෙන් විදේශගත වන්නේ නුපුහුණු ශ්‍රමිකයන්. නමුත් 2022 වසරින් පසුව මේ තත්ත්වයේ යම් වෙනසක් දකින්නට පුළුවන්. මේ කාලයේ බුද්ධි ගලනය වීමක් දක්නට ලැබෙනවා. විශේෂයෙන් හෙදියන්, ඉංජිනේරුවන්, ගණකාධිකාරිවරුන් ආදී පිරිස් රැකියා සඳහා විදේශගත වීම ඉහළ ගියා. ඒ අනුව පුහුණු ශ්‍රමය විදේශගත වීමක් ද සිදු වුණා. එය සියයට 25 තරම් ඉහළ මට්ටමකට පැමිණ තිබුණා. කාන්තාවන් විදේශගත වීම ද අවම වුණා. එයට රජයේ නීති රීති ද බලපෑම් කරන්නට ඇති.

2022 වසරට පෙර විදේශ ප්‍රේෂණවල අඩු වීම අර්බුද කාලයේ බරපතළ වුණා. එයට හේතුව වුණේ විනිමය අනුපාතයේ යම් පාලනයක් සිදු කර තිබීම නිසා විශේෂයෙන් නීත්‍යානුකූල නොවන ක්‍රමයට මුදල් ප්‍රේෂණය කිරීම ඉහළ යාම. පසුකාලීන ව විනිමය අනුපාතිකය විවෘත වෙළෙඳ පොළේ ඉල්ලුම සැපයුම අනුව තීරණය වීමට ඉඩ හැරීම නිසා නැවතත් නීත්‍යානුකූල ක්‍රමයට මුදල් ප්‍රේෂණය වීම සිදු වුණා. මේ නිසා විදේශ ප්‍රේෂණවල ද යම් ඉහළ යාමක් දකින්නට පුළුවන්. ඒ අනුව මාසයකට ඩොලර් මිලියන 500-600ක පමණ ප්‍රමාණයක් විදේශ ප්‍රේෂණ ලෙසින් ලැබුණා.

ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ ප්‍රේෂණ ආර්ථිකය පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක්. සාමාන්‍යයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 7ක් පමණ විදේශ ප්‍රේෂණවලින් ලබා ගන්න පුළුවන්. මෙය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 7කට ආසන්න ප්‍රමාණයක්. ඒ අනුව ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ ප්‍රේෂණ සාර්ව ආර්ථිකයේ ප්‍රධාන ගැලවුම්කරුවා ලෙස හඳුන්වන්න පුළුවන්. අනෙකුත් විදේශ අදායම් උත්පාදන මූලාශ්‍රවලින් එතරම් මුදල් ප්‍රමාණයක් ලැබෙන්නේ නැහැ. මේ නිසා ජාතික වශයෙන් උපාය මාර්ගික ව වැදගත් වන ප්‍රධානම අරමුදල් මූලාශ්‍රය (Strategic National Assets) වන්නේ විදේශ ප්‍රේෂණ.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දත්ත පරීක්ෂා කරන විට 2021-2025 වර්ෂ අතර කාලයේ ශ්‍රී ලංකාවෙන් මිලියන 1.3ක පමණ පිරිසක් රැකියා සඳහා විදේශගත ව තිබෙනවා. මෙයින් සියයට 35ක් වෘත්තීයමය රැකියා. සියයට 56ක් පමණ ගෘහාශ්‍රිත රැකියා හෝ නුපුහුණු හෝ අවම පුහුණුවක් සහිත හෝ රැකියා. වසරකට ලක්ෂ 03ක් පමණ මේ සියලු ආකාරයේ රැකියා සඳහා ශ්‍රී ලංකාවෙන් ශ්‍රම ගලනයක් සිදු වෙනවා. කුවේට්, සෞදි අරාබිය හා කටාර් වැනි රාජ්‍යවලට වැඩි වශයෙන් විදේශගත වීමක් දකින්නට පුළුවන්. පිලිපීනය, බංගලි දේශය වැනි රටවල් සමග ශ්‍රී ලංකාවට තරගකාරිත්වයක් තිබෙනවා. මුල්කාලීන ව මෙරට ශක්තිමත් ශ්‍රමිකයන් රැකියා සඳහා විදේශගත වීමක් (Muscle Drain) සිදු වුවත් වර්තමානයේ බුද්ධිමත් ශ්‍රමිකයන් රැකියා සඳහා විදේශගත වීමේ (Brain Drain) ප්‍රවණතාවක් දක්වා එය වෙනස් වී තිබෙනවා. අනාගතයේදී වෘත්තිකයන් රට හැර යාම ශ්‍රී ලංකාවට ගැටලුවක් වන්නට පුළුවන්.

මේ සියලු තත්ත්ව සලකා බලන විට ශ්‍රී ලංකාව විදේශ ශ්‍රම වෙළෙඳ පොළ සඳහා පුහුණු ශ්‍රමිකයන් සූදානම් කිරීමේ අවශ්‍යතාව මෙන් ම වෘත්තිකයන් විදේශ රැකියා සඳහා පිටත් වීමේදී යම්කිසි තුලනාත්මක ක්‍රමවේදයක් භාවිත කිරීමත් කළ යුත්තක්. එසේ නොවුණහොත් වෘත්තිකයන් රට හැර යාම නිසා ශ්‍රී ලංකාවේ වෙනත් ගැටලු නිර්මාණය වන්නට පුළුවන්. කෙසේ වෙතත් වර්තමානයේ විදේශ විනිමය ඩොලර් බිලියන 700කට ආසන්න ප්‍රමාණයක් ශ්‍රී ලංකාව විදේශ ප්‍රේෂණවලින් උපයනවා.

විදේශ රැකියා සඳහා වන උපායමාර්ගික සැලසුම් සකස් කළ යුතු වන්නේ විදේශ ප්‍රේෂණ ප්‍රමාණය ඉහළ නංවා ගනිමින්, ආර්ථික සංවර්ධනය සඳහා බාධාවක් නොවන ආකාරයටත් සාමාජීය අර්බුද පැන නොනගින ආකාරයටත්. ශ්‍රමිකයන්ගේ කුසලතා සහතික කිරීම වැඩිදියුණු කිරීම ඊට උදාහරණයක්. ඉන්දියාව, පිලිපීනය වැනි රටවල් මේ ක්‍රමවේදය දැනටමත් භාවිත කරනවා. පිලිපීනයේ මේ සඳහා තාක්ෂණික අධ්‍යාපනය සහ කුසලතා සංවර්ධන අධිකාරියක් (Technical Education and Skills Development Authority) පිහිටුවා තිබෙනවා. එවැනි වැඩසටහනකින් ශ්‍රමිකයකුගේ කුසලතා නැංවීම, කුසලතා සංවර්ධනය කිරීම (Re Skill), කුසලතා වැඩිදියුණු කිරීම (upskill) කළ හැකියි. මෙය ජාත්‍යන්තර ශ්‍රම වෙළෙඳ පොළේ කේවල් කිරීමේ හැකියාවෙන් යුක්ත ශ්‍රමිකයකු නිර්මාණය කිරීමට උදව් වෙනවා. එය තරගකාරී ශ්‍රම වෙළෙඳ පොළකට අත්‍යවශ්‍ය සාධකයක්. දැනටමත් ශ්‍රී ලාංකිකයන්ගේ සංස්කෘතික හා සමාජීය ලක්ෂණ අනුව බොහෝ රටවල පැහැදීමක් තිබෙනවා. මේ තත්ත්වය ද සමග ඉහළ ගුණාත්මකභාවයකින් යුතු කුසලතාවලින් පූර්ණ ශ්‍රමිකයකු නිර්මාණය කිරීම විදේශ ප්‍රේෂණ ඉහළ නංවා ගැනීමටත් ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමටත් උපකාරි විය හැකියි.

ශ්‍රමිකයන්ට අවම පිරිවැයකින් හා පහසුවෙන් රැකියා සඳහා පිටත් වීමටත් ආරක්ෂාකාරී ව රැකියාවේ නිරත වීමටත් ශ්‍රම ඉල්ලුම්කරුවන්ට තම අවශ්‍යතාව පරිදි උපරිම කාර්යක්ෂමතාවකින් යුතු ව ගුණාත්මක හා කුසලතා සම්පන්න ශ්‍රමිකයන් ලබා ගැනීමටත් හැකිවන පරිදි අන්තර්ජාතික ශ්‍රම වෙළෙඳ පොළට ගැළපෙන ආකාරයේ ජාතික විදේශ රැකියා ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම සහ ඒ සඳහා උපායමාර්ගික සැලසුම් සම්පාදනය ඉතා වැදගත්. ඒ, ශ්‍රමිකයන්ගේ විදේශගත වීමේ පිරිවැය අවම කිරීම; ශ්‍රී ලාංකික ඩයස්පෝරාවේ අත්දැකීම් සහ සහයෝගය ලබා ගැනීමෙන් විදේශ රැකියා ප්‍රවර්ධනය; සුභ සාධනය හා අත්දැකීම් හුවමාරුවට පහසුකම් සලසා දීම; විදේශ ගමන් බලපත්‍රය භාවිත කිරීමෙන් ශ්‍රමිකයකුගේ කුසලතා පිළිබඳ හා ඔහුගේ ජීව දත්ත ප්‍රකාශය පහසුවෙන් බලා ගත හැකි පරිදි දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම යනාදී අරමුණු මූලික ව. ඒ සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට විශාල වගකීමක් පැවරෙනවා.

# ධන බල පරදා
# දන බල දිනූ දා



**වසන්ත දිසානායක**

ශ්‍රී ට වසර 108කට පෙර ඔක්තෝබර් මස 25 දින ලෝක ඉතිහාසයේ අතිශයින් ම වැදගත් ඓතිහාසික සංසිද්ධියක් ඇති වුණා. ඒ, මහාද්වීප දෙකක් පුරා පැතිරුණු ලෝකයේ විශාලතම රට වූ රුසියාවේ සිදු වූ ඔක්තෝබර් විප්ලවය. ලෝක ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් වූ එම ඓතිහාසික සිද්ධිය අඳුරුවන් කිරීමේ විවිධ ප්‍රයත්න පැවතුණේ හා පවතින්නේ වුව ද මේ වන විට ලෝකයේ පවත්නා සිදුවීම් දෙස බලන විට එහි අත්දැකීම් යළි සැලකිල්ලට ගැනීමේ වැදගත්කම ඉහළ යමින් පවතිනවා.

1917 ඔක්තෝබරයේදී රුසියාවේ මෙන් දුර දිග යන වෙනස්කම්වලට පදනම් දමන ලද ජනතා නැගීටීම්වලින් පාලකයන් පන්නා දැමීම සිදු නොවුණත් පැතිරුණු ජන නැගිටීම් ඔස්සේ බලයේ සිටි පාලකයන් පෙරළා දමා නව පාලනයන් පිහිටුවීම 1917 රුසියාවේ ඔක්තෝබර් විප්ලවයට පෙර සිදු වූවා මෙන් ම සැලකිය යුතු තරම් දීර්ඝ කාලයකට පසු ද දැනුදු සිදුවෙමින් පවතින බව නිරීක්ෂණය කළ හැකියි. මේවා විශාලතම ජන සහභාගී නැගීසිටීම්. 1871 පැරිස් කොමියුනය, 1917 රුසියාවේ සාර් බලයෙන් පහ කළ පෙබරවාරි විප්ලවය, 1979 ඉරාන විප්ලවය, 1986 පිලිපීන එඩ්සා විප්ලවය, 2010 ටියුනීසියන් විප්ලවය, 2022 ශ්‍රී ලංකාවේ ජන නැගිටීම, 2025 බංගලි දේශ හා නේපාල ජන නැගිටීම් යනු ජන නැගිටීම්වලින් පාලකයන් පෙරළා දමා නව පාලන පිහිටුවීම පිළිබඳ නිදසුන්. එහෙත් නිරීක්ෂණය කළ හැක්කේ මේ කිසිදු ජයග්‍රාහී ජන නැගිටීමකට රුසියාවේ ඔක්තෝබර් විප්ලවය බඳු විප්ලවීය

1917 පෙබරවාරි විප්ලවයේදී සිදු වූයේ කම්කරුවන්ගේ, ගොවියන්ගේ හා සෙබළුන්ගේ අරගලයෙන් සාර් පාලනය පෙරළා දැමුව ද කම්කරුවන්ගේ, ගොවියන්ගේ හා සෙබළුන්ගේ ආණ්ඩුවක්වත් තනිකර මහ ධනපති හා ඉඩම් හිමි ධනපති පාන්තික ආණ්ඩුවක්වත් ඇති නොවීම. මේ බලවේග දෙක ම තමන්ගේ ම ආණ්ඩු පිහිටුවා ගැනීමට තරම් ශක්තිමත් වූයේ නැහැ. ප්‍රතිඵලය වූයේ ධනපති හා සුළු ධනපති දෙමුහුන් නිල ආණ්ඩුවක් ඇති වීම හා සෝවියට් සභා නමින් කම්කරුවන්ගේ, ගොවියන්ගේ හා සෙබළුන්ගේ නොනිල ආණ්ඩුවක් ඇතිවීම. ද්විත්ව බලයක් පැන නැගීම.

විපර්යාසයකට මං පෑදිය නොහැකි වූ බව. පාලකයන් වෙනස් වීම හැර ජන අරගලවලින් ඉල්ලා සිටි අත්‍යවශ්‍ය වෙනස්කම් සපුරාලීමට මේ අරගල කිසිවක් සමත් ව නැහැ. විප්ලවයෙන් ඉල්ලා සිටින අතිමූලික වෙනස්කම් රැසක් සාධනය කිරීමට සමත් වූයේ රුසියාවේ ඔක්තෝබර් විප්ලවය හා සමාන විප්ලව මගින් පමණයි. එහෙයින් විශේෂයෙන් ම ඔක්තෝබරයේදී, ඔක්තෝබර් විප්ලවය හා බැඳුණු ක්‍රියාදාමය විමසා බැලීම වැදගත්.

පූර්ව විප්ලවීය රුසියාව පරිපූර්ණ වශයෙන් ම කම්කරුවන්, ගොවියන්, සෙබළුන් ඇතුළු අතිබහුතර ජනතාවගේ මෙන් ම රුසියානු නොවන ජාතීන්ගේ ද සිර ගෙයක් ව පැවතුණා. එහි පාන්, ඉඩම්, සාමය පදනම් ඉල්ලීම් බවට පත් ව තිබූ අතර නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය ඒ හා වෙන් කළ නොහැකි සේ එකට බැඳී තිබුණා. රුසියානු සමාජය පැවතුණේ දරිද්‍රතාවේ, පීඩනයේ, වහල්භාවයේ ඉහළ ම සංකේන්ද්‍රිත භූමියක් ව. එය ලෝකයේ වැඩියෙන් ම වැඩවර්ජනවලින් පිරි, ගොවි නැගිටීම්වලින් හා කැරලිවලින් පිරි, මර්දනයෙන් හා දණ්ඩනවලින් පිරි දේශය බවට ද පත් ව තිබුණා.

1917 ජූලියේදී විශේෂයෙන් කම්කරුවන්, සෙබළුන් හා නාවිකයන් දහස් ගණනින් නොව දස දහස් ගණන්වලින් වීදි බසිමින් හඬ නැගුවේ "සියලු බලය සෝවියට් සභා අතට" ගන්නට කියා. පෙත්‍රෝග්‍රෑඩ් සෝවියට් සභා මූලස්ථානය පැවති ටෝරිඩ් මාලිගය (රාජ්‍ය ඩූමාව-පාර්ලිමේන්තුව පැවතියේ ද මෙහි) වෙත පැමිණි පෙළපාලිකරුවන් හඬ නැගුවේ එසේ. එහෙත් මේ වන විට සෝවියට් සභා, බලය ගැනීමට සූදානමක් දැක්වූයේ නැහැ.

පැවති අතිවිෂම හා පීඩාකාරී තත්ත්වයට එරෙහි ව කම්කරුවන් හා ගොවියන් ඇතුළු පීඩිත ජනයා දිගින් දිගට ම අරගල කරන්නට වුණා. මේ අරගලයේ කැපී පෙනෙන වැදගත් ම සංසිද්ධියක් වන්නේ 1917 පෙබරවාරි විප්ලවය. මේ විප්ලවය පැන නගින්නේ රදළ ඉඩම් හිමියන්, පැරණි නිලධාරි තන්ත්‍රය හා ඉහළ මිලිටරි බලයන් නියෝජනය කළ අත්තනෝමතික සාර් පාලනයට එරෙහි ව. විප්ලවයේ පෙරමුණු සටන්කරුවන් වූයේ පහළ ම පන්තිවලට අයත් කම්කරුවන්, ගොවියන් හා සොල්දාදුවන් ඇතුළු පහළ පාන්තික ජනයා. මේ බලවේග දෙක අතර අත්තනෝමතික සාර් පාලනය පෙරළා දමන එනමුත් ඒ වෙනුවට කම්කරුවන්ගේ, ගොවියන්ගේ හා සෙබළුන්ගේ පාලනයක් ඇතිවීමට ඉඩ නොදෙන ධනේශ්වර පාලනයක් ස්ථාපිත කිරීම සඳහා සටන් වැදුණු මහ ධනපති පන්තිය හා ඉඩම්හිමි ධනපති පන්තිය වුණා. 1917 පෙබරවාරි විප්ලවයේදී සිදු වූයේ කම්කරුවන්ගේ, ගොවියන්ගේ හා සෙබළුන්ගේ අරගලයෙන් සාර් පාලනය පෙරළා දැමුව ද කම්කරුවන්ගේ, ගොවියන්ගේ හා සෙබළුන්ගේ ආණ්ඩුවක්වත් තනිකර මහ ධනපති හා ඉඩම් හිමි ධනපති පාන්තික ආණ්ඩුවක්වත් ඇති නොවීම. මේ බලවේග දෙක ම තමන්ගේ ම ආණ්ඩු පිහිටුවා ගැනීමට තරම් ශක්තිමත් වූයේ නැහැ. ප්‍රතිඵලය වූයේ ධනපති හා සුළු ධනපති දෙමුහුන් නිල ආණ්ඩුවක් ඇති වීම හා සෝවියට් සභා නමින් කම්කරුවන්ගේ, ගොවියන්ගේ හා සෙබළුන්ගේ නොනිල ආණ්ඩුවක් ඇතිවීම. ද්විත්ව බලයක් පැන නැගීම.



ද්විත්ව බලය හේතුකොටගෙන කිසිවකුට තනි ව පාලනයක් ගෙන යා නොහැකි වුණා. ඒ අනුව සාර් බලයෙන් පහ කළ පෙබරවාරි විප්ලවයෙන් පසු මහ ධනපති හා ඉඩම් හිමි ධනපති පන්තිය නියෝජනය කළ ඔක්තෝබ්‍රිස්ට්වරුන් හා කෑඩෙට්වරුන් ද සෝවියට් සභාවල වැඩි බලය හිමිකරගෙන සිටි මෙන්ෂෙවික්වරුන් හා සමාජවාදී විප්ලවවාදීන් ද එක් ව 1917 මාර්තු 2 දින තාවකාලික ආණ්ඩුවක් පිහිටුවූවා. අභ්‍යන්තර කටයුතු, යුද කටයුතු හා විදේශ කටයුතු යන වැදගත් ඇමති පදවි ඔක්තෝබ්‍රිස්ට්වරුන් හා කෑඩෙට්වරුන් අතට ගැනුණු අතර සමාජවාදී විප්ලවවාදීන්ට හා මෙන්ෂෙවික්වරුන්ට ලැබුණේ දෙවැනි පෙළේ ඇමතිකම්. බොල්ෂෙවික්වරුන් ආණ්ඩුවේ පාර්ශ්වකරුවන් නොවූව ද රුසියාවේ වැඩ කළ බොල්ෂෙවික් නායකයන්ගේ (උදා. කමනෙව්, ස්ටාලින්) ස්ථාවරය වූයේ තාවකාලික ආණ්ඩුවට සහය දිය යුතු ය යන්න. ලෙනින් සිටියේ සහය නොදිය හා සියලු බලය සෝවියට් සභාවලට යන ස්ථාවරයේ.

පෙබරවාරි විප්ලවයේදී සාර් බලයෙන් පහ කර රාජාණ්ඩුව පෙරළා දමා නව ආණ්ඩුවක් බලයට පත් වුව ද ආමන්ත්‍රණය කළ යුතු ව තිබූ කිසිදු ප්‍රශ්නයකට එම ආණ්ඩුව ආමන්ත්‍රණය කළේ නැහැ. පැරණි ආණ්ඩුවේ මූලික ප්‍රතිපත්තිවලින් කැඩුණේ නැහැ. ප්‍රතිඵලය වූයේ පැවති ප්‍රශ්න පැවතියාටත් වඩා උත්සන්න වීම. පොරොන්දු වූ පරිදි යුද්ධයෙන් ඉවත් වූයේ නැහැ. ජූලි මාසයේ දින ගණනාවකදී යුද්ධයෙන් මරුමුවට පත් වූ හා අකර්මණ්‍ය තත්ත්වයට පත් වූ සෙබළුන් ගණන 400,000ක් පමණ වුණා. කම්කරුවන්ට පාන්, සෙබළුන්ට සාමය, ගොවියන්ට ඉඩම් ලැබුණේ නැහැ. සියලු බලය සෝවියට් සභාවලට යන සටන් පාඨය පෙරටු කරගෙන කම්කරුවන්, සෙබළුන් වීදි බසින්නට වුණා. ගොවි ජනයා ඉඩම් ඉල්ලා සටන් බිමට අවතීර්ණ වුණා. විප්ලවීය වඩදිය රැල්ලක් රුසියාව පුරා පැතිරෙන්නට වුණා.

මෙය වැදගත්. 1917 ජූලියේදී විශේෂයෙන් කම්කරුවන්, සෙබළුන් හා නාවිකයන් දහස් ගණනින් නොව දස දහස් ගණන්වලින් වීදි බසිමින් හඬ නැගුවේ "සියලු බලය සෝවියට් සභා අතට" ගන්නට කියා. පෙත්‍රෝග්‍රෑඩ් සෝවියට් සභා මූලස්ථානය පැවති ටෝරිඩ් මාලිගය (රාජ්‍ය ඩූමාව-පාර්ලිමේන්තුව පැවතියේ ද මෙහි) වෙත පැමිණි පෙළපාලිකරුවන් හඬ නැගුවේ එසේ. එහෙත් මේ වන විට සෝවියට් සභා, බලය ගැනීමට සූදානමක් දැක්වූයේ නැහැ. ඒවා මෙන්ෂෙවික්වරුන්ගේ හා සමාජවාදී විප්ලවවාදීන්ගේ මෙහෙවීමෙන්

තාවකාලික ආණ්ඩුවේ හවුල්කරුවන් බවට පත් ව තිබුණා. ඒ තත්ත්වය යටතේ සෝවියට් සභාවලට බලය ගියා කියා සාධනීය වෙනසක් ඇති වන්නට හැකි ව තිබුණේ නැහැ. සමාජවාදී විප්ලවවාදී පක්ෂ නායක වික්ටර් චර්නොව් පෙළපාළිකරුවන් අමතා තාවකාලික ආණ්ඩුවට තවදුරටත් ඉදිරියට යාමට ඉඩ දිය යුත්තේ මන්දැයි පැහැදිලි කරන්නට ගිය විට එක් පෙළපාළිකරුවක් ඔහුට කියා තිබුණේ "බැල්ලිගෙ පුතෝ බලය උඹලා අතට දුන්නා ම ඒක ගනිල්ලා" කියා ය.






ඔහු ව ප්‍රාණ ඇපකරුවෙකු ලෙස ගැනුණු අතර මේ වන විට අරාජකවාදී යොමුවකට පත් ව සිටි විප්ලවීය සෙබළුන්ගෙන් ඔහු ව බේරාගෙන ඇත්තේ ට්‍රොට්ස්කි. ට්‍රොට්ස්කි ද ඉල්ලා සිටියේ මේ මොහොතේ තාවකාලික ආණ්ඩුව සමග විවෘත ගැටුමකට නොයා යුතු බව. අනතුරු ව පෙළපාළිකරුවන් ලෙනින්ගෙන් ධනාත්මක පිළිතුරක් ලැබීමේ අපේක්ෂාවෙන් ගියේ බොල්ෂෙවික් මූලස්ථානය කරා. එහෙත් ලෙනින්ගෙන් ද දිරි ගන්වන පිළිතුරක් ලැබුණේ නැහැ. ලෙනින්ගේ අදහස වූයේ අසංවිධිත නැගී සිටීමක් අසාර්ථක වනු ඇත කියා. අනතුරු ව අරාජිකවාදී පෙළඹුකින් ක්‍රියාකාරී වෙමින් සිටි අතෘප්තියට පත් පෙළපාළිකරුවන් සටන් පාඨ කියමින් නගරයේ වීදි පුරා සැරිසරමින් ප්‍රචණ්ඩ ලෙස හැසිරෙන්ට වුණා. ප්‍රතිඵලය වූයේ ආණ්ඩුව හමුදාව යොදවා පෙළපාළිකරුවන්ට පහර දීම. ඇති වූ ගැටුම්වලදී 700ක් පමණ දෙනා මරුමුවට පත් වූ බව වාර්තා වෙනවා. ලෙනින් අත්අඩංගුවට ගැනීමට නියෝග කෙරුණ අතර ට්‍රොට්ස්කි, කමනෙව් හා ලූනාචාස්කි යන නායකයන් අත්අඩංගුවට ගැනුණා. ලෙනින් හා සිනොවියෙව් රහසිගත ව පින්ලන්තයට යැවුණා. අසංවිධානාත්මක අරාජිකවාදී නැගිටීම පරාජයට පත් වුණා.

ලෙනින් "සියලු බලය සෝවියට් සභාවලට" යන්න ඉදිරිපත් කළේ පළමු ව විප්ලවයේ සාමකාමී වර්ධනයක් පැවති හා යථාවක් බවට පත්කර ගත හැකි ව තිබූ තත්ත්වයක් යටතේ. අනතුරු ව ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය සඳහා වූ සටන් පාඨයකට (a slogan for action) වඩා ප්‍රචාරක සටන් පාඨයක් (A slogan for propaganda) වශයෙන්. සෝවියට් සභාවල බහුතරය බොල්ෂෙවිකයන් ඇතුළු විප්ලවවාදීන් අතට පත් නොවී "සියලු බලය සෝවියට් සභාවලට" යන්න ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය සඳහා වූ සටන් පාඨයක් ලෙස ගත නොහැකිය යනු ලෙනින්ගේ අදහස වුණා.

1917 ජූලි වන විට සෝවියට් සභාවල බලය පැවතියේ ද ධනේශ්වර තාවකාලික ආණ්ඩුවේ හවුල්කරුවන් බවට පත් ව සිටි මෙන්ෂෙවික්වරුන් හා සමාජවාදී විප්ලවවාදීන් අත. ඔවුන් ධනපති පන්තිය අත්හැර බලය ලබා ගැනීමට සූදානම් වූණේ නැහැ. විප්ලවීය පරිවර්තනයකට විරුද්ධ ව සිටියා. මේ වන විට මෙන්ෂෙවික්වරුන් හා සමාජවාදී විප්ලවවාදීන් යටතේ සෝවියට් සභා පත් ව සිටි තත්ත්වය පිළිබඳ ව ලෙනින් පැහැදිලි කළේ "මේ මොහොතේ සෝවියට් සභා හරියට ම මස් මඩුවට දක්කාගෙන ආ බැටළුවෙක් පිහිය යට බැ ගානවා වගේ" ය කියා.

එහෙත් ඔක්තෝබරය වන විට මුහුකුරා ගිය එවැනි තත්ත්වයක් රුසියාවේ පැන නැගී තිබුණා. සියලු බලය සෝවියට් සභා අතට ගැනීමේ තත්ත්වයක් නිර්මාණය වෙමින් තිබුණා. සෝවියට් සභා තුළ විප්ලවවාදීන්ගේ බලය වර්ධනය වෙමින් තිබුණා. "සියලු බලය සෝවියට් සභාවලට" යන්න වැඩ කරන ජනයාගේ කම්කරුවන්ගේ, ගොවින්ගේ හා සෙබළුන්ගේ ක්‍රියාකාරිත්වය සඳහා වන ප්‍රායෝගික සටන් පාඨය (slogan for action) බවට පත් ව තිබුණා. අවශ්‍ය වූයේ නිසි මොහොතේ ප්‍රමාද නොවී සෝවියට් සභා අතට බලය ලබා ගැනීමේ තීන්දුව ගැනීම. විප්ලවයක් සඳහා තත්ත්ව මෝරා තිබුණ ද බලය ලබා ගැනීමේ 'මොහොත' නිවැරදි ව තීරණය නොකරන්නේනම් විප්ලවය පරාජය විය හැකි ව තිබුණා. ට්‍රොට්ස්කි වැනි නායකයන් පවා නැගිටීමේ තීරණය පැවැත්වීමට නියමිත ව තිබූ සෝවියට් සභා සමුළුව තෙක් නැගිටීම කල් දමන්නට යෝජනා කරද්දී ලෙනින් දැඩි ලෙස කියා සිටියේ තීන්දුව ඒ දක්වා කල් දැමිය නොහැකි බව. නිසි අවස්ථාවේ ගත යුතු තීරණය ගැනුණා. ලේ බිඳක් නොසොල්වා විප්ලවය ජයග්‍රහණය කළා.



# භාරතීය සිනමාවේ රතු තිලකය මොලිවුඩ්

**සුභා රත්නායක**

සිනමාව යනු ඕනෑ ම සංස්කෘතික අවකාශයකදී වඩා වැඩි ආකර්ෂණයක් සහ බරක් දරා ගන්නා මාධ්‍යයක්. ලෝකයේ දැවැන්තම සිනමා කර්මාන්තය වන (වසරකට නිපදවන චිත්‍රපට සංඛ්‍යාවට අනුව) බොලිවුඩ් (Bollywood) සිනමාව (හින්දී සිනමාව) දශක ගණනාවක් ඉන්දියාවේ සහ දකුණු ආසියාවේ පමණක් නොව ඉන් ඔබ්බට ගොස් ලෝකයේ ම ප්‍රේක්ෂක හදවත්වල ප්‍රබල සංස්කෘතික බලපෑමක් එල්ල කිරීමට සමත් වුණා. මියුරු සංගීතය, ගීත, පවුල් සම්බන්ධතා, කඳුළු සැලීමේ භාග්‍යවන්තකම වැනි පෙරදිග සතු වටිනා සංස්කෘතික උරුම බටහිරට පවා දායාද කරන්නට එවකට සමත් වුණේ හින්දී සිනමාව. විශේෂයෙන් 1900-2004 යන කාල සීමාවේ හින්දී සිනමාව අත්පත් කර ගනිමින් තිබුණේ, ලෝකයේ බලවත් දේශපාලන අධිකාරිත්වයකට පවා අභියෝග කළ හැකි ලෝක අවධානයක් සහ ආකර්ෂණයක්. එයට බලපෑ ප්‍රධාන ම සාධකය වූයේ මිනිසුන්ගේ මූලික සහ ආභ්‍යන්තරික හැඟීම් සමඟ ඒකාබද්ධ වූ රිද්මයක් හින්දී සිනමාවේ තැවරී තිබීම. එහෙත් අද වන විට හින්දී සිනමාව වාණිජමය ලක්ෂණ සහිත කර්මාන්ත සංස්කෘතියක හැඩය වඩා බරපතළ ලෙස දරා ගනිමින් තිබෙනවා. ඊට සමගාමී ව ඉන්දියාවේ ප්‍රාන්තීය සිනමාව කෙරෙහි ප්‍රේක්ෂක ආකර්ෂණය, අවධානය සහ ආසක්තභාවය වැඩිවීම පැහැදිලි ව පෙනෙන්නට තිබෙන්නක්. විශේෂයෙන් දකුණු ඉන්දියානු සිනමාවත් ඒ අතරිනුත් මලයාලම්, කන්නඩ, තෙළිඟු මෙන් ම





ගුජරාතී, බෙංගාලී වැනි උතුරු ඉන්දියානු ප්‍රාන්තීය සිනමාවත් ඉතා ප්‍රබල සංස්කෘතික අංගයක් ලෙස ඉන්දියානු පොළොවේ සැබෑ පරිමාව දරා ගනිමින් සිටිනවා. ඒ අතරිනුත් මලයාලම් සිනමාව ඉන්දියානු දේශසීමා තරණය කරමින් විදේශීය ප්‍රේක්ෂකාගාරයේ හදගැස්ම පවා වෙනස් කිරීමට සමත් ප්‍රබල ආම්පන්න සහිත සිනමාවක් බවට ඔප්පු වී අවසන්. ඒ කුමක් නිසා ද?

සමාජයක් තම වටිනාකම් සහ උරුමය අභිමානයක් ලෙස සලකන ඕනෑ ම අවස්ථාවකදී නව ප්‍රවණතා, විලාසිතා, නූතනත්වය, සහ සමකාලීනත්වය යන සාධකවලට එම සමාජයේ මුල් සාරය අවශෝෂණය කිරීමේ හැකියාව අවම කරවනවා. ඉන්දියානු ප්‍රාන්තීය සිනමාව තම ක්ෂේත්‍රීය විශේෂත්වය වන උරුමය සහ වටිනාකම පැවැත්ම ලෙස සැලකීම මෙහිදී කැපී පෙනෙන්නක්. 2005න් පසු ගොඩනැගෙන හින්දී සිනමාව ආරෝපිත ශෝභනයක් සහිත සෝෂාකාරීත්වයෙන් සහ කෘත්‍රිම ව දිලිසීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම හේතුවෙන් ලෝකයේ ඕනෑ ම පුද්ගලයෙකුගේ හැඟීම් සමග බද්ධවීමේ සම්භාවිතාව අහිමි කරගනිමින් සිටිනවා. සුප්‍රසිද්ධ චිත්‍රපට අධ්‍යක්ෂ යශ් චොප්රාගේ මියයෑම සමඟ හින්දී සිනමාවේ ප්‍රේමය ද මිය යනවා. ඉන්දියානු ප්‍රාන්තිය සිනමාවේ මේ කෘත්‍රිම සහ ආරෝපිත ශෝභන සහිත ලක්ෂණ අවම වීමත් මිනිස් හැඟීම්වල ගැඹුරු ආස්ථානයකට ආමන්ත්‍රණය කිරීමට හැකිවීමත් ප්‍රේක්ෂකයාට එකතු කරන්නේ බලපෑම් සහගත අත්දැකීමක්. මලයාලම් සිනමාව එහි ප්‍රබල අත්දැකීමක්.

ඉන්දියාවේ දකුණු දිග ප්‍රාන්තයක් වන කේරළය මුල්කරගනිමින් ගොඩනැගී ඇති මලයාලම් සිනමාව මොලිවුඩ් ලෙස ද ප්‍රසිද්ධයි. සහකම්පනය, යථාර්ථවාදය, සමාජ සන්දර්භය කෙරෙහි දැඩි ලෙස බද්ධවීම මත මලයාලම් සිනමාව බොලිවුඩ්වලින් සූක්ෂ්ම ලෙස තම සාරය වෙන් කර ගැනීමට සමත් වී තිබෙනවා. සමාජය හා බද්ධ වන කථාවස්තු, චරිත, සිද්ධි සහ සංවාද මානවභාවයක ඇති

විශ්වසනීයත්වය සුරකිමින් සිනමාව මත දිගහැරීම යන කාරණය නිසා තම භූමියේ වටිනාකම සහ උරුමය ප්‍රතිබිම්බනය කරන කැඩපතක් ලෙස මලයාලම් සිනමාව හඳුන්වාදිය හැකියි. එය විනෝදාස්වාදයට එහා ගිය ප්‍රගතිගාමී මාවතක් සනිටුහන් කරන ලක්ෂණයක් නිසා ස්ත්‍රිය සහ තාරුණ්‍යය පිළිබඳ ව ද මලයාලම් සිනමාව විවෘත කරන්නේ වෙනස් ම කතිකාවක්.

සිනමාකරණයේ ඉන්දියානු සම්ප්‍රදායේ සුවිශේෂ ස්ථානයක් අත්පත් කර ගැනීමට මලයාලම් සිනමාව ආරම්භයේ සිට ම සමත්. අදූර් ගෝපාල් ක්‍රිෂ්ණන් සහ ජේ. අරවින්ද වැනි විශිෂ්ට සිනමාකරුවන්ගේ සිට 21 වැනි සියවසේ නව පරම්පරාවේ සිනමාව දක්වා මලයාලම් සිනමාව සමාජයේ කැඩපතක් සේ ම මිනිසාගේ ආභ්‍යන්තරික හැඟීම් සමග කරට කර බද්ධ වන කතා කියන්නෙකු ලෙසත් තම මෙහෙවර ඉටුකරමින් තිබීම විශේෂත්වයක්.

පොදු මිනිසාගේ ජීවන භාවිතාව නියෝජනය කරන මලයාලම් සිනමාව සමාජ පරිවර්තන සහ සමාජ අරගල මෙන් ම මිනිස් බලාපොරොත්තු කෙරෙහි ප්‍රේක්ෂකයා ව මෙහෙයවන්නේ විශිෂ්ට නවකතාවක් තරම් බලසම්පන්නභාවයකින්. එහිදී මලයාලම් සිනමාව දරා ගන්නා රිද්මය ඉතා සුවිශේෂ වනවා. මලයාලම් සිනමාව අපට යෝජනා කරන්නේ හුදු දැනුමක්, උපදේශයක්, විනෝදාස්වාදයක් නොව මිනිස් හැඟීම් කලාපයක්. එය සංවේදනශීලීත්වය පිළිබඳ අදහසක්. මලයාලම් සිනමාව අලුතින් හඳුන්වා දෙන න්‍යායික මානය වන්නේ ප්‍රේක්ෂකයාට තමා ව ම නැවත විඳ ගැනීමට ඇති හැකියාව සලස්වා දීම. එහිදී විශේෂයෙන් සමාජයේ පරිහාසාත්මක විෂමතා සහ එහි ත්‍රාසය, අඳුරු බව, ප්‍රචණ්ඩ බව, පීඩාකාරී බව අනාවරණය කරන්නේ සරදම්කාරී ලෙස හෝ වෛරීසහගත ලෙස හෝ නොවෙයි. එය මතු පිටින් ඉතා සාමකාමී ලෙස සිනමා කෘතියේ නිර්මාණය වන අතර සිනමාකරුවා වග බලා ගන්නේ අභ්‍යන්තරයේ ඇති දරුණු අගතීන් ඉතා සියුම් ලෙස ඉස්මතු කිරීමට. කාලී, කම්මට්ටිපාඩම්, කුම්භලාග්නි නයිට්ස් වැනි සිනමා සිත්තම් එයට කදිම උදාහරණ. එම ඉස්මතු කිරීමට යොදා ගන්නේ විචාර, චින්තන පද්ධති, සිද්ධි, ස්ථාන චරිත නොව හැඟීම්වලට ප්‍රමුඛස්ථානය ලබා දීම. එම නිසා මලයාලම් සිනමාවේ නිර්මිත සංවේදනශීලීත්වය සහ මිනිස් ජීවිතයේ යථාර්ථය අතර දැක්වෙන විභේදනයේ පරතරය බොහෝ විට අවමයි. ඒ හේතුවෙන් විනෝදාස්වාදයක් ලෙස ශීඝ්‍රයෙන් වාෂ්ප වී යාමේ ගුණය වෙනුවට මතකයක් ලෙස මලයාලම් සිනමාව ප්‍රේක්ෂක හදවත් තුළ ස්ථිර ලෙස රැඳී පවතිනවා.

හින්දී සිනමාවේ විශිෂ්ට රංගධරයකු වන මනෝජ් වාජ් පායි සම්මුඛ සාකච්ඡාවකදී මෙසේ පවසනවා. “අද හින්දී සිනමා නිර්මාණකරුවා නැවුම්භාවයක් ගැන හැමවිට ම කතා කරනවා. නැවුම් කතාවක්, නැවුම් නළු නිළියන්, රූගත කරන ස්ථානවල නැවුම් බව, තාක්ෂණය නැවුම් බව වගේ දේවල්. මේ නැවුම්භාවය පසුපස හඹා යෑම තුළ සිනමාව ඔස්සේ ප්‍රේක්ෂකයා සංවේදනය කිරීම අමතක වී යනවා. එදා සත්‍යජිත් රායිගේ සිනමා කෘති, ශ්‍යාම් බැනගල්ගේ සිනමා නිර්මාණ වෙනත් කිසිවකුට චරිත එහා මෙහා කිරීමෙන්, සංවාද හා මෙහා කිරීමෙන්, අලුත් අන්තයක් එකතු කිරීමෙන් හෝ අලුත් නළු නිළියන් එකතු කිරීමෙන් හෝ සංස්කරණය කර නැවත ගොඩනැගීමට බැරි සිනමා නිර්මාණ. ඒ තරමට ඒවා ප්‍රේක්ෂකයා අත්විඳින්නේ පූර්ණ යථාර්ථයක් ලෙස. හින්දී සිනමාවේ පැවති මේ ගුණය දැන් කෙමෙන් කෙමෙන් අහිමි වී යනවා”

මූල මැද අග පරිපූර්ණ ලෙස නොගැළපෙන, සරල සාමාන්‍ය මිනිස් අත්දැකීම් මලයාලම් සිනමාවේ කතා වස්තුව බවට පත්වෙනවා. ඒවා ගැඹුරු බුද්ධියකින්, චින්තන පද්ධතියකින් විශ්ලේෂණය කිරීමට අවශ්‍ය නොවන අතිශය සාමාන්‍ය අත්දැකීම් ලෙස ද කෙනෙකුට විග්‍රහ කළ හැකියි. එහෙත් සමස්ත මානව ඉතිහාසය ම ගොඩනැගී ඇත්තේ මිනිසාගේ සරල, සාමාන්‍ය අත්දැකීම්වලින් බව අප අමතක නොකළ නොයුත්තක්.

2018 වසරේදී තිරගත වූ ‘සුඩානි ඔෆ් නයිජීරියා’ චිත්‍රපටය තිර රචනයකට අනුව අධ්‍යක්ෂණය කරන ලද, නළු නිළියන් විසින් රඟපාන ලද චිත්‍රපටයක් ලෙස සැලකීමට වඩා ජීවිතයේ ම පක්ෂයක් ලෙස අපට හමුවීම සාකච්ඡාවට ලක් කළ යුත්තක්. මලයාලම් සිනමාවේ මේ ශෛලිය ප්‍රාන්තීය ලක්ෂණ සහිත ව පවා විශ්වීය ස්ථරය තුළ ප්‍රේක්ෂකයා ව සහකම්පනයට ලක් කරනවා. සම්පූර්ණ සුදු ද කළු ද නොවන විටෙක ඉතා සරල, ඇතැම් විටෙක අතිශය සංකීර්ණ පුද්ගලභාව උරුම චරිත මලයාලම් සිනමාව සිත්තම් කරන්නේ ගැඹුරු මානවීය බවකින්. ‘කුම්බලාග්නි නයිට්ස්’ එයට ඉතා කදිම උදාහරණයක්.

නූතන හින්දී සිනමාවට සාපේක්ෂ ව සමාජය විචාරය ලක් කිරීම සහ ආත්ම චින්තාව පිළිබඳ සංකථනය සඳහා බලපෑම්සහගත වේදිකාවක් නිර්මාණය කිරීම මලයාලම් සිනමාවේ ඓතිහාසික වැදගත්කමක්. 2010න් පසු ආරම්භ වන නව පරම්පරාවේ සිනමා පෙරළිය ඔස්සේ පවා මේ ලක්ෂණ රැක ගැනීමට මලයාලම් සිනමාව වගබලාගෙන තිබීම සුවිශේෂයි. එහිදී කාන්තාව සහ තාරුණ්‍යය සිනමාවේ කේන්ද්‍රය බවට පත්කර ගැනීම අවධානය යොමු කළ යුතු කරුණක්. The great Indian kitchen, How old are you වැනි සිනමා නිර්මාණ එයට නිදසුන්. නව පරම්පරාවේ සිනමා පෙරළිය තුළ බිහිවූ සිනමා නිර්මාණ පවා ආර්ථික අර්බුදය, සමාජ අරගලය, පරම්පරා ඝට්ටනය, සංස්කෘතික මතභේද අතර ගැටුම ප්‍රධාන චරිත ඔස්සේ ඉස්මතු කිරීමට උත්සාහ ගෙන තිබෙනවා. 2015 වසරේදී තිරගත වූ ‘ප්‍රේමම්’ නව පරපුරේ සිනමා පෙරළියේ උච්චතම අවස්ථාවක්. එහෙත් ප්‍රේමම් චිත්‍රපටය පවා හුදු ප්‍රේම වෘත්තාන්තයක් නොවන අතර ප්‍රේමය, පුද්ගල අනන්‍යතාව සහ සමාජයේ පුද්ගලයාට හිමි ස්ථානය ගොඩනැගීමට නූතන තරුණයා දරන වෙහෙස පිළිබඳ සජීවී සිත්තමක්.

පුළුල් තිරය පුරා තම අණසක පතුරවන මලයාලම් සිනමා නළු නිළියන් ද බොලිවුඩයේ නළු නිළියන්ට සාපේක්ෂ ව ස්වාභාවිකත්වය පිළිබඳ සංකේතයක්. Zero finger, Six Pack වැනි ශරීර ආකෘති සාදා ගැනීම වෙනුවට උපන් සහ ස්වාභාවික ලක්ෂණ සහිත පෙනුමකින් ම එම නළු නිළියන් රංගනයේ යෙදෙනවා. මුහුණ පුරා දක්නට හැකි ලප කැළැල්, කුරුලෑ, පුද්ගලයෙකුට උපතේදී හිමිවන සාමාන්‍ය සමේ වර්ණය, ප්ලාස්ටික් සැත්කම් මගින් පරිපූර්ණ සුන්දරත්වයක් කරා ගමන් නොකිරීම තවමත් මලයාලම් නළු නිළියන්ගේ කැපී පෙනෙන ලක්ෂණ.

එහෙත් අද වන විට උතුරු ඉන්දියාවේ විශේෂයෙන් හින්දී කලාපීය සමාජය බටහිර අනුකරණයට දැඩි ලෙස නැඹුරු වෙමින්, නූතනත්වයේ දඩයම බවට පත්වෙමින්, අහිතකර පරිවර්තනයකට ගොදුරු වෙමින් තිබෙනවා. එහි රුදුරු සෙවණැලි සිනමාව ද වසාගෙන තිබෙනවා. මේ පරිවර්තනය ඔස්සේ හින්දී සිනමාවට අත්පත් වී තිබූ ‘කතාන්දර කීමේ විශිෂ්ට කලාව’ තුළ පෙර තිබූ මානවභාවය අද වන විට පවතින්නේ ගිලිහෙමින්. එය හින්දී සිනමාව ඉදිරියේ පවතින දැවැන්ත ඛේදවාචකයක්.



# පුනරුදයට කියවමු

හර්ෂා සුගතදාස

මේ එළඹ තිබෙන්නේ ජාතික කියවීමේ මාසය. 'ඔක්තෝබර් මාසය' ජාතික කියවීමේ මාසය ලෙස නම් කිරීමට මූලිකත්වය ගත්තේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය. ඒ, සාහිත්‍ය මාසය වන 'සැප්තැම්බර් මාසයේ' පොත් ප්‍රදර්ශනවලින් මිලදී ගත් පොත් කියවීමට පෙලඹවීමක් ඇති කිරීමේ අරමුණින්. ජාතික කියවීමේ මාසය ආරම්භ වුණේ 2004 වසරේදී. එතැන් සිට සෑම වසරකදී ම යම් තේමාවක් ඔස්සේ ජාතික කියවීමේ මාසය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. මේ වසරේ ජාතික කියවීමේ මාසයේ තේමාව වන්නේ 'පුනරුදය උදෙසා කියවමු' යන්න. එයින් කියැවෙන්නේ වත්මන් සමාජය පුනරුද යුගයට පෙළ ගැසෙමින් සිටින නිසා පොත් පත් කියවීමෙන් එයට එලදායී ව මැදිහත්වීමේ අවශ්‍යතාව අවධාරණය කිරීම.

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ විශ්‍රාමික මහාචාර්ය අනුර වික්‍රමසිංහ පොත් කියවීමෙන් ලැබෙන ප්‍රයෝජන 10ක් සඳහන් කරනවා. පොත්පත් කියවීමේ වටිනාකම සාක්ෂාත් කිරීමට එය ම ප්‍රමාණවත්. මානසික උත්තේජනයක් ලැබීම (මොළයට හොඳ ව්‍යායාමයක් ලැබීම), ආතතිය අඩු කිරීම, දැනුම් සම්භාරය පුළුල් කිරීම, ශබ්දකෝෂය වර්ධනය වීම, මතක ශක්තිය වර්ධනය කිරීම, සිතීමේ හැකියාව වර්ධනය වීම, දෘෂ්ටිය තියුණු කිරීම, ලිවීමේ හැකියාව වර්ධනය කිරීම, නිශ්චලත්වය (සාමය ඇති කිරීම), නොමිලේ වින්දනයක් ලැබීම එම ප්‍රයෝජන.

ඉංග්‍රීසි ජාතික ප්‍රැන්සිස් බේකන් පැවසූ 'කියවීම මිනිසා සම්පූර්ණ කරයි' යන්න අදට ද වලංගු කාරණයක්. එහෙත් වර්තමානයේ පොත්පත් කියවන පිරිස් බහුල ව දක්නට නැහැ. අතීතයේනම් බස් නැවතුම්පොළක, දුම්රිය ස්ථානයක වාඩිවී පොත් කියවන අය සුලබ දසුනක් වුණා. අද ඒ වෙනුවට දකින්නට ලැබෙන්නේ ස්මාට් ජංගම දුරකතනයට එබීගෙන සිටින පිරිසක්. තාක්ෂණය දියුණුවීමත් සමඟ පොත්පත් කියවන පිරිස අඩු වී ඇති බවයි ඉන් පැහැදිලි වන්නේ.

මහාචාර්ය අනුර වික්‍රමසිංහ දක්වන අදහස්වලින් එම කරුණ තහවුරු වෙනවා. ඔහු; "මා අවුරුදු 40ක් පමණ විශ්වවිද්‍යාලයට ආවේ ගියේ දුම්රියෙන්. ඒ දවස්වල දුම්රියේ ගමන් කරන බොහෝ අය පොත් කියෙව්වා. අඩු ගණනේ පත්තරයක්වත් කියෙව්වා. නමුත් දැන් තරුණ පිරිස පමණක් නොවෙයි බාල, මහලු කොයිකවුරුත් ස්මාට් ජංගම දුරකතනයට ගොදුරු වෙලා. අද දුම්රියක පොතක් කියවන්නෙක් බේතකටවත් හොයාගන්න බැරි තරම්. තාක්ෂණයේ දියුණුවත් සමඟ ස්මාට් ජංගම දුරකතනයෙන් පොත්, පත්තර කියවන්න පුළුවන්. රටේ තොටේ විස්තර දැනගන්නට පුළුවන්. අපට අවශ්‍ය කුමක් ද? එය තත්පර ගණනකින් සොයා ගන්න පුළුවන්. මේ ප්‍රයෝජනය ලබාගන්නේ කීයෙන් කීදෙනා ද?. අද බහුතරයක් ස්මාට් ජංගම දුරකතනය පාවිච්චි කරන්නේ ෆෙස්බුක්, යූටියුබ් සමාජ මාධ්‍ය ඔස්සේ ඕපාදූප කියවීමට"

වත්මන් පරපුර පොත්පත්වලින් දුරස් වී ඇති අයුරු මැනවින් පැහැදිලි වන නිදසුන් ඕනෑ තරම් තිබෙනවා. වරක් කලා විෂයධාරාව සඳහා සරසවියට ඇතුළත් වූ ප්‍රථම වසරේ විද්‍යාර්ථීන්ගෙන් නවකතා පිළිබඳ විමසීමේදී අනාවරණය වුණේ කිසි ම දිනක නවකතාවක්, කෙටිකතාවක් නොකියවූවන් සිටින වග. ඇතැම් විද්‍යාර්ථීන් පැවසූ පරිදි ඔවුන් දන සිටින්නේ උසස්පෙළ සඳහා නියමිත නිර්දිෂ්ට ග්‍රන්ථවලට අදාළ සාහිත්‍ය පොත්පත්වල නාම පමණයි. අනෙක් ඛේදනීය ම කරුණ වන්නේ අවම වශයෙන් මෙරට සිටින භාෂා, සාහිත්‍යවේදීන් කවුරුන්ද යන වගවත් නොදත් සිංහල විශේෂවේදී සිසුන් ද විශ්වවිද්‍යාලවල සිටින වග. රුහුණ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජයන්ත අමරසිංහ සමාජ මාධ්‍ය ඔස්සේ අනාවරණය කරමින් පවසා සිටියේ මෙවැන්නක්. ඔහු; "රුහුණ විශ්වවිද්‍යාලයේ සිංහල විශේෂ උපාධි පාඨමාලාව හදාරන අවසන් වසර සිසුවියන් දස දෙනකු සමග ස්වාධීන නිබන්ධ මාතෘකාවලට අදාළ කරුණු සාකච්ඡා කරමින් සිටින අතරේ ඔවුන්ගෙන් මා, ජේ. බී. දිසානායක පිළිබඳ විමසුවා. එක ම සිසුවියකවත් ජේ. බී. දිසානායක යනු කවුරුන්දැයි නොදන්නා බව අනාවරණය වුණා. විශාල ජාතික ධනයක් වැය කර තවදුරටත් මේ ආයතන පවත්වාගෙන යාමේ තේරුමක් තිබේ ද? ජේ. බී දිසානායක උපහාර උත්සවය කොළඹ විශ්වවිද්‍යාලයේදී පවැත්වුණේ නොබෝද. ඒ පිළිබඳ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යවලින් පුළුල් ප්‍රචාරයක් ද ඊට ලැබුණා. අවම වශයෙන් රට තොට සිදු වන දෑ පිළිබඳවත් අවබෝධයක් නැති පිරිසක් සමාජයට දායාද කිරීම ජාතික අපරාධයක් නොවේ ද?." මේ කරුණ පිටුපස තිබෙන සමාජ කියවීම අවධානයට ගත යුත්තක්.

ජාතික පුස්තකාලය කියවීමේ මාසය වෙනුවෙන් පුළුල් කාර්යභාරයක් ඉටු කරනවා. එහි අධ්‍යක්ෂ ජනරාල් ඩබ්ලිව්. සුනිල් පවසන්නේ රූපවාහිනිය නිසා පොත් කියවීම යම් පමණකින් අඩු වීම ස්මාට් ජංගම දුරකතනය නිසා තවදුරටත් අඩු වී ඇති බව. මේ පිළිබඳ අදහස් දක්වන ඔහු; ස්මාර්ට් ජංගම දුරකතනයෙන් මෙන් ම පරිගණක තිරයෙන් ද පොත්පත් කියවන පිරිසක් සිටිනවා. නමුත්

ප්‍රමාණාත්මක ව පොත් කියවීම පහත වැටී තිබෙනවා. කියවීමේ මාසයට සමගාමී ව ජාතික පුස්තකාලය කියවීමේ කඳවුරු පවත්වනවා. රසවින්දන වැඩසටහන් පවත්වනවා. පාසල් පුස්තකාල සහ මහජන පුස්තකාල සමඟ එක් ව කියවීමේ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා මඟ පෙන්වනවා. එම වැඩසටහන්වලින් පසු ජාතික මට්ටමින් උත්සවයක් පවත්වා හොඳම කියවීමේ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වූ පුස්තකාලවලට සම්මාන සහ ත්‍යාග ලබා දෙනවා. උතුර, උතුරුමැද, ඌව, සබරගමුව, මධ්‍යම යන තෝරාගත් පළාත්වල පාසල් ළමයින්ට 'කියවමු-දිනමු' යනුවෙන් ප්‍රශ්න විචාරත්මක වැඩසටහන් මාලාවක් සකස් කර තිබෙනවා. ඒ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නටනම් අනිවාර්යයෙන් ම පොත් කියවන්න ඕනෑ."

පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපති රත්න ශ්‍රී විජේසිංහ කියවීමේ පවසන්නේ පළාත් පාලන ආයතනවල මහජන පුස්තකාල සහ පාසල් පුස්තකාල සම්බන්ධ කර ගනිමින් කියවීමේ කඳවුරු පවත්වන බව. එහි අරමුණ වන්නේ කියවීම ප්‍රවර්ධනය. විශේෂයෙන් පාසල් ළමයින් ඉලක්ක කරගෙන මේ කඳවුරු පවත්වන්නේ පොත් කියවීමේ පුරුද්ද දරුවන් කුඩා කාලේ සිට ම ඇති කර ගත යුත්තක් නිසා. පාසල් අධ්‍යාපනය අවසන් කළ මෙන් ම විශ්වවිද්‍යාල සිසුන් පවා මේ කියවීමේ කඳවුරුවලට සහභාගි වන බවයි සභාපති රත්න ශ්‍රී විජේසිංහ සඳහන් කරන්නේ. ඔහු පෙන්වා දෙන ආකාරයට රසවින්දන වැඩසටහන් පවත්වන අතර ම කුඩා දරුවන්ට මූලික වශයෙන් කියවීම හුරු කිරීමට චිත්‍ර කියවීම, සූචි කියවීම, ශබ්දකෝෂ භාවිතය, සිතියම් කියවා ගැනීම ආදිය පිළිබඳ ප්‍රායෝගික දැනුම කියවීමේ කඳවුරුවලදී ලබා දෙනවා. මන්දාරම් නුවර, නෙළුව, කොත්මලේ, බදුල්ල, බණ්ඩාරවෙල වැනි දුර බැහැර ප්‍රදේශවලත් කියවීමේ කඳවුරු පවත්වා ඇති අතර දීප ව්‍යාප්ත ව එය පුළුල් කිරීමයි පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ඉදිරි සැලසුම. ඊට අමතර ව පොත් කියවන සමාජ ද පිහිටුවා තිබෙනවා.

දැනට ශ්‍රී ලංකාවේ ඇති මහජන පුස්තකාල සංඛ්‍යාව 1100ක්. පාසල් පුස්තකාල 6500ක් පමණ තිබෙනවා. අධ්‍යක්ෂ ජනරාල් ඩබ්ලිව්. සුනිල් සඳහන් කරන ආකාරයට සාමාන්‍යයෙන් පාසලක පුස්තකාලයක් නොතිබුණත් පොත් රාක්කයක් හෝ පොත් මුල්ලක් හෝ පිළියෙල කර ඇති බැවින් පාසල් දරුවන්ට කියවීමේ ඉඩප්‍රස්ථා බොහෝ පාසල්වල තිබෙනවා. එහෙත් ගැටලුව වන්නේ දරුවන් පොත් කියවීමට නැඹුරුවක් නොදැක්වීම.

මහජන පුස්තකාලවලින් ලබා ගන්නා තොරතුරු ඇසුරෙන් ජාතික පුස්තකාලය පාඨක කියවීම පිළිබඳ සමීක්ෂණ කර තිබෙනවා. එම සමීක්ෂණ වාර්තා අනුව වැඩි වශයෙන් පොත් කියවීමට නැඹුරුවක් දක්වන පළාත් ලෙස හඳුනාගෙන ඇත්තේ බස්නාහිර, මධ්‍යම සහ දකුණ. එහෙත් උතුරු මැද පළාතේ පොත්පත් කියවීමේ සම්භාවිතාව අඩු මට්ටමකයි තිබෙන්නේ. පාඨක පිරිස, ස්ත්‍රී පුරුෂ වශයෙන් සලකා බැලූ විට යාපනය දිස්ත්‍රික්කය හැර සෙසු දිස්ත්‍රික්කවල කියවීමට වැඩි වශයෙන් පෙලඹී සිටින්නේ ස්ත්‍රී පක්ෂය. එහෙත් යාපනය දිස්ත්‍රික්කයේ පමණක් පුරුෂ පක්ෂය ඉදිරියෙන් සිටිනවා.

> ඉංග්‍රීසි ජාතික ප්‍රැන්සිස් බේකන් පැවසූ 'කියවීම මිනිසා සම්පූර්ණ කරයි' යන්න අදට ද වලංගු කාරණයක්. එහෙත් වර්තමානයේ පොත්පත් කියවන පිරිස් බහුල ව දක්නට නැහැ. අතීතයේනම් බස් නැවතුම්පොළක, දුම්රිය ස්ථානයක වාඩිවී පොත් කියවන අය සුලබ දසුනක් වුණා. අද ඒ වෙනුවට දකින්නට ලැබෙන්නේ ස්මාට් ජංගම දුරකතනයට එබීගෙන සිටින පිරිසක්. තාක්ෂණය දියුණුවීමත් සමඟ පොත්පත් කියවන පිරිස අඩු වී ඇති බවයි ඉන් පැහැදිලි වන්නේ.

අධ්‍යක්ෂ ජනරාල් ඩබ්ලිව්. සුනිල් අවධාරණය කරන තවත් සුවිශේෂ කරුණක් තිබෙනවා. ඒ, සමාජ මාධ්‍යවලට ඇබ්බැහි වීම සමඟ පොත්පත් කියවීමේ අඩුවක් පැහැදිලි ව පෙනුණත් පොත් ප්‍රකාශයට පත් කිරීමේ අඩුවක් නැති බව. එය තහවුරු වන්නේ ISBN අංක ලබා ගැනීමට පැමිණෙන පිරිසෙන්. අදහස් දක්වන අධ්‍යක්ෂ ජනරාල්වරයා; "පොත් ප්‍රදර්ශනවලට පැමිණෙන පිරිසේ අඩුවකුත් නැහැ. ඔවුන් පොත් මිල දී ගන්නේ නැහැ, නැතිනම් පොත් මිල දී ගෙන කියවන්නේ නැහැ. පොත් ප්‍රදර්ශනයට එන අයගෙන් 11,000ක පමණ නියැදියක් ගෙන කළ සමීක්ෂණයකින් අනාවරණය වුණේ සම්මාන දිනූ පොත් මිල දී ගත්තත් පාඨක මතකයේ රැඳී තිබුණේ වෙනත් ලේඛක ලේඛිකාවන්ගේ නම් බව. බොහෝදෙනාට මතකයේ තිබෙන්නේ සරල රසවින්දනයක් ලැබෙන පොත්වල නම්. ගැඹුරු කියවීමකට යන පිරිස ඉතා අඩුයි. නමුත් කාගේ වුණත් පොත් කියවනවානම් හොඳයි."

පොත් යනු පරිකල්පනය අවදි කරන මෙවලමක් බව එඩ්ගා ඇලන් පෝ සඳහන් කර තිබෙනවා. මහාචාර්ය අනුර වික්‍රමසිංහ ඊට නිදසුන් ලෙස දක්වන්නේ මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ සහ සාහිත්‍යවේදී ජී.බී. සේනානායක. ඔවුන් පිළිබඳ රසබර මතකය අවදි කළ මහාචාර්ය අනුර වික්‍රමසිංහ;"මාර්ටින් වික්‍රමසිංහත් ජී.බී. සේනානායකත් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබූවන් නොවෙයි. ඒ අය පොත් කියවීමෙනුයි විද්වතුන් බවට පත්වුණේ. ඉගෙනීමෙන් නොලැබූ දැනුම, චින්තනය, පරිකල්පනය ලබා ගත්තේ පොත්වලින්. ජී.බී. සේනානායක වැඩි කාලයක් ගත කර තිබෙන්නේ පුස්තකාලයේ. පිටකොටුවෙ ප්‍රසිද්ධ පොත් සාප්පුවකට නිතර ම යන්න පුරුදු ව සිටි මාර්ටින් වික්‍රමසිංහ පොත් සාප්පුවේදී පොත් කිහිපයක් කියවා එක පොතක් පමණක් මිල දී ගත්තාලු."

තාක්ෂණයේ දියුණුවත් සමඟ පොත්පත් කියවන්නට විවිධ සංකල්ප ඉදිරියට පැමිණ තිබෙනවා. තාක්ෂණය වැලඳ ගත් ඇමරිකාව, එංගලන්තය, ජපානය වැනි රටවල උද්‍යානයේ බංකුවක වාඩිවී පොත් කියවන අය, දුම්රියේ පොත් කියවන අය තවමත් දකින්නට පුළුවන්. එසේනම් අප, අපෙන් ම ප්‍රශ්න කළ යුත්තේ 'තාක්ෂණය අප අල්ලා ගත්තේ වැරදි තැනින් ද?' යන්න. මේ නිසා පුනරුදය උදෙසා කියවීමටනම් නූතන තාක්ෂණය සමඟ බද්ධ ව හෝ කියවීම ප්‍රගුණ කිරීමට අප අදිටන් කර ගැනීම වැදගත්.

# අරගල ගීතය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**කළණි ඉරෝෂා ධර්මසිරි**

'අරගල ගීතයන්හි සන්නිවේදනාර්ථ' යන ග්‍රන්ථය ලෝකයේ පුරවැසි සමාජ දේශපාලන අරගල පදනම් ව භාවිත වූ ගීත සම්බන්ධ අධ්‍යයනයක්. මාධ්‍යවේදී කපිල එම් ගමගේ විසින් රචනා කරන ලද මේ ග්‍රන්ථයෙන් ලෝකයේ පුරවැසි අරගලවල ව්‍යාප්තිය, ජීවගුණය හා අනුප්‍රාණය සඳහා සන්නිවේදනාර්ථයෙන් ගීතය කුමන ආකාරයේ බලපෑමක් සිදු කළා ද යන්න සියුම් ව සොයා බලනවා.


මෙය ශ්‍රී ලංකාවේ ඇති වූ ප්‍රකට මහජන අරගලයක් වන 2022 ගෝල්ෆේස් අරගලය කේන්ද්‍රකරගෙන සම්පාදනය කළ ග්‍රන්ථයක්. පුරවැසි දේශපාලන අරගල යනු කුමක්ද?, ලෝකයේ චිර ප්‍රසිද්ධ සමාජ දේශපාලන අරගල සඳහා පාදක වූ ගීත, එම අරගල ගීතයන්හි ධනාත්මක සමාජ දේශපාලන බලපෑම සහ ඒවායේ ඍණාත්මක සමාජ දේශපාලන බලපෑම මෙහිදී සාකච්ඡා වෙනවා.

පුරවැසි දේශපාලන අරගලයක් යනුවෙන් අදහස් කෙරෙන්නේ දේශපාලන ක්‍රියාවලියේ යෙදෙන, තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින නොඑසේනම් සමාජ හෝ දේශපාලන හෝ වෙනසක් සඳහා වැඩ කරන්නට පුරවැසියන් ගන්නා උත්සාහයක්. මෙවැනි අවස්ථාවල මහජන නැගිටීම සිදුවන්නේ සාමාන්‍යයෙන් පුද්ගලයන් විශාල සංඛ්‍යාවක්, සාමූහික ව රජයට හෝ යම් අධිකාරියකට හෝ එරෙහි ව තමන්ගේ ආතතිය, අතෘප්තිය, පීඩනය, දුක් ගැනවිලි ප්‍රකාශ කිරීමෙන්.

මෙහිදී කතුවරයා විශේෂයෙන් 2010 වසරේ දෙසැම්බර් මාසයේ ටියුනීසියාවේ ආරම්භ වූ 'අරාබි වසන්තය' අරගලය පිළිබඳ ව විශ්ලේෂණය කරමින් ඒ ඔස්සේ ගෝල්ෆේස් අරගලයට පිවිසෙනවා. එහිදී මේ අරගල පිටාව තුළ ගීතය යන සන්නිවේදන මාධ්‍යය කොතරම්දුරට මහජන පෙලඹවීමට, මහජන අදහස් සමාජගත කිරීමට බලපෑම් කර තිබේ ද? යන්න විමසීමට ලක් කරනවා.

පුරවැසි දේශපාලන අරගලයේ ස්වභාවය හා එහිදී භාවිත විධික්‍රම මෙන් ම දේශපාලන හා සමාජය සන්දර්භය සහ ඊට සම්බන්ධිත විශේෂ ගැටලු පුද්ගල කණ්ඩායම්වල අරමුණු මත සාකච්ඡා කිරීමක් ද මෙහි දක්නට පුළුවන්. එය ධනාත්මක ස්වරූපයක්. විශේෂයෙන් දේශපාලන හු දර්ශනය හැඩ ගැසීමට සහ ඔවුන්ගේ අයිතිවාසිකම් හා අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටීමට පුරවැසියන් ක්‍රියාකාරී වීම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයේ මූලික අංගයක්. පුරවැසි අරගල යනු එහි ප්‍රකාශිත ස්වරූපයක්. එම ප්‍රකාශිත ස්වරූපය තුළ ගීතය යන කලා මාධ්‍යයේ සන්නිවේදන ලක්ෂණ විමසීම බෙහෙවින් ම කාලෝචිත වූවක්. එමෙන් ම මෙතෙක් ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික සාහිත්‍යයේ සාකච්ඡාවට බඳුන් නොවූ ඉසව්වක් පිළිබඳ මෙවැනි ග්‍රන්ථයක් ලිවීම ද පැසසිය යුත්තක්.



කපිල එම් ගමගේ

ගීතය යනු මිනිස් හැඟීම් ප්‍රකාශ කිරීමේ ප්‍රබල මාධ්‍යයක් වන අතර ම ඒ ඔස්සේ විවිධ සමාජ ප්‍රශ්න ස්පර්ශ කිරීමට ද හැකියාව තිබෙනවා. විශේෂයෙන් සමාජ වෙනසක් සඳහා වන අරගල හෝ එවැනි ව්‍යාපාරවලදී හෝ ගීත භාවිතයේ පවතින වැදගත් අරමුණු මෙහිදී එකින් එක විස්තර කර තිබීමත් මිනිසුන්ගේ හදවත් සමග ගැඹුරින් අනුනාද වන සංගීතයට සමාජයේ හිමි වන විශේෂ ස්ථානය ප්‍රකාශ කිරීමට එහි පවතින සුවිශේෂ ගුණාංග ඉදිරිපත් කිරීමත් අගය කළ යුත්තක්. සංගීතය යනු ප්‍රබල චිත්තවේගී හැඟීම් ඇති කිරීමට සහ ගැඹුරු චිත්තවේගීය සම්බන්ධතාවක් ඇති කිරීමට හැකියාවක් ඇති කලා මාධ්‍යයක්. එහිදී අත්දැකීම් බෙදා ගැනීම; සහවේදනය, දයාව, බලාපොරොත්තුව, ඔරොත්තු දීමේ හැකියාව, විසම්මුතිය ප්‍රකාශ කිරීම; සංකේත භාෂාව සහ මතක තබා ගැනීමේ හැකියාව; සංස්කෘතික අනන්‍යතාව ඉදිරිපත් කරමින් විශේෂයෙන් ගායනා කිරීම යන ප්‍රාසංගික ක්‍රියාවට සහභාගි වීමෙන් අරගලයක නියුක්ත පුද්ගලයන් අතර සම මූර්ත බවක් ඇති කිරීම සඳහා ගීතයේ පවතින රිද්මය, තනු නිර්මාණය, සාමූහික චිත්තවේගීය අත්දැකීම දායක වන ආකාරය මෙහිදී කතුවරයා මනාව පෙළගස්වා තිබෙනවා.

අරගල ගීතයන්හි සන්නිවේදනාර්ථ කෘතියේ තෙවැනි පරිච්ඡේදය වෙන්

වන්නේ ලෝකයේ චිරප්‍රසිද්ධ සමාජ දේශපාලන අරගල පාදක ගීත පිළිබඳ විමසීමට. ඇත්තෙන් ම මෙය පූර්වගාමී පූර්ව පර්යේෂණ කියවීමක්. යුද විරෝධී අරගලයක් සඳහා ගීතය කොතරම්දුරට ක්‍රියාත්මක වූවා ද යන්න විමසා බලමින් වාර්ගික අසාධාරණය හා පද්ධතිමය පීඩනයට ගීතයේ ඇති බලපෑම ඉදිරිපත් කිරීමට ඒ ඒ රටවල සංස්කෘතික අනන්‍යතාව විදහාපාන ගීතයේ ප්‍රධාන ගුණාංග ඉදිරිපත් කරමින් ඒ පිළිබඳ ව මනා විශ්ලේෂණයක් ගෙන ඒම මෙහිදී අගය කළ යුත්තක්.

අනතුරු ව කතුවරයාගේ අවධානය යොමු වන්නේ අරගල ගීතයන්හි ධනාත්මක සමාජ දේශපාලන බලපෑම කෙරෙහි. ගීතයේ ධනාත්මක ප්‍රවේශය විමසීමේදී දක්නට ලැබෙන්නේ සමගිය හා සහයෝගිතාව ගොඩනැංවීම සඳහා පොදු අනන්‍යතාවක් ඇති කරමින් අයත් වීමේ හැඟීම ගොඩනැගීමට විවිධ කණ්ඩායම් බළමුළු ගන්වමින් සාමූහික අරමුණක් ස්ථාපිත කිරීමට, විපත්ති සහ අපහසුතාවලදී ඔරොත්තු දීමේ හැකියාව ගොඩනංවමින් අන්‍යෝන්‍ය සහයෝගය දිරිමත් කිරීමට ගීතය ගත් උත්සාහය. එසේ ම ප්‍රජාවගේ සංස්කෘතික උරුමය සංරක්ෂණයට අතීතය හා වර්තමානය සම්බන්ධ කරගනිමින් පොදු අත්දැකීම් අවකාශයක් තුළ ඉදිරිපත් කරමින් ප්‍රකාශනය සඳහා වාහකයක් ලෙස භාෂාව, සංස්කෘතික සමගිය සහ විවිධත්වය, සංස්කෘතික අභිමානය සහ අනන්‍යතාව, කලාත්මක නිර්මාණශීලීත්වය සමාජගත කිරීමට කතුවරයා මෙහිදී උත්සාහ ගෙන තිබෙනවා.

සමාජ ගැටලු පිළිබඳ දැනුවත් කරමින්, ඒ සම්බන්ධ ඓතිහාසික ප්‍රවේශය විස්තර කරමින් අරගලය මානුෂීකරණය කර ඇති මෙහි සියලු මහා ප්‍රේක්ෂකයන් සඳහා ප්‍රවේශ විය හැකි මාධ්‍යයක් ලෙස ගීතයේ ඇති ශක්‍යතාව ඉදිරිපත් කරමින් ඒ ඔස්සේ ජනතා විඥනය ඉහළ නංවමින්, සංස්කෘතික දැනුම සම්ප්‍රේෂණය කරමින් විවේචනාත්මක චින්තනය දිරි ගැන්වීම සඳහා බළමුළු ගැන්වීමට ගීතයේ ඇති ප්‍රබල හැකියාව මෙහිදී විද්‍යාමානකොට තිබෙනවා.

අරගල ගීතයන්හි සෘණාත්මක සමාජ දේශපාලන බලපෑම විමසීම ද මෙහිදී අගය කළ යුත්තක්. ඕනෑ ම ක්‍රියාවකින් සාධනීය හා නිශේධනීය ප්‍රවේශ විමසමින් එහි සන්නිවේදනාර්ථ ඉදිරිපත් කිරීමට ගත් ප්‍රශංසනීය වෑයමක් ලෙස මෙම කෘතිය හඳුන්වා දිය හැකියි. අරගල ගීතවල නිශ්චිත අන්තර්ගතය ඓතිහාසික හා සංස්කෘතික සන්දර්භය, එම භාවිතය පිටුපස ඇති අභිප්‍රාය මත එම ගීතවල බලපෑම වෙනස් විය හැකි බව, ප්‍රජාව බළමුළු ගැන්වීමට භාවිත කරන ක්‍රමවේදයේ සියුම් අවබෝධයක් සහතික කිරීමෙන් ඇතිවන සෘණාත්මක ප්‍රතිවිපාක මෙහිදී ඉදිරිපත්කොට තිබෙන්නේ විවේචනාත්මක ව. එමෙන් ම ඇතැම් අරගල ගීතවල ගැටලු විසඳීමේ දුෂ්කරතා, සමාජ ඛණ්ඩනය, ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය, ආක්‍රමණශීලී හෝ ප්‍රචණ්ඩ හෝ භාෂාවක් අඩංගු වීමේ දුර්වලතා ද පවතින බව කතුවරයා පවසනවා.

මේ කෘතියේ හය වැනි පරිච්ඡේදය වෙන් වන්නේ ගීතයේ සන්නිවේදනය සහ එහි ප්‍රබලත්වයට. ඉන් අනතුරු ව කතුවරයාගේ අවධානය යොමු වන්නේ අරගල ගීතවල සන්නිවේදන බලපෑම කෙරෙහි. විරෝධතා ගීත, විමුක්ති ගීත ලෙසින් ද හඳුන්වන අරගල ගීත විවිධ සමාජ දේශපාලන ව්‍යාපාරවල අනිවාර්ය අංගයක් බවට පත් ව තිබෙනවා. මේ ගීත බොහෝ විට මතුවන්නේ දේශපාලන හෝ සමාජ විපර්යාසයක්, සමාජ පීඩනයකට එරෙහි ප්‍රතිවිරෝධයක් ඇති කාලවල. මෙය කිහිප ආකාරයකින් මෙහිදී නිරීක්ෂණය වෙනවා.

ශ්‍රී ලාංකික අරගල සන්දර්භය සුවිශේෂ ව ඉදිරිපත්කොට ඇත්තේ මෙහි අට වැනි පරිච්ඡේදයේ. විශේෂයෙන් යටත්විජිත යුගයේ පැවති දේශපාලන අරගල, මහජන නැගිටීම් පිළිබඳ සැලකිල්ලක් දක්වමින් එහි පවතින දේශපාලන සමාජ ස්වරූපය මෙන් ම සංස්කෘතික නැමියාව ද කතුවරයා මෙහිදී විමසීමට ලක් කරනවා.

ග්‍රන්ථයේ අවසාන පරිච්ඡේද දෙකෙන් සුවිශේෂ බර තැබීමක් සිදුකොට ඇත්තේ ගෝල්ෆේස් මහජන අරගලේදී භාවිත සන්නිවේදන ක්‍රම තුළ. අරගලයේදී ගීතය හා ගී ප්‍රසංග තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ සන්නිවේදන ක්‍රමයක් ලෙස ඒවායේ ස්ථානීය සන්නිවේදනය සහ ගීත පෙළ උදාහරණයට දක්වමින් විචාරශීලී ප්‍රවේශයකින් ඉදිරිපත් කර තිබීම ද සුවිශේෂ කාරණාවක්.

2022 මහජන අරගල භූමියේ ක්‍රියාකාරී වූ එවැනි අරගල ගීත පද රචකයන්, තනු නිර්මාපකයන් හා ගායක ගායිකාවන් සම්මුඛ සාකච්ඡාවලට ලක්කරමින් ඔවුන්ගේ අදහස් ද ඉදිරිපත් කරමින් අරගල ගීතයන්හි සන්නිවේදන අර්ථ ශ්‍රී ලාංකික සන්දර්භය තුළ විශ්ලේෂණය කිරීමටයි කතුවරයා මෙහිදී උත්සාහ ගන්නේ. එසේ ම මෙතෙක් අරගලවලදී ශ්‍රී ලාංකික සන්දර්භය තුළ පැවති විරෝධාකල්ප ගීත මෙන් ම 2022 අරගලය වෙනුවෙන් ම නිර්මාණය වූ ගීත ද ඉදිරිපත් කරමින් ඒ පිළිබඳ විචාරශීලී ප්‍රවේශයක එහි සන්නිවේදනාර්ථක විමසීමට ගත් උත්සාහයක් ලෙසත් මේ ග්‍රන්ථය අගය කළ යුතුයි.

ගොල්ෆේස් අරගලයේ මෙවැනි විරෝධාකල්ප ගීත සමාජගත වීමට ප්‍රබල හේතුකාරක වූ සමාජ මාධ්‍යයේ සුවිශේෂ ශක්‍යතා ඉදිරිපත් කරමින් එහි ධනාත්මක ස්වරූපය මතුකරලීමට ද කතුවරයා උත්සාහ දරා තිබෙනවා. විශේෂයෙන් ගීතය වැනි කලා මාධ්‍යයක් අරගලයේ ඇතුළත කවය හා බාහිර කවය වෙත මනා සන්නිවේදනයක් පවත්වාගෙන ගිය වපසරියක ශ්‍රී ලාංකික දේශපාලනය තමන්ගේ වගකීම ඉටු කළා ද? නැද්ද? යන්න පාඨකයන්ට භාර කරමිනුයි කතුවරයා තම පර්යේෂණාත්මක ග්‍රන්ථයේ  නිමාව සනිටුහන් කරන්නේ.

මේ අනුව පර්යේෂණාත්මක ශාස්ත්‍රීය ලක්ෂණ මෙන් ම සාමාන්‍ය පාඨකයාට පාඨනය කළ හැකි සරල භාෂා විලාසයක් භාවිත කර තිබීමත් ඕනෑ ම අයෙකුට පාඨනය කරමින් ඓතිහාසික ප්‍රවේශයේ සිට න්‍යායාත්මක සංකල්පීය ප්‍රවේශය දක්වා වූ ශාස්ත්‍රීය කියවීමකට ද මේ ග්‍රන්ථය මහඟු පිටිවහලක් වනු ඇති.

# රාජ්‍ය සේවා තරග විභාග අත්වැල

## කාර්යාල කළමනාකරණය හා ලිපිගොනුකරණය 2



ඉදිරිපත් කිරීම
**නාලක දිසානායක**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු), මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය හා අධ්‍යක්ෂ (පාලන) වැ.බ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

රාජ්‍ය සේවයේ ඒ ඒ ආයතන වෙනුවෙන් අනන්‍ය වූ අරමුණු, කාර්ය මනා ව කරගෙන යාමට කාර්යාල කළමනාකරණ ක්‍රමවේද, නිසි ආයතනික කාර්ය පටිපාටි අනුගමනය කිරීම ඉතා වැදගත් වේ. මේ නිසා ඉතා සංක්ෂිප්ත ව කාර්යාල කළමනාකරණය හා ආයතනික කාර්ය පටිපාටි පිළිබඳ සාකච්ඡා කිරීම පසුගිය කලාපයෙන් ඇරඹූ අතර මේ පළ වන්නේ එහි ඉතිරි කොටසයි.

කාර්යාල කළමනාකරණයේ වැදගත්කම, ලිපිගොනුව හැඳින්වීම, එහි ප්‍රයෝජන, ගොනුවක් පවත්වාගෙන යා යුතු මූලික ආකාර ආදිය කෙරෙහි පසුගිය කලාපයෙන් අවධානය යොමු කළ අපි මෙහිදී ලිපිගොනු වර්ග කළ හැකි ආකාර සම්බන්ධයෙන් අවධානය යොමු කරමු.

❖ **ලිපිගොනු වර්ග කිරීම**

කාර්යාලයක භාවිත වන ලිපිගොනු විවිධ ආකාරයට වර්ග කළ හැකි ය. එවැනි වර්ගීකරණ කිහිපයක් කෙටියෙන් පහත පරිදි සඳහන් කළ හැකි ය.

1. **ලිපිගොනු අවශ්‍යතාව අනුව වර්ග කිරීම**

ලිපිගොනු පවත්වාගෙන යන අවශ්‍යතාව අනුව ලිපිගොනු වර්ගීකරණය කිරීම මෙහිදී අදහස් කෙරේ.

- කෙටිකාලීන
- දිගුකාලීන
- විශාල ප්‍රමාණයේ

2. **ලිපිගොනු පවත්වාගෙන යන ස්ථානය අනුව වර්ග කිරීම**

රජයේ ඇතැම් කාර්යාලවල ලිපිගොනු පවත්වාගෙන යාම සඳහා වෙන ම ස්ථානයක් පවතින කර්යාල මෙන් ම තමන්ගේ ලිපිගොනු තම අංශයේ ම පවත්වාගෙන යාම ද දැක ගත හැකි ය. මේ අනුව ලිපිගොනු පවත්වාගෙන යන ස්ථානය අනුව ද

- මධ්‍යගත ලිපිගොනුකරණය
- විමධ්‍යගත ලිපිගොනුකරණය

යනුවෙන් වර්ග දෙකක් හඳුනාගත හැකි ය. අදාළ ආයතනයේ ගනුදෙනු වන සියලු ලිපිගොනු එක් ස්ථානයක පවත්වාගෙන යාම මධ්‍යගත ලිපිගොනුකරණය ලෙසත් ආයතනයක පවත්වාගෙන යන ලිපිගොනු සියල්ල ඒ ඒ අංශ හෝ ඒ ඒ විෂයය භාර නිලධරයා භාරයේ ම පවත්වාගෙන යාම විමධ්‍යගත ලිපිගොනුකරණය ලෙසත් හැඳින් වේ.

3. **ලිපිගොනුවලට ලිපි අමුණන ආකාරය අනුව වර්ග කිරීම**

ලිපිගොනු වර්ග 02ක් මේ යටතේ හඳුනා ගත හැකි ය. එනම්,

- විභාජිත ලිපිගොනු ක්‍රමය
- ඒකාබද්ධ ලිපිගොනු ක්‍රමය

ලිපිගොනුවක ලිපි/ලේඛන දකුණු පසටත් ඒ සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීම සඳහා ලියන සටහන (file minute) ලියූ සටහන් පත්‍ර වම්පසටත් අමුණමින් ගොනු පවත්වාගෙන යාම විභාජිත ලිපිගොනු ක්‍රමය හෙවත් බෙදුණු ලිපිගොනු ක්‍රමය ලෙස හැඳින් වේ. වර්තමානයේ රජයේ බොහෝ කාර්යාල අනුගමනය කරන්නේ මෙම ක්‍රමයයි.

එමෙන් ම සියලු ම ලිපි, පොතක පිටු අමුණා ඇති ආකාරයට ගොනුවේ දකුණු පසට ඇමිණීම සිදු කරන ක්‍රමය ඒකාබද්ධ ගොනු ක්‍රමය හෙවත් පොත් ගොනු ක්‍රමය ලෙස හැඳින් වේ. එහිදී ලිපිගොනු සටහන් ලිවීම ද ලිපියේ ම ඉඩ ඇති ස්ථානයක හෝ ලිපියේ පිටුපස හෝ ලිපියට ම ඇමිණූ වෙන ම කඩදාසියක හෝ සිදු කෙරේ. නමුත් වර්තමානයේ පෙර කී විභාජිත ගොනු ක්‍රමයෙන් ලිපිගොනු පවත්වාගෙන යාම සුලබ ව දැක ගත හැකි ය.

4. **ලිපිගොනු ඇතුළත් විෂයය කරුණු අනුව ලිපිගොනු වර්ග කිරීම**

සෑම ලිපිගොනුවක ම අන්තර්ගතය තුළ අඩංගු කරුණු අනුව

ද ලිපිගොනු වර්ග කළ හැකි ය. ඒ ආකාරයට වර්ග කළ හැකි ප්‍රධාන වර්ග කිහිපයක් පහත දැක්වේ.

### I. විෂයය ලිපිගොනු

යම් විෂයයකට අදාළ වන ලිපිගොනුව මේ නමින් හැඳින්වේ. යම් විෂයයක ඉතිහාසය හා වර්තමානය දැකගත හැකි වන පරිදි අඛණ්ඩ ව වැඩෙන ගොනුවක් ලෙස විෂයය ගොනුව නම් කළ හැකි ය.

### II. ආශ්‍රය ලිපිගොනු

කාර්යාල කළමනාකරණයේදී කාර්යාලයක් මනා ව පවත්වාගෙන යාමට ලිපිගොනුකරණය ඉවහල් වන්නේ යම්සේ ද එහි අනු කරුණක් වන ආශ්‍රය ගොනු පවත්වාගෙන යාම පෙර කී අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඉහළ දායකත්වයක් ලබා දෙන්නක් බවට අවිවාදිත ව සඳහන් කළ හැකි ය.

යම් විෂයයක් පිළිබඳ ව ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස්, චක්‍රලේඛ, නීතිරීති, රජයේ ප්‍රතිපත්ති, කාර්යාල නියෝග ආදී ගොනු මේ නමින් හැඳින්වේ. ආශ්‍රය ගොනුවලින් ලිපි ගනුදෙනු සිදු වන්නේ නැති අතර වෙනත් ගොනුවක කටයුතු ඉටුකර ගැනීම සඳහා ඒ තොරතුරු යොදා ගනී. ඒ නිසා ම මෙවැනි ගොනුවලට අඛණ්ඩ පැවැත්මක් ද පවතී.

- ප්‍රතිපත්ති ගොනු
- පූර්වාදර්ශ ගොනු
- චක්‍රලේඛ හා උපදෙස් ගොනු ආදිය මීට උදාහරණ ලෙස දැක්විය හැකි ය.

### III. පුද්ගලික ලිපිගොනුව

ලිපිගොනුවක ඇතුළත් විෂයය කරුණු අනුව ඉතා වැදගත් ගොනු වර්ගයකි. සෑම රාජ්‍ය නිලධරයෙකුගේ ම ඔහුගේ සේවයේ කැඩපතක් ලෙස පුද්ගලික ලිපිගොනුව හැඳින්විය හැකි ය. ආරම්භයේ සිට අවසානය දක්වා ම වැදගත් ලියවිලි සහිත මෙම ගොනුව නිවැරදි ව පවත්වාගෙන යාම කාර්යාල කළමනාකරණයේ සිදු විය යුතු වැදගත් ම කරුණකි.

ආයතන සංග්‍රහයේ VI වැනි පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි පුද්ගලික ලිපි ගොනුවක් සම්බන්ධයෙන් වගකිව යුතු ප්‍රධාන බලධරයන් දෙදෙනෙකු ඇත. එනම්,

- යම් පුද්ගලයෙකු පත් කරන බලධරයා
- යම් නිලධරයෙකු සේවයේ යොදා ගන්නා දෙපාර්තමේන්තු ප්‍රධානියා

පුද්ගලික ලිපිගොනුවක ඇතුළත් තොරතුරු ඒ නිලධරයාගේ වෘත්තීය ජීවිතයට ඉතා ම වැදගත් වේ. ඒ නිසා ම එහි ලේඛනාදිය අස්ථානගතවීමක් වැන්නක් සිදු වුවහොත් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ ව දැක්වෙන 1978.04.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 121 වැනි සුවිශේෂ චක්‍රලේඛ විධිවිධානවලින් සන්නද්ධ වීම ද ඉතා වැදගත් බව කිව යුතු ය.

### IV. විෂය උපගොනු හා මධ්‍ය ගොනු

පාසලක් ඇතුළු ඕනෑ ම රාජ්‍ය ආයතනයක යම් විෂයයකට අදාළ ව ප්‍රධාන ගොනුව විශාල වීම වැළැක්වීමටත් පරිහරණයේ පහසුව සඳහාත් කුඩා කුඩා ගොනු පවත්වා ගෙන යාමට සිදු වේ. මේවා විෂයය උපගොනු ලෙස හඳුන්වන අතර උපගොනු සියල්ල පසු අවස්ථාවකදී යළි එක් ගොනුවකට ගොනු කළහොත් එවැනි ගොනු "මධ්‍ය උපගොන" ලෙස හැඳින් වේ.

### V. විෂයය කාරණා ගොනු

කාර්යාල කළමනාකරණයට අදාළ ලිපිගොනු සම්බන්ධ ව සාකච්ඡා කිරීමේදී කාරණා ගොනු පිළිබඳ ව ද අවධානය යොමු කිරීම වැදගත් වේ. විෂය ගොනුවක් යම් විෂයයක් සම්බන්ධ ව අඛණ්ඩ ව වැඩෙන්නාක් මෙන්, කාරණා ගොනුවක් කාරණය ඉටුවීමත් සමඟ ම එහි කටයුතු අවසන් වේ. එය විෂය ගොනුවක් තරම් කාල පරාසයක් පවත්වාගෙන යා යුතු නොවන අතර අදාළ කාරණයට විවෘත කර, කාරණය අවසන් වීමත් සමඟ අවසන් වේ.

එමෙන් ම පවත්නා අවස්ථාව අනුව කාරණා ගොනු,

- නොපමා කාරණා ගොනු
- අවලම්භන කාරණා ගොනු
- නිම කළ කාරණා ගොනු

ලෙස අවස්ථා 03කට ද බෙදා දැක්විය හැකි ය.

ඒ අනුව කාර්යාලයක් මනා ව පවත්වාගෙන යාමට ඉවහල් වන එක් කරුණක් වන ලිපිගොනු මනාව පවත්වාගෙන යාම හා ඒ සම්බන්ධ ව යාවත්කාලීන වන විවිධ උපදෙස්, මාර්ගෝපදේශ, චක්‍රලේඛ ආදිය කෙරෙහි අවධානයෙන් සිටීම ද කාර්යාලයක් ඉතා ඵලදායී ව පවත්වාගෙන යාමට ඉවහල් වනු නොඅනුමාන ය.




# ආසියානු ක්‍රිකට්

**අනිල් වීරසිංහ**

ශ්‍රී ට වසර 41කට පෙර, එනම් 1984 වසරේ මැදපෙරදිග සාජාහි මුලින් ම ආරම්භ වූ ආසියානු කුසලාන ක්‍රිකට් තරගාවලිය සැප්තැම්බර් 09 සිට 28 දක්වා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේදී මෙවර පැවැත්වුණේ 17 වැනි වරට. ඉන්දියාවේ 09 වැනි ආසියානු කුසලාන ජයග්‍රහණය ලෙස එය සටහන් වුණා. ලැබූ මේ ජයග්‍රහණ 09න් 2018 ජයග්‍රහණයේ සහ 2025 ජයග්‍රහණයේ විශේෂත්වය වුණේ 'විස්සයි20 තරගමාලා' ලෙස ඒවා පැවැත්වීම. 1984, 1995, 2018 මැදපෙරදිගත් 1988 හා 2016 බංගලි දේශයේත් 1990-91 ඉන්දියාවේත් 2010 හා 2023 ශ්‍රී ලංකාවේත් එක්දින සීමිත ඕවර් තරගමාලා ලෙස පැවති අවස්ථාවලත් ජය ගැනීමට සමත් වුණේ ඉන්දියාව. ආසියාවේ ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩා කරන රටවල් වන ඉන්දියාව, පාකිස්තානය, ශ්‍රී ලංකාව, බංගලි දේශය හා ඇෆ්ඝනිස්තානය යන රටවලට අමතර ව එක්සත් අරාබි එමීරය, ඕමානය, හොංකොං යන රටවල් මෙවර තරග වැදුණු සෙසු කණ්ඩායම්.

තරගාවලි ඉතිහාසයේ මුල්වරට දේශපාලන පිටියේ මෙන් ම සෑම අංශයකින් ම එකිනෙකාගේ පස මිතුරන් ලෙස හැඳින්වෙන ඉන්දියාව හා පාකිස්තානය මෙවර අවසන් මහා තරගය සඳහා සුදුසුකම් ලැබීම ද විශේෂත්වයක්. අවසන් මහා තරගයේදී පාකිස්තානය පරාජය කරමින් ඉන්දියාව අත්කර ගත්තේ විශිෂ්ට ජයක්. මේ තරගයේදී පාකිස්තාන පිතිකරුවන් සිව්දෙනෙකු ලකුණු 30කට දවා ගනිමින් ඉන්දියාවේ කුල්දිප් යදාව් සුපිරි පන්දු යැවීමක් වාර්තා කළ අතර පන්දු 53කින් නොදැවී ලකුණු 69ක් ලැබූ ඉන්දීය පිලේ තිලක් වර්මා (Warma) අවසන් තරගයේ වීරයා බවට පත් වෙමින් පිත්තෙන් දැක්වූ දස්කම් ද අමතක කළ නොහැකියි. මෙවර සමස්ත තරගාවලියේදී පිත්තෙන් ලකුණු 314ක් ලබා ඉන්දියාවේ අභිෂේක් ෂර්මා (Sharma) තරගාවලියේ වීරයා බවට පත්වන විට කඩුලු 17ක් ලබමින් ඉන්දියාවේ කුල්දිප් යදාව් වැඩි ම කඩුලු ලැබූ පන්දු යවන්නා වීමත් කැපී පෙනුණා.

1983 වසරේ ආසියාතික ක්‍රිකට් සමුළුව ආරම්භ වන විට ආසියාකරයේ ක්‍රිකට් ක්‍රීඩාවේ යෙදී සිටි රටවල් අතරින් ටෙස්ට් තත්ත්වය හිමි කරගෙන සිටියේ ඉන්දියාව, පාකිස්තානය හා ශ්‍රී ලංකාව පමණයි. මේ අනුව ආසියාවේ ක්‍රිකට් ක්‍රීඩා කරන රටවල් අතර තරගාවලියක් වසර දෙකකට වරක් සීමිත ඕවර ක්‍රිකට් තරගාවලියක් ලෙස පැවැත්වීමට ආසියා ක්‍රිකට් සමුළුව විසින් ගන්නා ලද තීරණයට අනුව මුල් ම ආසියා කුසලාන ක්‍රිකට් තරගාවලිය පැවැත්වුණේ 1984 වසරේ එක්සත් අරාබි එමීරයේ සාජාහිදී. එදා ඉන්දියාව, පාකිස්තානය හා ශ්‍රී ලංකාව යන රටවල් තුනට පමණක් සීමා වන මුල් ම තරගාවලිය 1984 අප්‍රේල් මස 06 දින ශ්‍රී ලංකාව හා පාකිස්තානය අතර තරගයෙන් ආරම්භ වන්නේ ආසියානු කුසලාන තරග ඉතිහාසයේ මංගල තරගය වශයෙන්. සුනිල් ගවස්කාර්ගේ නායකත්වයෙන් යුත් ඉන්දියාව මේ පළමු තරග මාලාවේ ශූරතාව අත්කර ගත් අතර අනුශූරතාව දුලිප් මෙන්ඩිස්ගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකාවට හිමිවුණා. එවර පාකිස්තාන කණ්ඩායම මෙහෙයවූවේ සහීර් අබ්බාස්.

ආසියාතික ක්‍රිකට් සමුළුව 1983 වසරේ පිහිටුවා ගත් බව සඳහන් වුවත් 70 දශකයේත් ආසියාතික ක්‍රිකට් සමුළුවක් පිහිටුවාගෙන ඇති බව එම යුගයේ පුවත්පත් පරීක්ෂා කරන විට දැක ගැනීමට පුළුවන්. මෙයට මූලිකත්වය ගෙන ඇත්තේ පාකිස්තානයේ මුල් ම ටෙස්ට් ක්‍රිකට් නායක, එවකට එරට ක්‍රිකට් පාලක මණ්ඩල සභාපති ව සිටි ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් නිරතුරු ව පෙනී සිටි ඒ. එච්. කාදර්. ඒ වනවිට මෙරට ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපති ව සිටියේ රොබට් සේනානායක වන අතර නීල් පෙරේරා එහි ලේකම්. මේ ආසියාතික ක්‍රිකට්

සමුළුවේ පළමු රැස්වීම පාකිස්තානය, ඉන්දියාව, ශ්‍රී ලංකාව, මැලේසියාව, සිංගප්පූරුව යන රටවල නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් 1974 දෙසැම්බර් මාසයේ පාකිස්තානයේ පැවැත්වූ බව සඳහන්.

1984 මුල් තරගාවලියේ සිට පැවති සෑම ආසියානු කුසලාන තරගාවලියකට ම සහභාගිවූ එක ම කණ්ඩායම ලෙස ශ්‍රී ලංකාව හඳුන්වන්න පුළුවන්. ශ්‍රී ලංකාව මෙය 06 වතාවක් ජයගෙන තිබෙනවා. බංගලි දේශය 1986 සිට අඛණ්ඩ ව මෙය නියෝජනය කිරීමත් කැපී පෙනෙන කරුණක්. මෙවර ශ්‍රී ලංකාවට මූලික වටයේ තමන් සහභාගි වූ තරගවලින් බංගලි දේශය, ඇෆ්ඝනිස්තානය හා හොංකොං යන රටවල් පරාජය කිරීමට සමත් වුවත් සුපිරි වටයේදී එවැනි දස්කම් දැක්වීමට සමත් නොවීම මත අවසන් තරගයට පිවිසීමේ වරම් අහිමි වුණා. එහෙත් මෙවර තරගාවලියේදී පැතුම් නිශ්ශංක දැක්වූ දස්කම් අමතක කළ නොහැකියි. ඔහු තරග 06කදී ලකුණු 261ක් වාර්තා කළේ ශතකයක් හා අර්ධ ශතක දෙකක් ලබමින්. මෙවර තරගාවලියේ වාර්තා වූ එක ම ශතකය ලබා ගත්තේ ඔහු වීමත් අමතක කළ නොහැකි කරුණක්.

කලාපීය දේශපාලනය නිසා ඉන්දියාව හා පාකිස්තානය අතර විරසකය මේ තරගාවලියට වරින් වර ඉමහත් බලපෑමක් වූ අයුරු පෙනී ගියේ අතීතයේ සිට ම. මෙවර තරගාවලියේදී මෙය වැඩි වශයෙන් දැක ගැනීමට ලැබුණා. දැනට මාස කිහිපයකට පෙර, ඉන්දීය පාලනය යටතේ පවතින ජම්මු කාශ්මීර්හි පෙහෙල්ගම්හි සිදුවූ ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් දෙරට අතර ඇතිවූ විරසකය දෙරට අතර ක්‍රීඩාවට ද තදින් බලපා තිබුණා. මෙවර තරගාවලියේ සත්කාරකත්වය හිමි ව තිබූ ඉන්දියාව වෙතින් තරගාවලිය මැද පෙරදිගට මාරුවීමටත් මේ තත්ත්වය එල්ල කළේ දැඩි බලපෑමක්. මෙවර ඉන්දියාව සහ පාකිස්තානය තුන් වරක් එකිනෙකා සමග තරග වැදුණු අතර ආරම්භක තරගයේ සිට ම ඉන්දීය කණ්ඩායම, පාකිස්තාන කණ්ඩායම කෙරෙහි දැක්වූයේ දැඩි විරසක බවක්. ඩුබායිහි පැවති දෙරට අතර මුල් වටයේ තරගයෙන් ඉන්දියාව, පාකිස්තානයට එරෙහි ව ජය අත්කරගත් අතර නායකයන් දෙදෙනා කාසියේ වාසිය විමසීමේදී අතට අත දී ආචාර නොකිරීම කැපී පෙනුණා. ඉන්දියාව තරගය ජයග්‍රහණය කරන අවස්ථාවේ පිටියේ පන්දුවට පහර දෙමින් සිටි නායක සූර්යකුමාර් යාදව් සහ ශිවම් ඩුබේ යන ක්‍රීඩකයන් දෙදෙනා සුපුරුදු පරිදි පිටිය මැදදී ප්‍රතිවාදීන්ට අතට අත දීම වෙනුවට වහා ම පිටියෙන් ඉවත් වීම තවත් කැපී පෙනුණු අවස්ථාවක්. තරගය ජය ගැනීමෙන් අනතුරු ව ඉන්දීය නායක සූර්යකුමාර් යාදව් පැවසුවේ මේ ජයග්‍රහණය පෙහෙල්ගම් ප්‍රහාරයෙන් මිය ගිය අයගේ පවුල්වලට කැප කරන බව.

මුල් වරට ආසියානු කුසලාන අවසන් තරගයක ඔවුන් මුණගැසුණු අවස්ථාව ලෙස මේ අවසන් තරගය හඳුන්වන්න පුළුවන්. අවසන් තරගය ජය ගනිමින් ආසියානු කුසලානය ජයග්‍රහණය කළ ඉන්දියාව ආසියානු ක්‍රිකට් කවුන්සිලයේ සභාපති මෙන් ම පාකිස්තාන අභ්‍යන්තර කටයුතු අමාත්‍යවරයා සහ එරට ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපතිවරයා ද වන මොෂින් නක්වි අතින් කුසලානය ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීමත් කලාතුරකින් දැක ගැනීමට ලැබුණු සිදුවීමක්. අවසන් තරගය නිමා වී පැයකට අධික කාලයකට පසු පැවති ත්‍යාග ප්‍රදානෝත්සවයේදී පාකිස්තාන කණ්ඩායම තමන්ට හිමි ත්‍යාග හා සම්මාන ලබා ගැනීමට පැමිණියත් ඉන්දීය කණ්ඩායමේ නායකයා කුසලානය ලබා ගැනීම සඳහා වේදිකාව වෙත පැමිණියේ නැහැ.

ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි, ඉන්දියාව දිනාගත් ආසියානු කුසලානය වෙනුවෙන් සූර්ය කුමාර් යාදෙව් ප්‍රමුඛ ඉන්දීය කණ්ඩායමට සුබ පතමින් 'ඉන්දියාව ජය ගනී' යනුවෙන් සටහනක් තබමින් ට්විටර් පණිවිඩයක් නිකුත් කළා. ඊට පිළිතුරු වශයෙන් පාකිස්තාන අභ්‍යන්තර කටයුතු අමාත්‍ය මොෂින් නක්වි සටහනක් තබා තිබුණේ "යුද්ධය ඔබේ ආඩම්බරයනම්, ඉතිහාසය දැනටමත් පාකිස්තානය ඔබේ අවමන් සහගත පරාජ පෙන්නුම් කර තිබෙනවා. කිසිදු ක්‍රිකට් තරගයකට මේ සත්‍යය වෙනස් කළ නොහැකියි." යනුවෙන්. යුද්ධය ක්‍රීඩාවට ඈඳා ගැනීමෙන් පෙන්නුම් කරන්නේ කලකිරීමක් පමණක් බවත් එය ක්‍රීඩාවේ ජීවගුණයට බලපාන බවත් ඔහු පවසා තිබුණා.

ඉතා ඉක්මනින් මේ තත්ත්වය වෙනස් කර නොගතහොත් 'ක්‍රීඩාව සංහිඳියාව සඳහා ය' යන්න වෙනුවට 'ක්‍රීඩාව යුද්ධය සඳහා ය' යන්න වෙනස් වන කාලය වැඩි ඈතක නොවන බවයි මෙයින් පෙනී යන්නේ.









# පටලපට සුරැකුම

**නුවන් කුමාර කටුගම්පල**

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ චිත්‍රපට අංශයේ 76 වැනි සංවත්සරයට (2025 සැප්තැම්බර් 17 දිනට යෙදුණු) සමගාමී ව එහි පැරණි සිනෙ චිත්‍රපට සංරක්ෂණාගාරය නවීකරණය කෙරුණා. වියදම් කළමනාකරණය කරමින් සහ වැඩි ගුණාත්මක නිමාවකින් යුක්ත ව මේ ගොඩනැගිල්ල නවීකරණය කළේ ශ්‍රී ලංකා යුද හමුදාවේ හය වැනි ඉංජිනේරු සේවා රෙජිමේන්තුව.


සැප්තැම්බර් 16 දින සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය අමාත්‍ය නලින්ද ජයතිස්ස සහ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් හර්ෂ බණ්ඩාර ඇතුළු සිනමා සහ මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් අතින් එය විවෘත වුණා.

මේ ගොඩනැගිල්ලේ සංරක්ෂණය කර තිබුණේ 1948 සැප්තැම්බර් 17 දින රජයේ චිත්‍රපට අංශය ආරම්භයේ පටන් වීඩියෝ මාධ්‍යයට පිවිසෙන තුරු මිලිමීටර් 35 සහ 16 ප්‍රමාණයේ පටලපට මාධ්‍යයෙන් නිෂ්පාදනය වූ ප්‍රවෘත්ති චිත්‍රපට සහ වාර්තා චිත්‍රපටවලට අදාළ දළ සේයාපට (ඍණ එලක-Negative Films) සහ ප්‍රදර්ශන පිටපත් (ධන එලක-Positive Films). නිසි ගබඩා කිරීමේ ක්‍රමවේද, ඉඩකඩ, වාතාශ්‍රය, පිරිසිදු කිරීම්, පරීක්ෂා කිරීම් යනාදී අවශ්‍යතාවලින් තොර ව වුවද ගෙවී ගිය කාලයේ විනාශයට පත් නොවී ආරක්ෂා කරගත හැකි ව තිබූ රටේ ඉතිහාසය පිළිබිඹු වන ජීවමාන චලන රූප ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ඉදි කළ නවතම සංරක්ෂණාගාරයට මාරු කර යවන ලද්දේ ඒවා ඩිජිටල් මාධ්‍යයට පරිවර්තනය කිරීමෙන් අනතුරු ව. මෙසේ සංරක්ෂණයට යොමු කර ඇති ප්‍රවෘත්ති චිත්‍රපට සහ වාර්තා චිත්‍රපට සංඛ්‍යාව 310ක්.

තවදුරටත් අතිරික්ත ව තිබෙන අමතර පිටපත් (Extra Copies) සහ ඉදිරියේදී ලේඛනාගාරයට යැවීමට සූදානම් කෙරෙමින් පවතින චිත්‍රපට ගබඩා කර තැබීම, 1948 සිට අද දක්වා රජයේ චිත්‍රපට අංශයේ භාවිත වූ තාක්ෂණික වෙනස්කම් සාම්පල සහිත ව ප්‍රදර්ශනය කිරීම, ශ්‍රී ලාංකේය වාර්තා සිනමාව පිළිබඳ ගවේශනය කරන විශ්වවිද්‍යාල, සිනමාකරණ පුහුණු පාඨමාලා, පාසල්, ක්ෂේත්‍රයේ රැකියාවල නියුතුවූවන් සහ වෙනත් විද්‍යාර්ථීන්ගේ කුඩා කණ්ඩායම්වලට මෙහි නිෂ්පාදිත චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම, ඒවා පිළිබඳ සාකච්ඡා පැවැත්වීම සඳහා  මැදිරි පහසුකම් සැලැස්වීම, පැරණි චිත්‍රපට පිරිසිදු කිරීම සහ ඒවා ගබඩා කිරීම යනාදී කාර්ය සඳහා මේ ගොඩනැගිල්ල තුළ පහසුකම් සහිතයි. වාර්තා සිනමා අධ්‍යයන කේන්ද්‍රයක් ලෙස මෙය ක්‍රියාත්මක කිරීම ද රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අපේක්ෂාවක්.










දෙසතිය පුවත් සඟරාව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්

www.dgi.gov.lk www.news.lk

පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත

Department of Government Information
news.lk
GFU Sri Lanka

Rs. 100/-